# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report




## 2018

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
இலங்கை நில அளவைத் திணைக்களம்
Sri Lanka Survey Department

# පටුන


| | පිටුව |
|---|---|
| 1.0 හැඳින්වීම | 01 |
| 1.1 දැක්ම | 03 |
| 1.2 මෙහෙවර ප්‍රකාශය | 03 |
| 1.3 අරමුණු | 04 |
| 1.4 කාර්යභාරය | 04 |
| 2.0 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය | 05 |
| 3.0 මානව සම්පත් කළමනාකරණය | 05 |
| 3.1 කාර්ය මණ්ඩලය | 06 |
| 3.2 ස්ථාන මාරුවීම් | 08 |
| 3.3 ආයතනික කටයුතු | 08 |
| 3.4 මානව සම්පත් සංවර්ධනය | 09 |
| 3.5 තොරතුරු තාක්ෂණය | 14 |
| 3.6 සහතික/ බලපත්‍ර නිකුත් කිරීම | 19 |
| 3.7 නීති අංශය | 19 |
| 4.0 මූල්‍ය කළමනාකරණය | 21 |
| 4.1 වැය ඇස්තමේන්තු | 21 |
| 4.2 අත්තිකාරම් “බී” ගිණුම | 22 |
| 4.3 ආදායම් ගිණුම් | 22 |
| 4.4 භෞතික සම්පත් කළමනාකරණය | 22 |
| 4.5 විගණන කටයුතු | 30 |
| 5.0 සංවර්ධන ක්‍රියාකාරකම් | 31 |
| 5.1 ඉඩම් මැනුම් | 31 |
| 5.2 සිතියම්කරණය | 38 |
| 6.0 භූගෝලීය නාම අංශය | 42 |

| | පිටුව |
|---|---|
| 7.0 ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය ශාඛාව | 43 |
| 8.0 ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය | 43 |
| 9.0 භූවිඥාපන අංශය | 44 |
| 10.0 ඉඩම් තොරතුරු පද්ධති | 46 |
| 11.0 දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය | 46 |
| 12.0 විභාග අංශය | 50 |
| 13.0 පර්යේෂණ හා සංවර්ධන අංශය | 53 |
| 14.0 හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය | 54 |
| 15.0 ප්‍රගති අංශය | 56 |
| 16.0 ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු | 57 |
| 17.0 සේවක සුභ සාධනය | 57 |
| 18.0 සමාප්තිය | 58 |

# 2018 වසර සඳහා සර්වේයර් ජනරාල්ගේ කාර්යසාධන වාර්තාව

## 01. හැඳින්වීම

මනුෂ්‍ය වර්ගයාගේ ක්‍රියාකාරකම් බොහෝ වශයෙන් භූමිය හා රැඳී පවතී. ජීවත්වීම සඳහා නිවසක් සකසා ගැනීමට බිම් කඩක් ලබා ගැනීම මිනිසකුගේ විශාල බලාපොරොත්තුවකි. නිෂ්පාදනයේ මූලික සාධක අතරින් පළමුව කියවෙන්නේ ද භූමිය වේ. මෙවැනි බොහෝ මිනිස් අවශ්‍යතා පැවතිය ද රටෙහි භූමිය සම්පූර්ණයෙන් ම මිනිස් ක්‍රියාකාරකම් සඳහා පමණක් වෙන් කළ නොහැක. සත්ත්ව කොට්ඨාස මෙලොවින් තුරන් වීම වැළැක්වීම, පරිසරයේ තුලිතතාව හා සුන්දරත්වය රැක ගැනීම යනාදිය සඳහා භූමි ප්‍රදේශ වෙන් කළ යුතුය. මෙවැනි කරුණු නිසි කළමනාකරණයකින් කිරීම සඳහා නිවැරදි තීරණ ගැනීමට භූමිය පිළිබඳව නිවැරදි තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පැවතිය යුතුය. මිනින්දෝරු දෙපාර්තමේන්තුව එම කාර්යය ඉටු කරන ප්‍රමුඛයා වීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු මෙහෙවර බලාත්මක කරන වෘත්තීය නිපුණත්වයෙන් යුතු සේවා ලැදි පිරිසකගෙන් යුක්තය.

දෙපාර්තමේන්තුවට අයිති සියලුම පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ අංශ මහජන මිතුරු සේවාවක් සැපයීමේ සංකල්පය මත ක්‍රියාත්මක වන අතර 2018 වසර තුළ ද රජයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා විවිධ අයුරින් සහය වී ඇත. රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන ඇති ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම් කැබලි මිලියන 1.1ක් මහජනයාට බෙදා දීමේ වැඩසටහන සඳහා පුරෝගාමීව සහභාගී වෙමින් එම වැඩපිළිවෙළෙහි මූලික කාර්යයක් වන ඉඩම් මැනීම යටතේ 2018 වර්ෂය තුළදී ඉඩම් කැබලි 60,000 ක් මැනුම් කටයුතු සිදුකර ඒ සම්බන්ධ රේඛා චිත්‍ර 36,808 ක් නිකුත් කොට ඇත.

රටේ සංවර්ධන ක්‍රියාවලියට උරදෙන අනෙකුත් ආයතන සඳහා අවශ්‍ය සියලුම වර්ගවල දත්ත එකම ආයතනයකින් ලබා දීම සඳහා ආරම්භ කරන ලද ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය  අංශය වසරේ ඉලක්ක කරන ලද කටයුතු සම්පූර්ණ කර ඇත.

මාර්ග, දුම්රිය මාර්ග පද්ධතිවල වැඩි දියුණු කිරීම්, නව ජලාශ ඉදිකිරීම්, නව කර්මාන්තපුර ඇතිකිරීම් වැනි සංවර්ධන කටයුතු සඳහා මෙන් ම සංචාරක කටයුතු වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය මැනුම්, වනාන්තර හා රක්ෂිත මැනුම්, කාලීන අවශ්‍යතා සඳහා වූ මැනුම් ආදී විවිධාකාර වූ ඉල්ලීම් මෙම වසර තුළ සපුරා දී ඇත.

සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සඳහා භාවිත කරන 1:50,000 සිතියම් මෙම වසර තුළ 30ක් නිම කර ඇත. ඒ අනුව 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් දෙවන සංස්කරණයෙහි සිතියම් 80 ක සැකසුම් කටයුතු අවසන් කර ඇති අතර ඉන් සිතියම් 72ක් මේ  වන විට මුද්‍රණය කර ඇත.

භූගෝලීය නාම අංශය මගින් 2018 වසර තුළදී ග්‍රාම නිලධාරි කොට්ඨාශ 8,275ක මාර්ග, ජල මාර්ග  හා ස්ථානීය නාම ඇතුළත් කිරීම් සිදුකරන ලද අතර ඒ අනුව සැලසුම් කරන ලද පරිදි මේ වන විට සියලුම ග්‍රාම නිලධාරි කොට්ඨාසවල (14,022) දත්ත පද්ධතිය සකසා ඇත.

දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය මැනවින් උපයෝගී කරගනු ලැබූ අතර දේශීය ආර්ථික සංවර්ධනයට දායක වන ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා ඉවහල් වන භූමි තොරතුරු ලබා ගැනීමට දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කළ ආයෝජකයන් සඳහා මාර්ගෝපදේශන (Investors' Guide for Reserves) දත්ත පද්ධතිය, දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ඉදිරියට යන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ජාතියේ ඩිජිටල් නවෝත්පාදකයන් ජයග්‍රහණය කරවීම සහ පිළිගැනීමට ලක් කිරීම සඳහා පවත්වන ලද 2018 e-ස්වාභිමානී තරඟයේ කුසලතා සම්මානයකින් පිදුම් ලැබුයේ දෙපාර්තමේන්තුවේ කීර්තිනාමය ද ඉහළට ඔසවා තබමිනි.

දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මඟින් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා මෙම  වසර තුළ ද උපාධි පාඨමාලා, කෙටි කාලීන පාඨමාලා පවත්වන ලද අතර එමඟින් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට නිලධාරීන් පුහුණු කර ඇත.

නිලධාරීන්ගේ රාජකාරි මට්ටම ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් වැඩමුළු පවත්වා ඇති අතර බාහිර ආයතන මඟින් හා විදේශවල පැවැත් වූ වැඩමුළු සඳහා ද නිලධාරීන් යොමු කර ඇත.

පසුගිය වර්ෂවල ආරම්භ කරන ලද භූමිතික පාලන ජාලය පිහිටුවීම හා මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) හඳුන්වාදෙමින් ඉහළ නිරවද්‍යතාවයකින් මැනුම් කිරීම, එම තාක්ෂණය භාවිතයෙන් ශ්‍රී ලංකා සංතතික මෙහෙයුම් පාලන පද්ධති (SLCORS) ජාලය පිහිටුවීම මඟින් භූමිතික මැනුම් අවශ්‍යතා සපුරා ගැනීම සහ ආලෝක අනාවරණ හා පරාස තාක්ෂණය (LiDAR) මඟින් දත්ත රැස් කිරීම වැනි ක්‍රියාකාරකම් තවදුරටත් වැඩිදියුණු කිරීම සහිතව පවත්වාගෙන යන ලදී.

දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා බෙහෙවින් බලපාන කාර්ය මණ්ඩල හිඟතාවයන් නව බඳවා ගැනීම් මඟින් සම්පූර්ණයෙන් ම නොවුනත්, යම් ප්‍රමාණයකට මඟ හරවා ගැනීමට හැකි වී ඇත.

දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශවල ක්‍රියාත්මක වන ඵලදායිතා කවවල සහභාගිත්වයෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු වඩාත් දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති අතර 2018 සඳහා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පැවැත් වූ ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ඉදිරිපත් වූ අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුව විශේෂ කුසලතා සම්මානයක් ද, වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය තුන්වන ස්ථානය ද දිනාගන්නා ලදී.

රාජකාරී කටයුතුවලට අමතරව දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් ඉදිරිපත් වූ රාජ්‍ය සේවා ගෘහස්ත ක්‍රීඩා තරඟවලින් හා ක්‍රිකට් තරඟවලින් ජයග්‍රහණ ලබා ගෙන ඇත.

# 1.1 දැක්ම
## ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා වීම

# 1.2 මෙහෙවර
## වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම

## 1.3 අරමුණු

කොළඹ ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ දියතලාවේ මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනයෙන් සමන්විත දිවයින පුරා විසිරුණු කාර්යාල ජාලයක් මගින් දෙපාර්තමේන්තුවේ සේවාව පොදු මහජනයා වෙත ලබා දීමට කටයුතු සලසා ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුළ මෙම කාර්යාල වල ක්‍රියාකාරීත්වය පහත සඳහන් අරමුණු කරා ඉලක්ක කරන ලදී.

- මැනුම් පුහුණු සහ මැනුම් සහ සිතියම්ගත කිරීමේ වාර්ෂික වැඩ සටහන සම්පූර්ණ කිරීම.
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම්.
- වර්ෂය තුළ නිම කිරීමට බලාපොරොත්තු වූ වැඩ සටහන් සඳහා අවශ්‍ය වූ නිශ්චල සහ චංචල සම්පත් ගොඩ නගා පවත්වා ගෙන යාම.
- ලබාදෙන ලද රජයේ අරමුදල් වර්ෂය තුළ නිම කළ යුතුව තිබූ ඒ ඒ පරමාර්ථයන් සඳහා යෙදවීම.
- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විනය පවත්වා ගෙන යාම සහ සුභ සාධනය පිළිබඳ කටයුතු කිරීම.
- මැනුම් වෘත්තියේ ප්‍රමිතීන් පාලනය හා පවත්වාගෙන යාම.

## 1.4 කාර්යභාරය

- භූමිතික පාලන ජාලය පිහිටුවීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය හඳුන්වා දෙමින් ඉහළ නිරවද්‍යතාවයකින් මැනුම් කිරීම සහ මිහි සැරිසරු සහසරු පද්ධති (GNSS) තාක්ෂණය මගින් ශ්‍රී ලංකා සන්තතික මෙහෙයුම් පාලන පද්ධති (SLCORS) ජාලය පිහිටුවීම තුළින් භූමිතික අවශ්‍යතා සපුරා ගැනීම පහසු කිරීම.
- අධිවේගී මාර්ග, මාර්ග පුළුල් කිරීම, ගුවන් තොටුපලවල්, වරායවල් ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපෘති, බල ශක්ති ව්‍යාපෘති වැනි අතිවිශාල සංවර්ධන යෝජනා ක්‍රම සඳහා මූලික අවශ්‍යතාවයන් වන ඉඩම් මැන පිඹුරුපත් සකස් කිරීම.
- ඉ.සං.ආ.පනත යටතේ මැනුම් කර දීමනා පත්‍ර ලබා දීමට රේඛා චිත්‍ර නිකුත් කිරීමේ කටයුතු සඳහා ඉඩම් කැබලි මිලියන 1.1 ක රජයේ ඉඩම් මහජනතාව වෙත ලබා දීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතින් විවිධ අවශ්‍යතා යටතේ ලැබෙන මැනුම් ඉල්ලීම් අනුව මැනුම් සිදු කර අදාළ පිඹුරුපත් ඉදිරිපත් කිරීම, සියලු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා මැනුම් සේවා සැපයීම හා ඒවායේ පිටපත් අදාළ ආයතන වෙත ලබා දීම.
- අධිකරණ අවශ්‍යතා අනුව උසාවි කොමිෂන් මැනුම් සිදු කිරීම, අදාළ අනුරේඛණ උසාවි වෙත ඉදිරිපත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී අධිකරණයේ පෙනී සිට පිළිතුරු සැපයීම.
- 1952-2014 කාලය තුළ දෙපාර්තමේන්තුව මගින් ලබා ගත් ගුවන් ඡායාරූප සිතියම්කරණය, සංවර්ධන සැලසුම්, පාරිභෝගික අවශ්‍යතා ආදිය සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි නිකුත් කිරීම.
- දෙපාර්තමේන්තුව ආරම්භයේ පැවති අඟලට සැතපුමේ භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව ප්‍රතිස්ථාපනය කරමින් 1:50,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, යාවත්කාලීන කිරීම, දිවයින සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් මාලාව සැකසීම, තේමා හා විශේෂ කාර්යයන් සඳහා වූ සිතියම් සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම.
- භාෂාත්‍රයෙන්ම ජාතික සිතියම් සංග්‍රහය සැකසීම.
- ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා ඡායාරූප භාවිත කර මුළු රටම ආවරණය වන පරිදි භූගෝලීය දත්ත පද්ධතියක් සකසා යථාවත් කිරීම.
- මුළු රටම ආවරණය වන පරිදි ක්‍රමානුකූලව ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම.
- චන්ද්‍රිකා ඡායාරූප පිළිබඳ තාක්ෂණය භාවිතා කර භූගෝලීය/ ඉඩම් තොරතුරු ලබා ගැනීම.
- මැනුම් වෘත්තිය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් ක්‍රමවත්ව පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුව යටතේ ඇති මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම මගින් දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව නිලධාරීන් පුහුණු කිරීම හා අනෙකුත් ආයතනවල ඉල්ලීම් මත නිලධාරීන් සඳහා ප්‍රායෝගික පුහුණු පාඨමාලා පැවැත්වීම.

- රාජ්‍ය ආයතනයන් සඳහා මැනුම් කටයුතු පිළිබඳ උපදෙස් හා සේවා සැපයීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අදාළ විභාග පැවැත්වීම.
- ඉඩම් මැනීමට හා සිතියම්කරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පර්යේෂණ පැවැත්වීම.
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි මිනින්දෝරුවන්ගේ කඩඉම් මැනුම්කරණය පිළිබඳ මිනින්දෝරුවරයාගේ නිපුණතාව සම්බන්ධයෙන් ප්‍රතීතන සහතික නිකුත් කිරීම.
- ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සකස් කිරීම.
- හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව දිවයිනේ පිහිටි සියලුම රජයේ හා පෞද්ගලික ඉඩම් මුදල් අය කිරීමකින් තොරව මැනීම් කර කඩඉම් සිතියම් සකස් කර හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට සකසන ලද පැරණි පිඹුරු සුරක්ෂිතව තබා ගැනීම සහ මහජන අවශ්‍යතා සඳහා තමාගේ ඉඩමේ හිමිකම් පිඹුරුපතක් කඩිනමින් හා පහසුවෙන් ලබා ගැනීමේ පහසුකම් සැපයීම.
- අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය හා ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයට ලබා දීම.
- ශ්‍රී ලාංකීය ජනතාවගේ උරුමය හා බැඳුණ ජාතික සමගියට අනුබලයක් වන නිවැරදිවූත්, නිශ්චිතවූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම.
- ආලෝක අනාවරණ හා පරාස තාක්ෂණය (LiDAR) ශ්‍රී ලංකාවට හඳුන්වා දීම. එමගින් අවශ්‍ය දත්ත ලබා ගැනීමේ පහසුකම් සලසා දීම.
- විශ්වවිද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා විවිධ අංග අධ්‍යයනය සඳහා අධ්‍යයන සැසි පැවැත්වීම.

## 2.0 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය

සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තු ප්‍රධානියා වශයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යසාධන මට්ටම් පවත්වා ගෙන යාමට වග කියන අතර, ඒ සඳහා විවිධ මට්ටම්වල නිලධාරීන් වෙත තම බලතල පවරා ඇත. (*කරුණාකර ඇමුණුම 01* බලන්න)

## 3.0 මානව සම්පත් කළමනාකරණය

2018 වර්ෂයේ දී දෙපාර්තමේන්තුවට පහත සඳහන් පරිදි නිලධාරීන් බඳවා ගෙන ඇත.

| තනතුර | බඳවාගත් නිලධාරීන් ගණන |
|---|---|
| සහකාර මිනින්දෝරු අධිකාරී/මිනින්දෝරුවරුන්/ ආධුනික මිනින්දෝරුවරුන් | 49 |
| කාර්මික හා පරිපාලන නිලධාරී | 12 |
| ජ්‍යෙෂ්ඨ දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී | 01 |
| පිඹුරු අළුත්වැඩියාකරන්නා | 02 |
| මැනුම් ක්ෂේත්‍ර සහායක | 256 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 122 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 47 |
| කාර්යාල සේවක සේවය | 56 |

## 3.1 කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සම්පූර්ණ තොරතුරු පහත දක්වා ඇත. දෙපාර්තමේන්තුව තුළ වූ විවිධ සේවාවල, අනුමත සේවක සංඛ්‍යාව පසුගිය වසරවලදී මෙන් ම සමාලෝචිත වසර තුළදී ද හිඟව පැවතුනි. එහෙත් සැලසුම් කරන ලද කාර්යයන් මෙන් ම රජයේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමේ හේතුවෙන් ඇති වූ ඉතා හදිසි හා අතිරේක කාර්යයන් ද දුෂ්කරතා මධ්‍යයේ වුව ද සපුරා ගන්නා ලදී.

| අනු අංකය | අනුමත තනතුරු නම | අනුමත තනතුරු | පෙර වසරේ සිටි සංඛ්‍යාව | විශ්‍රාම යෑම් | ස්ථානමාරු | | තනතුර හැර ගිය | මිය ගිය | වෙනත් තනතුරු සඳහා ගිය | බඳවා ගැනීම් | උසස්වීම් | 2018 වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ගිය | පැමිණි | | | | | | |
| **1.** | සර්වේයර් ජනරාල් | 01 | 01 | | | | | | | | | 01 |
| **2.** | අතිරේක සර්වේයර් ජනරාල් (ශ්‍රී ල.මි.දෙ.) | 03 | 03 | | | | | | | | | 03 |
| **3.** | අතිරේක සර්වේයර් ජනරාල් ( ශ්‍රී. ල. ප. සේ.) | 01 | 01 | | 01 | 01 | | | | | | 01 |
| **4.** | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් | 06 | 06 | 01 | | | | | | | 01 | 06 |
| **5.** | නියෝජ්‍ය සර්වේයර් ජනරාල් /පළාත්සර්වේයර් ජනරාල් | 15 | 15 | 01 | | | | | | | 01 | 15 |
| **6.** | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී | 60 | 57 | | | | | | | | 02 | 59 |
| **7.** | මිනින්දෝරු අධිකාරී | 139 | 97 | 07 | | | | | | | 04 | 86 |
| **8.** | සහකාර මිනින්දෝරු අධිකාරී/ මිනින්දෝරුවරුන්/ ආධුනික මිනින්දෝරුවරුන් | 850 | 748 | 02 | 05 | 01 | 01 | | | 49 | | 790 |
| **9.** | ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී | 01 | 0 | | | | | | | | | 0 |
| **10.** | කාර්මික හා පරිපාලන නිලධාරී | 45 | 23 | 05 | | | | | | 12 | | 30 |
| **11.** | ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරී - විශේෂ පංතිය | 56 | 40 | 03 | | | | | 12 | | | 25 |
| **12.** | සිතියම් තාක්ෂණ නිලධාරී I,II,III,පුහුණු ශ්‍රේණිය | 574 | 366 | 10 | | | | | 09 | | | 347 |
| **13.** | නැවිගේටර් | 01 | 01 | | | | | | | | | 01 |
| **14.** | ඡායාරේඛණමිතිඥ | 01 | 0 | | | | | | | | | 0 |
| **15.** | ජ්‍යෙෂ්ඨ ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරී | 04 | 02 | | | | | | | | | 02 |
| **16.** | ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරී -I,II,III,පුහුණු ශ්‍රේණිය | 26 | 20 | 03 | | | | | | | | 17 |
| **17.** | ජ්‍යෙෂ්ඨ දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී | 01 | 0 | | | | | | | 01 | | 01 |
| **18.** | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරී -I,II,III,පුහුණු ශ්‍රේණිය | 13 | 10 | | | | | | 01 | | | 09 |
| **19.** | ජ්‍යෙෂ්ඨ ගුවන් ඡායාරූප හා රසායනාගාර තාක්ෂණ නිලධාරී | 01 | 01 | | | | | | | | | 01 |
| **20.** | ගුවන් ඡායාරූප හා රසායනාගාර තාක්ෂණ නිලධාරී - I,II,III,පුහුණු ශ්‍රේණිය | 06 | 05 | | | | | | | | | 05 |
| **21.** | ජ්‍යෙෂ්ඨ ලිතෝ තාක්ෂණ නිලධාරී | 03 | 01 | | | | | | | | | 01 |
| **22.** | ලිතෝ තාක්ෂණ නිලධාරී - I,II,III,පුහුණු ශ්‍රේණිය | 15 | 09 | | | | | | | | | 09 |
| **23.** | ජ්‍යෙෂ්ඨ පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී | 01 | 0 | | | | | | | | | 0 |
| **24.** | පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරී - I,II,III,පුහුණු ශ්‍රේණිය | 07 | 03 | | | | | | | | | 03 |
| **25.** | ප්‍රවාහන නිලධාරී | 01 | 0 | | | | | | | | | 0 |
| **26.** | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | | | | | | | | | 01 |
| **27.** | වැඩ සටහන් සම්පාදක III | 01 | 0 | | | | | | | | | 0 |
| **28.** | දත්ත ක්‍රියාකරු | 01 | 01 | | | | | | | | | 01 |
| **29.** | නීති නිලධාරී | 01 | 01 | | | | | | | | | 01 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **30.** | නීති සහකාර | 02 | 0 | | | | | | | | | 0 |
| **31.** | ගොඩනැගිලි පරිපාලක | 01 | 0 | | | | | | | | | 0 |
| **32.** | මැනුම් උපකරණ කාර්මික ශිල්පි - (තේරීම් ශ්‍රේණිය) | 02 | 02 | 01 | | | | | | | | 01 |
| **33.** | මැනුම් උපකරණ කාර්මික ශිල්පි - I,II,III | 15 | 04 | | | | | | | | | 04 |
| **34.** | වඩුකාර්මික I,II,III | 09 | 03 | | | | | | | | | 03 |
| **35.** | පෑස්සුම්කරු | 01 | 01 | 01 | | | | | | | | 0 |
| **36.** | මෙවලම් කම්කරු | 04 | 04 | | | | | | 02 | | | 02 |
| **37.** | රිය සහායක | 07 | 06 | | | | | | 01 | | | 05 |
| **38.** | සිතියම් සවිකරන්නා හා පොත් බඳින්නා | 04 | 03 | | | | | | | | | 03 |
| **39.** | පිඹුරු අළුත්වැඩියාකරන්නා | 07 | 02 | | | | | | | 02 | | 04 |
| **40.** | වායුසමීකරණ යාන්ත්‍රික ශිල්පි | 01 | 01 | | | | | | | | | 01 |
| **41.** | පෙදරේරු | 01 | 0 | | | | | | | | | 0 |
| **42.** | සංචාරක බංගලා භාරකරු | 05 | 04 | | | | | | | | | 04 |
| **43.** | අඳුරු කාමර සහකාර | 04 | 03 | | | | | | | | | 03 |
| **44.** | ඡායාපිටපත්යන්ත්‍ර ක්‍රියාකරු | 01 | 01 | | | | | | | | | 01 |
| **45.** | දෙපාර්තමේන්තු කම්කරු | 170 | 157 | 08 | | | 01 | | 08 | | | 140 |
| **46.** | මෝටර් කාර්මික | 02 | 01 | | | | | | 01 | | | 0 |
| **47.** | දත්ත සටහන් ක්‍රියාකරු | 01 | 01 | 01 | | | | | | | | 0 |
| **48.** | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) /සහකාර අධ්‍යක්ෂ (පාලන) ශ්‍රී. ල. ප. සේ. II,III | 02 | 01 | | | | | | | | | 01 |
| **49.** | ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. I | 01 | 01 | | 01 | 01 | | | | | | 01 |
| **50.** | ගණකාධිකාරී - ශ්‍රී.ල.ග.සේ. II,III | 12 | 10 | | 02 | 01 | | | | | | 9 |
| **51.** | අභ්‍යන්තර විගණක ශ්‍රී.ල.ග.සේ. I | 01 | 01 | | | | | | | | | 01 |
| **52.** | භාෂා පරිවර්තක | 04 | 01 | | | | | | | | | 01 |
| **53.** | භාෂා පරිවර්තක සහකාර | 01 | 0 | | | | | | | | | 0 |
| **54.** | පරිපාලන නිලධාරී | 01 | 0 | | | | | | | | | 0 |
| **55.** | රා.ක.ස.සේ. I,II,III | 488 | 393 | 14 | 122 | 79 | 05 | | 14 | 122 | 03 | 439 |
| **56.** | සංවර්ධන නිලධාරී III | 166 | 125 | | 06 | 07 | 01 | | | | | 125 |
| **57.** | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 | 01 | | | | | | | | | 01 |
| **58.** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 08 | 07 | | 01 | | | | | | | 06 |
| **59.** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 22 | 17 | | 03 | 03 | | | | | | 17 |
| **60.** | ඒකාබද්ධ රියදුරු සේවය - විශේෂ/ I,II,III | 319 | 263 | 05 | 27 | 24 | 07 | 01 | 01 | 47 | 04 | 293 |
| **61.** | කාර්යාල සේවක සේවය I,II,III | 207 | 136 | 02 | 02 | 04 | | | 09 | 56 | 02 | 183 |
| **62.** | මැනුම් ක්ෂේත්‍ර සහායක I,II,III | 4154 | 3412 | 177 | | | 16 | 3 | 12 | 256 | 122 | 3460 |
| **63.** | පද්ධති ක්‍රියාකරු | 02 | 0 | | | | | | | | | 0 |

## 3.2 ස්ථාන මාරුවීම්

දෙපාර්තමේන්තු සේවාවලට අයත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්, පළාත් සර්වේයර් ජනරාල්වරුන්, නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීන්, මිනින්දෝරු අධිකාරීන්, රජයේ මිනින්දෝරුවරුන්, කාර්මික හා පරිපාලන නිලධාරීන්, සිතියම් තාක්ෂණ නිලධාරීන්, මැනුම් ක්ෂෙත්‍ර සහායකයින් සහ දෙපාර්තමේන්තු කම්කරුවන්ගේ වාර්ෂික ස්ථාන මාරු නියමිත ක්‍රියාපටිපාටියට අනුකූලව සිදුකරන ලද අතර, ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු දෙපාර්තමේන්තුව තුළ හා ඒකාබද්ධ සේවා ස්ථාන මාරු නියෝග ද අනුව ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, අතිරේක සර්වේයර් ජනරාල් (ශ්‍රී.ල.ප.සේ.) එක් අයෙකු, සහකාර මිනින්දෝරු අධිකාරීවරුන්/ මිනින්දෝරුවරුන් 05 දෙනකු, අධ්‍යක්ෂ (මුදල්) එක් අයෙකු, ශ්‍රී.ලං.ග.සේ. 02ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 122 ක්, සංවර්ධන නිලධාරීන් 06ක්,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් 01 ක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර වරුන් 03ක්, ඒකාබද්ධ රියදුරු සේවයේ 27 ක් සහ කාර්යාල සේවක සේවයේ 02 ක් දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වී ගිය අතර, අතිරේක සර්වේයර් ජනරාල් (ශ්‍රී.ල.ප.සේ.) එක් අයෙකු, සහකාර මිනින්දෝරු අධිකාරීවරුන්/මිනින්දෝරුවරුන් 01 ක්, අධ්‍යක්ෂ (මුදල්) එක් අයෙකු, ශ්‍රී.ලං.ග.සේ. 01ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 79 ක්, සංවර්ධන නිලධාරීන් 07ක්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර වරුන් 03ක්, ඒකාබද්ධ රියදුරු සේවයේ 24 ක් සහ කාර්යාල සේවක සේවයේ 04 ක් දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී පැමිණියහ.

එමෙන්ම, සහකාර මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරුවරුන් 01 ක් රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 05 ක්, සංවර්ධන නිලධාරීන් 01ක් ඒකාබද්ධ රියදුරු සේවයේ 7 ක් මැනුම් ක්ෂෙත්‍ර සහායක 16 ක්, හා දෙපාර්තමේන්තු කම්කරුවන් 1 ක් තනතුර හැර ගොස් ඇත.

## 3.3 ආයතනික කටයුතු

බොහොමයක් සේවාවල නියමිත සේවක සංඛ්‍යාව සමාලෝචනයට භාජනය වූ වසර තුළ නොසිටියත්, සැලසුම්කරන ලද ඉලක්කයන් සාර්ථකව නිම කිරීම සඳහා අවශ්‍ය වූ ක්‍රියාකාරකම් සපුරා ඇත.

| අනු අංකය | විස්තර | පෙර වසර - 2017 | | | ප්‍රවර්තන වසර - 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ලැබූ සංඛ්‍යාව | අනුමත කල | ඉතිරි සංඛ්‍යාව | ලැබූ සංඛ්‍යාව | අනුමත කල | ඉතිරි සංඛ්‍යාව |
| **1** | සේවයට බඳවා ගැනීම් | 318 | 296 | 331 | 426 | 420 | 6 |
| **2** | විභාග පැවැත්වීම | 1 | 1 | 0 | 102 | 102 | 0 |
| **3** | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම් | 9 | 9 | 1 | 183 | 179 | 4 |
| **4** | සේවය ස්ථිර කිරීම් | 361 | 410 | 28 | 590 | 532 | 58 |
| **5** | උසස් කිරීම | 281 | 269 | 20 | 210 | 204 | 6 |
| **6** | වැටුප් වර්ධක ගෙවීම් | 2730 | 2377 | 621 | 2199 | 1672 | 527 |
| **7** | සේවය දීර්ඝ කිරීම් | 0 | 0 | 0 | 3 | 2 | 1 |
| **8** | බඳවා ගැනීමේ පටිපාටි සැකසීම් | 2 | 1 | 1 | 2 | 2 | 0 |
| **9** | සේවය හැරයාම් | 37 | 37 | 1 | 308 | 300 | 8 |
| **10** | වැඩ තහනම් කිරීම් | 3 | 2 | 1 | 2 | 2 | 0 |
| **11** | නැවත සේවය පිහිටුවීම් | 4 | 3 | 2 | 24 | 9 | 15 |
| **12** | විනය පරීක්ෂණ | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **13** | විදේශ නිවාඩු අනුමත කිරීම් | 110 | 110 | 0 | 101 | 100 | 1 |
| **14** | විදේශ ශිෂ්‍යත්ව | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **15** | අමාත්‍ය මණ්ඩල සංදේශ | 0 | 0 | 0 | 1 | 1 | 0 |
| **16** | ඇප ආරම්භ කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **17** | ඇප නිදහස් කිරීම් | 53 | 1 | 53 | 78 | 78 | 0 |
| **18** | ණය අනුමත කිරීම් (දේපළ) | 42 | 42 | 0 | 29 | 29 | 0 |

## 3.4 මානව සම්පත් සංවර්ධනය

විදේශ පුහුණුවීම් සඳහා ලද අවස්ථා 28න් අවස්ථා 27ක් ම ඉතා කෙටිකාලීන අවස්ථා විය. එසේම දේශීය වශයෙන් පුහුණුවීම් අවස්ථා 27 ක් සඳහා නිලධාරීන් 60 ක් සහභාගි කරවන ලදී. එමෙන් ම දෙපාර්තමේන්තුව විසින් ම සංවිධානය කරන ලද වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් 08 ක් පවත්වා ඇත. ඒ සඳහා නිලධාරීන් 441 ක් සහභාගි කරවන ලදී.

### 3.4.1 දේශීය පුහුණුව - කෙටිකාලීන

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද වැඩමුළු**

| අංකය | පාඨමාලා විස්තරය | සහභාගී වූ ශ්‍රේණි | නි.ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ArcGIS හා QGIS මෘදුකාංග පිළිබඳ තෙදින වැඩමුළුව | ජ්‍යෙ.මි.අ., මි.අ.(ප්‍රධාන කාර්යාලය) | 25 |
| 02 | විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ එක්දින වැඩමුළුව(පළමු අදියර) | මි.අ., කා.ප.නි. | 66 |
| 03 | දුරස්ථ ග්‍රහණ තාක්ෂණය පිළිබඳ වැඩමුළුව | ජ්‍යෙ.මි.අ., මි.අ., සි.තා.නි., ගු.ෂා.ර.තා.නි, ඡායා. තා.නි., දු. ග්‍ර.තා.නි. | 31 |
| 04 | සිගාස් පිළිබඳ වැඩමුළුව | අධ්‍යක්ෂ (මුදල්), ස.අධ්‍යක්ෂ(මුදල් ), සං.නි., රා.ක.ස. | 65 |
| 05 | සිතියම්කරණය පිළිබඳ වැඩමුළුව | සි.තා.නි., ගු.ෂා.ර.තා.නි, ඡායා. තා.නි., දු. ග්‍ර.තා.නි. | 164 |
| 06 | QGIS හා Google Earth මෘදුකාංග යථාවත් වීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | ස.ජ., අති.ස.ජ., ජ්‍යෙ.නි.ස.ජ., නි.ස.ජ., ප.ස.ජ. | 27 |
| 07 | දෙමළ භාෂා පාඨමාලාව | රියදුරු, මැ.ක්ෂේත්‍ර ස., කා.කා.ස., දෙ.ක. | 57 |
| 08 | පිඹුරු අළුත්වැඩියාව පිළිබඳ පස්දින වැඩමුළුව | මැ.ක්ෂේත්‍ර ස., දෙ.ක. | 06 |
| 09 | නව පත්වීම් ලාභී රා.ක.ස. නිලධාරීන්ගේ පුහුණු වැඩමුළුව | රා.ක.ස. | 95 |

මීට අමතරව ක්ෂේත්‍ර කාර්යාල නිලධාරීන් හා ප්‍රාථමික ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පළාත් මට්ටමින් පුහුණු වැඩමුළු පවත්වා ඇත.

| **අංකය** | **පාඨමාලා විස්තරය** | **සහභාගී වූ ශ්‍රේණි** | **ප්‍රමාණය** |
|---|---|---|---|
| 01 | මැනුම් ක්ෂේත්‍රයේ නව ක්‍රමෝපායන් පිළිබඳ දැනුවත් කිරීම | ර.මි. | 691 |
| 02 | සිතියම් යථාවත් කිරීම හා ඒ හා බැඳුණු රාජකාරි පිළිබඳ දැනුවත් කිරීම | කා.ප.නි., සි.තා.නි. | 265 |
| 03 | විනය ගරුක රිය ධාවනය | රියැදුරු | 281 |

වෙනත් ආයතන මගින් සංවිධානය කළ කෙටි කාලීන පාඨමාලා පිළිබඳ විස්තර

| අංකය | පාඨමාලා විස්තරය | ආයතනය | සහභාගී වූ කාණ්ඩ | නිලධාරීන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | Speech craft training with the toastmasters international | SLIDA | ප.ස.ජ, නි.ස.ජ. | 02 |
| 02 | විදුලි ජනක යන්ත්‍ර භාවිතය හා නඩත්තුව පිළිබඳ වැඩමුළුව | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | මැ.ක්ෂේත්‍ර ස. | 01 |
| 03 | Seminar on Taxation proposals of the budget-2018 | SDFL | ස. අධ්‍යක්ෂ (මුදල්) | 01 |
| 04 | Procurement of IT servicers and green procurement | Distance Learning Centre Ltd. | ජ්‍යෙ.මි.අ. | 01 |
| 05 | තොරතුරු දැනගැනීමේ පණත පිළිබඳ වැඩමුළුව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ජ්‍යෙ.නි.ස.ජ. | 01 |
| 06 | Stores management and purchasing procurements | SDFL | මි.අ. | 02 |
| 07 | Lecture on Computer Crimes and Admissibility of Digital Evidence | MILODA Academy of Financial Studies | ජ්‍යෙ.නි.ස.ජ., නි.ස.ජ., නීති නිලධාරි | 03 |
| 08 | වැටුප් පරිවර්තන සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | SDFL | රා.ක.ස. | 01 |
| 09 | ඵලදායි සේවයක් සඳහා කාර්යක්ෂම ලේකම්වරියක් | ශ්‍රී ලංකා පදනම | රා.ක.ස. | 04 |
| 10 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | ශ්‍රී ලංකා පදනම | ජ්‍යෙ.මි.අ. | 02 |
| 11 | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායි ලෙස පවත්වාගෙන යාම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස. | 03 |
| 12 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස. | 03 |
| 13 | සහායක කාර්යය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස. | 03 |
| 14 | වාර්ෂික ගබඩා සමීක්ෂණය හා පාවිච්චි කළ නොහැකි භාණ්ඩ අපහරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | රා.ක.ස. | 03 |
| 15 | ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා ලංසු ලියකියවිලි සකස් කිරීම | SDFL | ස. අධ්‍යක්ෂ (මුදල්) | 02 |
| 16 | ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම් | SDFL | රා.ක.ස. | 03 |
| 17 | ආයතන සංග්‍රහයේ විධි විධාන හා පටිපාටික රීති භාවිතය | SDFL | රා.ක.ස. | 02 |
| 18 | පූර්ණ ඵලදායිතා නඩත්තුව පිළිබඳ වැඩමුළුව | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | ජ්‍යෙ.මි.අ., සි.තා.නි, රා.ක.ස. | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | ආයතන සංග්‍රහයේ විධි විධාන පිළිබඳ රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළුව | රාජ්‍ය පරිපාලන කළමණාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | රා.ක.ස. | 01 |
| 20 | Workshop on Procurement Procedure in public sector financial regulations | ශ්‍රී ලංකා පදනම | ස. අධ්‍යක්ෂ (මුදල්) | 02 |
| 21 | FOSS4G Asia- 2018 සම්මන්ත්‍රණයට සමගාමී වැඩමුළුව | මොරටුව විශ්ව විද්‍යාලය | ර.මි., සි.තා.නි., තො.තා.නි. | 07 |
| 22 | Workshop on soft skills for decision makers | SLIDA | ජ්‍යෝ.මි.අ., මි.අ. | 03 |
| 23 | Workshop on training of trainers | SLIDA | ජ්‍යෝ.මි.අ. | 02 |
| 24 | Workshop on disciplinary procedure | SLIDA | ජ්‍යෝ.මි.අ. | 01 |
| 25 | Workshop on policy paper writing | SLIDA | ප.ස.ජ. | 01 |
| 26 | Workshop on human resource management | SLIDA | මි.අ. | 01 |
| 27 | ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ පාඨමාලාව | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය | ලිතෝ තා.නි. | 02 |

### 3.4.2 විදේශීය පුහුණු හා වැඩමුළු

| අංකය | නම | තනතුර | වැඩමුළු/පුහුණුවේ විස්තර | රට | අදාල කාලසීමාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | සිට | දක්වා |
| 1. | එස්.පී. ඩී.ජේ. දාම්පේගම මයා | අති.ස.ජ. (ක්ෂේත්‍ර) | ලෝක භූ අවකාශීය සංසදය | ඉන්දියාව | 2018/01/15 | 2018/01/19 |
| 2. | ඩී.කේ.එස්.පී.ජයලත් මයා | ර.මි. | දේශගුණික විපර්යාස සඳහා වන හා පාරිසරික භූඅවකාශීය ආකෘති නිර්මාණය | දෙහ්රාඩූන්-ඉන්දියා | 2018/04/16 | 2018/04/27 |
| 3. | වයි.එම්.එන්.ටී.වයි.බණ්ඩාර මයා | ර.මි. | | | | |
| 4. | එස්.එම්.පී.පී.සංගක්කාර මයා | අති.ස.ජ.(මධ්‍යම) | FIG සම්මේලනය-2018 | ඉස්තාන්බුල් - තුර්කිය | 2018/05/06 | 2018/05/11 |
| 5. | පී.ඒ.එන්. ද සිල්වා මයා | අති.ස.ජ. | අවකාශීය දත්ත යටිතල ව්‍යුහ තැනීම හා භාවිතය | බෙයිජිං - චීනය | 2018/05/02 | 2018/05/10 |
| 6. | කේ.වීරතුංග මයා | ජ්‍යෝ.මි.අ | | | | |
| 7. | යූ.ජේ.විතාරණගේ මයා | නි.ස.ජ. | | | | |
| 8. | පී.එම්.පී. උදයකාන්ත මයා | ස.ජ. | 2018 ESRI පරිශීලක සමුළුව | ඇමරිකා එක්සත් ජනපදය | 2018/07/09 | 2018/07/13 |
| 9. | එච්.එන්.සී.බණ්ඩාර මයා | මි.අ | ජාතික සිතියම් සහ මැනුම් සැලසුම්කරණය හා කළමණාකරණය | ජපානය | 2018/08/19 | 2018/12/15 |
| 10. | කේ. කේ.බී.එන්.ප්‍රනාන්දු මිය | ජ්‍යෝ.මි.අ. | ගෝලීය ඍජිවි නිරීක්ෂණ පද්ධතිය | චීනය | 2018/05/16 | 2018/05/19 |
| 11. | කේ. වී.එස්.පී.කැකුලාවල මයා | ජ්‍යෝ.මි.අ. | 39 වන ACRS සම්මන්ත්‍රණය | මැලේසියාව | 2018/10/19 | 2018/10/21 |
| 12. | කේ.එම්.ඒ.චතුරංග මයා | ර.මි. | ගෝලීය සංචලන චන්ද්‍රිකා පද්ධති | ජපානය | 2018/07/28 | 2018/08/05 |
| 13. | ඩබ්.ටී.එම්. එස්.බී.තෙන්නකෝන් මයා | නි.ස.ජ. (ඉ.තො.ප.) | එක්සත්ජාතීන්ගේ ලෝක භූඅවකාශ තොරතුරු සම්මේලනය | චීනය | 2018/11/19 | 2018/11/21 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14. | එම්.වී.ඩී.මල්වත්ත මිය | ගණකාධිකාරි (වයඹ පළාත) | ඉන්දියානු රාජ්‍ය අංශය | කේරළය -ඉන්දියාව | 2018/07/30 | 2018/08/03 |
| 15. | එස්.කජේන්තිරන් මයා | ගණකාධිකාරි (නැගෙනහිර පළාත) | | | | |
| 16. | පී.ඒ.එස්.එස්.ධර්මසේන මයා | සි.තා.නි. | වෙබ් තාක්ෂණය යොදා ගනිමින් අධ්‍යාපනික වැඩසටහන් නිර්මාණය | හයිද්‍රාබාද් - ඉන්දියාව | 2018/10/24 | 2018/11/20 |
| 17. | එස්.එම්.පී.පී.සංගක්කාර මයා | අති.ස.ජ. (මධ්‍යම) | Smart භූ අවකාශExpo 2018 | කොරියාව | 2018/09/12 | 2018/09/14 |
| 18. | එස්.පී. ඩී.ජේ. දාම්පේගම මයා | අති.ස.ජ. (ක්ෂේත්‍ර) | තීරය සහ පාර යටතේ රාජ්‍ය ඉඩම් කළමනාකරණය | චීනය | 2018/08/27 | 2018/09/05 |
| 19. | ඒ.ආර්.නිසාර්ඛාන් මයා | ර.මි. | ශ්‍රීලංකාවේ කර්මාන්ත උද්‍යාන ඉදිකිරීම සහ කළමනාකරණය | චීනය | 2018/09/25 | 2018/10/15 |
| 20. | ආර්.එම්.ජී.ඊ.කේ.ගොකරුල්ල මිය | ප්‍රධාන අභ්‍යන්තර විගණක (ගණකාධිකාරි) | ශක්‍යතා ගොඩනැංවීමේ පුහුණු වැඩසටහන | ඉන්දියාව | 2018/09/09 | 2018/09/15 |
| 21. | පී.එම්.පී. උදයකාන්ත මයා | ස.ජ. | ඉඩම් පරිපාලනය පිළිබඳ එ.ජා.කණ්ඩායම් රැස්වීම | චීනය | 2018/09/25 | 2018/09/30 |
| 22. | පී.එම්.පී. උදයකාන්ත මයා | ස.ජ. | MCC සමඟ සාකච්ඡා රැස්වීම | ඇමෙරිකාව | 2018/10/01 | 2018/11/05 |
| 23. | ඩබ්. එම්.පී.බී.වාසල මයා | ර.මි. | ICT මූලික ඉඩම් කළමනාකරණ පද්ධති සඳහා ශක්‍යතාවර්ධන වැඩසටහන | කොරියාව | 2018/10/01 | 2018/10/12 |
| 24 | ඩබ්.ජේ.කේ.ඒ.එන්.ප්‍රභාත් මයා | ර.මි. | | | | |
| 25. | ජී.ඩී.පී.ආරියතිලක මයා | ජ්‍යෝ.මි.අ | | | | |
| 26. | ඒ.එල්.එස්.සී.පෙරේරා මිය | නි.ස.ජ. (ඉ.තො.ප.) | | | | |
| 27. | එන්.තුෂ්යන්තන් මයා | මි.අ. | ජාතික වා අවකාශ දුරස්ථග්‍රහණ සිතියම් හා අවකාශීය තොරතුරු | චීනය | 2018/10/09 | 2018/10/28 |
| 28. | එස්.එම්.එස්.ජේ.සමරසිංහ මයා | ජ්‍යෝ.මි.අ | වා අවකාශ දුරස්ථග්‍රහණ මැනුම් හා සිතියම් තාක්ෂණය | චීනය | 2018/10/28 | 2018/11/17 |

## 3.5 තොරතුරු තාක්ෂණය

මහජනතාවට ඉඩම් තොරතුරු අන්තර්ජාලය මඟින් ලබා ගැනීම හා මහජන මිතුරු සේවාවක් ලබා දීමටත් පරිපාලන කටයුතුවලට සහායක සේවාවක් ලෙස මානව සම්පත් කළමනාකරණය, දත්ත ගබඩා කිරීම, තොරතුරු ඉක්මනින් හා ක්‍රමවත්ව ලබා ගැනීම සඳහාත් තොරතුරු තාක්ෂණය නිරන්තරයෙන් යොදාගන්නා ලද අතර අන්තර්ජාල සම්බන්ධතා හා විද්‍යුත් තැපැල වැනි දියුණු සන්නිවේදන ක්‍රම ද මේ සඳහා යොදා ගෙන ඇත.

දේශීය ආර්ථික සංවර්ධනයට දායක වන ආයෝජකයින් දිරිමත් කිරීම සඳහා ඉවහල් වන භූමි තොරතුරු ලබා ගැනීමට තොරතුරු තාක්ෂණ අංශය විසින් 2017 වර්ෂයේදී සකස් කළ ආයෝජකයින් සඳහා මාර්ගෝපදේශන (Investor’s Guide for Reserves) දත්ත පද්ධතිය, දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ඉදිරියට යන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් ජාතියේ ඩිජිටල් නවෝත්පාදකයන් ජයග්‍රහණය කරවීම සහ පිළිගැනීමට ලක් කිරීම සඳහා පවත්වන ලද 2018 e-ස්වාභිමානී තරඟයේ කුසලතා සම්මානයකින් පිදුම් ලැබුයේ දිවයින තුළ දෙපාර්තමේන්තුවේ කීර්තිනාමය ද ඉහළට ඔසවා තබමිනි.







2018 වර්ෂයේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් පිළියෙළ කරන ලද දත්ත පද්ධතීන් හා මෘදුකාංග පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

### 1. ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය TL Data Management System (TL-DMS)

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අවශ්‍යතාවයක්ව තිබූ මධ්‍යගත ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර එය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළින් භාවිත කළ හැක.

හෝමාගම, රත්නපුර හා ඇලපාත ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවලට අනුයුක්ත නිලධාරීන් මූලික ව්‍යාපෘතියක් ලෙස මෙම දත්ත පද්ධතිය භාවිත කළ අතර එහි සාර්ථකත්වය මත 2019.01.01 දින සිට සියලුම ඉඩම් විස්තර ලැයිස්තු මෙම දත්ත පද්ධතිය මඟින් සැකසීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇත.

මෙම දත්ත පද්ධතිය මඟින් පහත සඳහන් පහසුකම් ලබා ගත හැක.

1. රජයේ මිනින්දෝරුවන් හට මෙම දත්ත පද්ධතිය Online හා Offline ලෙස භාවිත කිරීමේ හැකියාව
2. ඇතුළත් කළ යුතු දත්ත විශාල ප්‍රමාණයක් දත්ත පද්ධතියෙන් තෝරා ගැනීමට හැකියාව ඇති බැවින් අළුතින් ඇතුලත් කළ යුතු දත්ත සීමා වීම.

3. එක් වරක් පමණක් දත්ත ඇතුළත් කිරීමෙන් පසු වාර්තා කිහිපයක් ලබා ගැනීමේ හැකියාව (උදා:- අත්කරගැනීමේ ඉඩම් විස්තර ලැයිස්තු, පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු)
4. මිනින්දෝරු අධිකාරීගේ හා ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ සංශෝධන ලැයිස්තු ද දත්ත පද්ධතිය මඟින් රජයේ මිනින්දෝරුවන් වෙත යැවිය හැකි වීම.
5. ඉහළ කළමනාකාරීත්වයට හා සියලුම පරිපාලන නිලධාරීන්ට ඉඩම් විස්තර පිළියෙළ කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ පහසුකම
6. සම්මත කරන ලද සියලුම ඉඩම් විස්තර ලැයිස්තු පිළිබඳ වාර්තා ලබා ගැනීම, රජයේ ඉඩම්, දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා මැනුම් කරන ලද ඉඩම් යන අයුරින් සෙවීම් කළ හැකි වීම.

## 2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ වන මැනුම් ඉල්ලීම් හා ප්‍රගතිය නිරූපණය කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම සඳහා ලැබෙන මැනුම් ඉල්ලීම් හා එහි ප්‍රගතිය දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ග්‍රාම නිලධාරී කොට්ඨාශය අනුව වගු හා ප්‍රස්ථාර අනුව නිරූපණය කිරීම මඟින් අදාළ ආයතනවලට හා මහජනතාවට ද පහසුවෙන් දැනුවත් වීමට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ Land Grant Survey Info මඟින් හැකියාව ලබා දී ඇත.

මෙමඟින් 2016 වසර සිට නිම කරන ලද බිම් කැබලි හා රේඛා චිත්‍ර නිකුත් කිරීමේ තොරතුරු ද, වැඩ නිම කරන ලද කැබලිවල විස්තරාත්මක තොරතුරු (දීමනා පත්‍ර, වැඩිපුර වගාවන්, අනවසර අල්ලා ගැනීම්, ජයභූමි ආදී) ද ලබා ගත හැක. එමෙන් ම වැඩ නිම නොකළ මැනුම් ඉල්ලීම්වල තොරතුරු හා ඒවායේ වර්තමාන තත්ත්වය ද මෙමඟින් ලබා ගත හැකිය.

## 3. දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා වෙන්කර ගැනීම සඳහා වන දත්ත පද්ධතිය (Information System for Reservation of Circuit Bungalows)

දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ට සංචාරක බංගලා වෙන්කර ගැනීම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා අන්තර්ජාලය තුළින් භාවිත කිරීමට කටයුතු සූදානම් කර ඇත.
මෙමඟින්,

1. මේ වන විටත් සංචාරක බංගලා වෙන්කර ඇති ආකාරය, තවත් නිලධාරීන් ඉල්ලුම් කර තිබේ නම් ඒ අය පිළිබඳ විස්තර ලබා ගත හැක.
2. සංචාරක බංගලා වෙන් කර ඇති අයදුම්කරුවන් පිළිබඳ විස්තර සංචාරක බංගලා භාරකරුවන්ට ලබා ගත හැක.
3. සංචාරක බංගලා වෙන්කර ගැනීමේදී ප්‍රමුඛතාවය, ලබාදීම සඳහා අවශ්‍ය තොරතුරු පරිපාලනයට ලබා ගත හැකි වීම. (උදා:- නිලධාරියෙකු සංචාරක බංගලා වෙන් කරගෙන ඇති ආකාරය, වාර ගණන ආදී තොරතුරු)

## 4. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය නවීකරණය කිරීම

දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (http://www.survey.gov.lk) මෙම වසරේ නවීකරණය කර නව මුහුණු වරකින් මහජනතාවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිළිබඳ පැහැදිලි අවබෝධයක් හා දැනුමක් ලැබෙන පරිදි නව අංග කිහිපයක් ඇතුළත් කරන ලද අතර තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යමණ්ඩලය විසින් වෙබ් අඩවිය යාවත්කාලීන කරනු ලැබේ.






## 5. SGO Services

සර්වේයර් ජනරාල් කාර්යාලයේ පරිගණක ජාල පද්ධතිය භාවිතයෙන් පහත සඳහන් සේවා සැපයීමට කටයුතු කර ඇත.

1. දෛනික පැමිණීමේ හා පිටවීමේ වාර්තා ලබා ගැනීම (Attendance)
2. දෙපාර්තමේන්තුවට ලැබෙන ලිපි පසු විපරම් කිරීමේ පහසුකම (Mail)
3. පරිගණක ජාල පද්ධතිය තුළ දත්ත හුවමාරු කිරීම (Share)
4. භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ දත්ත ගබඩා කිරීම (GIS-Backup)
5. දත්ත ගබඩා කිරීම (Backup) - ඉඩම් තොරතුරු පද්ධති හා ගුවන් මැනුම් අංශය

### 6. සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංකික දත්ත ගබඩා කිරීමේ ක්‍රමවේදයක් සැකසීම

සර්වේයර් ජනරාල් කාර්යාලයේ ගුවන් මැනුම්, දූරස්ථ ග්‍රහණ, සිතියම්කරණ හා ඉඩම් තොරතුරු පද්ධති අංශයන්හි පිළියෙළ කරන අංකික දත්ත ආරක්ෂාකාරී ලෙස පරිගණක ජාලයේ ඇති ප්‍රධාන දත්ත ගබඩාවක (NAS හි) ගබඩා කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

## 7. Land Searcher

දෙපාර්තමේන්තුවේ දැනට පිළියෙළ කර ඇති පිඹුරු හා භූගෝලීය දත්ත භාවිත කර Plan Searcher දත්ත පද්ධතිය සකසා ඇත. මෙමඟින් යම් ස්ථානයක පවතින පිඹුරු පිළිබඳ තොරතුරු, වනරක්ෂිත, අභයභූමි, ජලාශ ආදිය හඳුනාගැනීමට හැකියාව ඇත.

### 8. කාර්යාල කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම

උතුරු මැද පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, පොළොන්නරුව හා ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයන් සඳහා කාර්යාල කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපනය කරන ලද අතර මෙම දත්ත පද්ධතිය මඟින් පහත සඳහන් පහසුකම් ලබා ගත හැක.

1. කාර්යාලයට ලැබෙන ලිපි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කිරීම හා පසුවිපරම් කිරීමේ හැකියාව
2. කල් නොපවතින භාණ්ඩ හා සේවා කළමනාකරණය

### 9. සර්වේයර් ජනරාල් කාර්යාලයේ දෙපාර්තමේන්තු සේවා හා මිනින්දෝරු සේවා අංශ සඳහා ලැබෙන ලිපි පිළිබඳ පසු විපරම් කිරීමේ දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම

දෙපාර්තමේන්තු සේවා හා මිනින්දෝරු සේවා අංශ සඳහා යොමු කෙරෙන ලිපි, අදාළ විෂයභාර නිලධාරියා වෙත යොමු කළ පසු ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහා දත්ත පද්ධතියක් නිපදවා ඇති අතර එය කාර්යාලීය පරිගණක ජාල පද්ධතිය මඟින් භාවිත කළ හැක.

**10. පරිපාලන හා සම්පත් කළමනාකරණ කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු ලබාගැනීමට දත්ත රැස්කිරීමේ ක්‍රමවේද හඳුන්වා දීම.**

අන්තර්ජාලය තුළින් භාවිත කළ හැකි පෝරම නිපදවා එමඟින් පහත සඳහන් තොරතුරු රැස්කරන ලදී.

1. කාර්යාල සඳහා 2019 වර්ෂයට අවශ්‍ය වන කල් නොපවතින භාණ්ඩ පිළිබඳ තොරතුරු
2. කාර්යාලවල භාවිත කරන ප්ලාස්ටික් පුටු පිළිබඳ තොරතුරු
3. දෙපාර්තමේන්තුවේ සේවය කරන ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ තොරතුරු

## 11. Contact Detail Map

දෙපාර්තමේන්තුවේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල පිහිටි ස්ථානය ලංකා සිතියමක නිරූපණය වන අතර එහි ලිපිනය හා සම්බන්ධ විය හැකි දුරකථන අංකය මෙම දත්ත පද්ධතිය මඟින් මහජනතාවට ලබා ගත හැක.

### 12. පුහුණු වැඩමුළු පැවැත්වීම

1.පරිගණක මෘදුකාංග ස්ථාපනය කිරීම, දෘඩාංග සැකසුම් හා පරිගණක භාවිතයේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම පිළිබඳ පලාත් සර්වේයර් ජනරාල් කාර්යාල හා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල නියෝජනය කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු 07ක් පවත්වන ලද අතර ඒ සඳහා උතුරු මැද, මධ්‍යම, දකුණ, ඌව, බස්නාහිර, සබරගමුව හා වයඹ පළාත් නියෝජනය කරමින් නිලධාරීන් 45 ක් සහභාගි විය.

2.මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය (HuRIMS) හා නව Anti-Virus මෘදුකාංගය (Eset) ස්ථාපනය කිරීම පිළිබඳ වැඩමුළු පැවැත්වීම

3.නව ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 24ක් පහත සඳහන් අයුරින් පවත්වන ලදී.

| දිනය | දිස්ත්‍රික්කය | වැඩමුළුව පැවැත්වූ ස්ථානය |
|---|---|---|
| 2018-10-29 | පුත්තලම | පුත්තලම |
| 2018-10-30 | අනුරාධපුර | අනුරාධපුර |
| 2018-10-31 | පොළොන්නරුව | පොළොන්නරුව |
| 2018-11-07 | කෑගල්ල | කෑගල්ල |
| 2018-11-08 | නුවර | නුවර |
| 2018-11-09 | ගම්පහ | ගම්පහ |
| 2018-11-13 | කොළඹ | සර්වේයර් ජනරාල් කාර්යාලය |
| 2018-11-14 | කළුතර | |
| 2018-11-27 | යාපනය | යාපනය |
| | කිලිනොච්චි | |
| | මුලතිව් | |
| 2018-11-28 | මන්නාරම | වව්නියාව |
| | වව්නියාව | |
| 2018-12-05 | කුරුණෑගල | කුරුණෑගල |
| | මාතලේ | |
| 2018-12-10 | ගාල්ල | ගාල්ල |
| 2018-12-11 | මාතර | මාතර |
| 2018-12-12 | හම්බන්තොට | හම්බන්තොට |


| දිනය | දිස්ත්‍රික්කය | වැඩමුළුව පැවැත්වූ ස්ථානය |
|---|---|---|
| 2018-12-18 | නුවරඑළිය | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය |
| | අම්පාර | |
| | ත්‍රිකුණාමලය | |
| 2018-12-19 | රත්නපුර | |
| 2018-12-20 | බදුල්ල | |
| | මොනරාගල | |
| 2018-12-21 | මඩකලපුව | මඩකලපුව |





**පරිගනක දෘඩාංග සැකසුම් පිළිබඳ පුහුණු වැඩමුළු**





**නව ඉඩම් විස්තර ලැයිස්තු දත්ත පද්ධතිය පිළිබඳ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව**

මීට අමතරව මෙම වසරේදී තොරතුරු තාක්ෂණ අංශය විසින් පහත සඳහන් සේවාවන් සපයන ලදී.

- ප්‍රධාන කාර්යාලයේ පරිගනක හා පරිගනක උපාංග සඳහා වන පරිගනක දෝෂ නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම.
- මානව සම්පත් කළමනාකරණ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ අංශය මඟින් පිළියෙළ කරන ලද අනෙකුත් දත්ත පද්ධතීන් පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ දෛනික පැමිණීමේ සටහන් කිරීමේ පද්ධතිය පවත්වාගෙන යාම.

- දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපින නාමාවලිය පිළිබඳ තොරතුරු දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

**ඵලදායීතා ප්‍රවර්ධනය**

ඵලදායීතා තත්ත්ව කවවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා තරඟ සංවිධානය කළ අතර 2018 වසර සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සුභපැතුම් පත නිර්මාණය කිරීම හා 2017 වසරේ කාර්යසාධන වාර්තාවේ පිටකවරය නිර්මාණය කිරීම සඳහා ඵලදායීතා තත්ත්ව කව අතර තරඟ පවත්වා ජයග්‍රහණය කරන ලද තත්ත්ව කව සඳහා සහතික පත්‍ර ප්‍රදානය කරන ලදී.

2018 වසර සඳහා ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය මඟින් පැවැත්වූ ජාතික ඵලදායීතා සම්මාන තරඟාවලිය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ඉදිරිපත් වූ අතර මිනින්දෝරු දෙපාර්තමේන්තුව විශේෂ කුසලතා සම්මානයක්ද, වයඹ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය හා අනුරාධපුර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය තුන්වන ස්ථානය ද දිනාගන්නා ලදී.




**2018 වසර සඳහා සුභපැතුම් පත හා 2017 වසරේ කාර්යසාධන වාර්තාවේ පිටකවරය නිර්මාණය කිරීමේ තරඟයන්හි ජයග්‍රාහකයින් හට ත්‍යාග ප්‍රදානය කිරීම**

## 3.6 සහතික/බලපත්‍ර නිකුත් කිරීම්

3.6.1 බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීම සඳහා මේ වසරේදී විභාගය පවත්වා ඇති අතර ප්‍රතිඵල මෙතෙක් නිකුත් කොට නැත.

3.6.2 මේ වසරේදී ප්‍රතීතන සහතික 23 ක් නිකුත්කර ඇත.

3.6.3 2002 අංක 17 දරණ මැනුම් පනත යටතේ මැනුම් සභාව විසින් බලයලත් මිනින්දෝරුවන් 957ක් සඳහා බලපත්‍ර නිකුත් කර ඇත.

## 3.7 නීති අංශය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ නීතිමය කටයුතු මෙහෙයවීම මෙම අංශයෙන් සිදුකෙරේ. දිසා අධිකරණය/මහාධිකරණය/අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය යන අධිකරණයන්හි දෙපාර්තමේන්තුව විසින් නඩු පැවරීමේදී හා දෙපාර්තමේන්තුවට එරෙහිව නඩු පැවරීම් සිදුවන අවස්ථාවන්හිදී නීතිපතිවරයා වෙත සහයෝගය දැක්වීම මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයක් වේ. එසේම, දෙපාර්තමේන්තු නිලධාරීන් රාජකාරි කටයුතුවලදී මුහුණපාන නීතිමය ගැටළුවලට විසඳුම් ලබාදීමත් දෙපාර්තමේන්තුවට එරෙහිව මානව හිමිකම් කොමිෂන්

සභාව විසින් පවත්වන පරීක්ෂණවලදී සර්වේයර් ජනරාල්වරයා වෙනුවෙන් පෙනී සිටීමත් මෙම අංශයෙන් මූලිකව සිදුවේ.

අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු

| අධිකරණය | 2018.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2018 වසර තුළදී ලැබුණු සංඛ්‍යාව | 2018 වසර තුළදී අවසන් වූ සංඛ්‍යාව | 2018.12.31 දිනට පවතින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 10 | 07 | 06 | 11 |
| අභියාචනාධිකරණය | 28 | 06 | 08 | 26 |
| මහාධිකරණය | 01 | 02 | - | 03 |
| දිසා අධිකරණය | 21 | 03 | 03 | 21 |

මූලික කටයුතු සිදුකරන ගොනු

| 2018.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2018 වසර තුළදී ලැබුණු සංඛ්‍යාව | 2018 වසර තුළදී අවසන් වූ සංඛ්‍යාව (මුදල් අයකර හෝ කපාහැරීමට යොමුකර) | 2018 වසර තුළදී නීතිපති වෙත යොමු කරන ලද ගොනු | 2018.12.31 දිනට කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 25 | 18 | 10 | 01 | 32 |

නඩු පැවරීම සඳහා නීතිපති වෙත යොමු කරන ලද ගොනු

| 2018.01.01 දිනට යොමු කර පැවති ගොනු | 2018 වසර තුළදී යොමු කරන ලද ගොනු | 2018 වසර තුළදී නීතිපති උපදෙස් මත අවසන් කළ ගොනු සංඛ්‍යාව | 2018.12.31 දිනට නඩු පැවරීමට අදාළව කටයුතු සිදුකරන ගොනු සංඛ්‍යාව |
|---|---|---|---|
| 25 | 01 | 10 | 16 |

මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ගොනු

| 2018.01.01 දිනට පැවති සංඛ්‍යාව | 2018 වසර තුළදී ලැබුණු සංඛ්‍යාව | 2018 වසර තුළදී අවසන් වූ සංඛ්‍යාව | 2018.12.31 දිනට පවතින සංඛ්‍යාව |
|---|---|---|---|
| 09 | 02 | 02 | 09 |

# 4.0 මූල්‍ය කළමනාකරණය

දෙපාර්තමේන්තු ගිණුම් පද්ධතිය ගෙවීමේ කාර්යාල 35 කින් සමන්විතය. එනම්, ප්‍රධාන කාර්යාලය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 9ක්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 24ක් සහ දියතලාවේ පිහිටි මැනුම් සහ සිතියම්ගත කිරීමේ ආයතනය එකී ගෙවුම් කාර්යාල වේ. 2018 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවලින් ලබාදී ඇති මූල්‍ය ප්‍රතිපාදන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුව ඵලදායී ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කර ඇත. විවිධ වැය විෂයන් සඳහා වෙන් කර දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අභිබවා වියදම් නොකිරීමෙන් දෙපාර්තමේන්තුව සතුටුදායක මූල්‍ය කළමනාකරණයක් පවත්වාගැනීමට සමත්ව ඇත.

තව ද, බිම් සවිය වැඩසටහනට අදාළව අමාත්‍යාංශය මඟින් ලබා දෙන ප්‍රතිපාදන හා වියදම් සම්බන්ධයෙන් මනා සම්බන්ධීකරණයක් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය හා පවත්වා ගෙන යන ලදී. එමෙන් ම 2018 වර්ෂයේ දෙපාර්තමේන්තු ආදායම් එකතු කිරීමේ කටයුතුද සාර්ථකව සිදු කොට ඇත.

සමාලෝචනයට භාජනය වන වසර තුළ දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු පිළිබඳ තොරතුරු පහත පෙන්වා ඇත.

## 4.1 වැය ඇස්තමේන්තුව

| | පෙර වර්ෂය (2017) | | | වියදම් ප්‍රතිශතය | ප්‍රවර්තන වර්ෂය (2018) | | | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය | |
| වැඩ සටහන 1<br>ව්‍යාපෘති 1 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 158,355,000 | 153,133,375 | 5,221,625 | 97% | 165,900,000 | 154,135,835 | 11,764,165 | 93% |
| වෙනත් පුනරාවර්තන | 79,413,000 | 73,962.991 | 5,450,009 | 93% | 86,620,000 | 82,745,876 | 3,874,124 | 95% |
| ප්‍රාග්ධන | | | | | | | | |
| 2001 | 16,000,000 | 7,003,547 | 8,996,453 | 44% | 15,000,000 | 14,717,358 | 282,642 | 98% |
| 2002 | 3,000,000 | 1,051,599 | 1,948,401 | 35% | 840,000 | 580,752 | 259,248 | 69% |
| 2003 | 2,750,000 | 714,266 | 2,035,734 | 26% | 2,050,000 | 1,045,827 | 1,004,172 | 51% |
| 2102 | 1,500,000 | 1,209,058 | 290,942 | 81% | 1,500,000 | 1,456,293 | 43,707 | 97% |
| 2103 | 4,000,000 | 3,988,200 | 11,800 | 100% | 4,000,000 | 3,869,374 | 130,626 | 97% |
| 2104 | 25,000,000 | 18,031,533 | 6,968,447 | 72% | 162,000,000 | 44,290,701 | 117,709,299 | 27% |
| 2401 | 400,000 | 387,558 | 12,442 | 97% | 400,000 | 384,690 | 15,310 | 96% |
| වැඩ සටහන 2 | | | | | | | | |
| ව්‍යාපෘතිය 2 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 3,074,885,000 | 2,803,253,686 | 271,631,314 | 91% | 2,938,911,000 | 2,805,041,092 | 133,869,908 | 95% |
| වෙනත් පුනරාවර්තන | 250,350,000 | 244,127,717 | 6,222,283 | 98% | 374,598,000 | 342,013,082 | 32,584,918 | 91% |
| ප්‍රාග්ධන | | | | | | | | |
| 2001 | 22,000,000 | 21,852,266 | 147,734 | 99% | 25,000,000 | 24,369,005 | 630,995 | 97% |
| 2002 | 15,000,000 | 10,827,769 | 4,172,231 | 72% | 15,000,000 | 12,418,594 | 2,581,406 | 83% |
| 2003 | 17,000,000 | 16,920,184 | 79,816 | 100% | 17,000,000 | 16,735,709 | 264,291 | 98% |
| 2102 | 5,000,000 | 4,991,598 | 8,402 | 100% | 4,000,000 | 3,981,817 | 18,183 | 100% |
| 2103 | 100,000,000 | 41,382,739 | 58,617,261 | 41% | 100,000,000 | 81,196,853 | 18,803,147 | 81% |
| 2401 | 800,000 | 636,331 | 163,669 | 80% | 800,000 | 744,798 | 55,502 | 93% |
| 2501 | 5,000,000 | 3,129,865 | 1,870,135 | 63% | 20,000,000 | 16,738,850 | 3,261,150 | 84% |
| වැඩ සටහන 2 | | | | | | | | |
| ව්‍යාපෘතිය 3 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 120,771,000 | 93,490,697 | 27,280,303 | 77% | 93,725,000 | 87,049,989 | 6,675,011 | 93% |
| වෙනත් පුනරාවර්තන | 11,490,000 | 9,763,607 | 1,726,393 | 85% | 13,511,000 | 12,556,809 | 954,191 | 92% |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන | | | | | | | | |
| 2001 | 1,400,000 | 1,391,557 | 8,443 | 99% | 1,400,000 | 1,366,666 | 33,334 | 98% |
| 2002 | 800,000 | 799,977 | 23 | 100% | 800,000 | 544,594 | 255,406 | 68% |
| 2003 | 1,400,000 | 1,338,074 | 61,926 | 96% | 1,400,000 | 613,479 | 786,521 | 44% |
| 2102 | 400,000 | 317,540 | 82,460 | 79% | 78,000 | 56,900 | 21,100 | 73% |
| 2103 | 400,000 | 377,833 | 22,167 | 94% | 500,000 | 452,900 | 47,100 | 91% |
| 2401 | 550,000 | 513,458 | 36,542 | 93% | 550,000 | 456,825 | 93,174 | 83% |
| **එකතුව** | **3,917,664,000** | **3,514,597,045** | **403,066,955** | **90%** | **4,045,583,000** | **3,709,564,668** | **336,018,329.00** | **92%** |

## 4.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම

| සීමාවන් | පෙර වර්ෂය - 2017 | | ප්‍රවර්තන වර්ෂය - 2018 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | සත්‍ය | ඇස්තමේන්තුව | සත්‍ය |
| **වියදමේ උපරිම සීමාව** | 166,000,000 | 174,166,257 | 150,000,000 | 157,719,622 |
| **අවම බැර සීමාව** | 110,000,000 | 132,917,138 | 121,000,000 | 159,100,318 |
| **උපරිම හර ශේෂ සීමාව** | 400,000,000 | 375,507,382 | 400,000,000 | 374,126,685 |

| | **2017 වර්ෂය** | **2018 වර්ෂය** |
|---|---|---|
| **මුදලින් හර** | 163,324,846 | 132,804,478 |
| **වෙනත් දෙපාර්තමේන්තු හර** | 10,841,411 | 24,915,143 |
| | | |
| **මුදලින් බැර** | 121,518,120 | 132,741,861 |
| **වෙනත් දෙපාර්තමේන්තු බැර** | 11,399,018 | 26,358,456 |

## 4.3 ආදායම් ගිණුම

| | **පෙර වර්ෂය - 2017** | **ප්‍රවර්තන වර්ෂය - 2018** |
|---|---|---|
| ඇස්තමේන්තුව | 340,000,000 | 350,000,000 |
| වර්ෂයේ ආදායම | 437,934,356 | 433,233,056 |
| වෙනස (+/-) | 97,934,356 | 83,054,889 |

## 4.4 භෞතික සම්පත් කළමනාකරණය

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, දියතලාවේ මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09 ක්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 24 ක් දෙපාර්තමේන්තුව සතු භෞතික සම්පත් ලෙස පවතින අතර ප්‍රාදේශීය කාර්යාල 44 ක් දෙපාර්තමේන්තුව සතු හා රජයේ ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු

ලැබේ. ප්‍රාදේශීය කාර්යාල 49 ක් පමණ කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලිවල පවත්වා ගෙන යනු ලබන අතර, මේ සඳහා ද නව ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගත යුතුව ඇත.මේ හැර සංචාරක බංගලා 15 ක් සහ නිල නිවාස ද දෙපාර්තමේන්තුව සතුව ඇත.

## 4.4.1 නිශ්චල සහ චංචල සම්පත් සංවර්ධනය

2018 වසර තුළදී ඉටු කරන ලද රු. 50,000.00 ට වැඩි තැනීම් හා අළුත්වැඩියාවන් පහත පරිදි වේ.

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 1 | බස්නාහිර පළාත | මතුගම ප්‍රා.මි.කා. පෙර සවි කඳවුරු අලුත්වැඩියාව | 75,000.00 |
| 2 | | පැලවත්ත ප්‍රා.මි.කා. පෙර සවි කඳවුරු අලුත්වැඩියාව | 78,210.00 |
| 3 | | කළුතර දි.මි.කා. ඡායාපිටපත් යන්ත්‍රය අලුත්වැඩියාව | 55,856.70 |
| 4 | | කළුතර ප්‍රා.මි.කා. ඡායාපිටපත් යන්ත්‍රය අලුත්වැඩියාව | 55,856.70 |
| 5 | | පැලවත්ත ප්‍රා.මි.කා. ඡායාපිටපත් යන්ත්‍රය අලුත්වැඩියාව | 73,234.00 |
| 6 | | කොළඹ දි.මි.කා IR2520 ඡායාපිටපත් යන්ත්‍රය සඳහා Drum Unit එකක් යෙදීම | 64,235.21 |
| 7 | | ගම්පහ ප්‍රා.මි.කා සඳහා දම්රෝ ඔෆිස් වර්ක් ස්ටේෂන් 2ක් මිලට ගැනීම | 364,831.25 |
| 8 | | ගම්පහ ප්‍රා.මි.කාර්යාලයේ ඇතුළතින් පාටිෂන් කිරීම | 158,000.00 |
| 9 | | ගම්පහ ප්‍රා.මි.කා.භූමියේ 32x11 ප්‍රමාණයේ ගරාජයක් ඉදිකිරීම | 140,000.00 |
| 10 | | ගම්පහ දි.මි.කා.භූමියේ 15x10 ප්‍රමාණයේ ගරාජයක් ඉදිකිරීම | 76,500.00 |
| 11 | සබරගමුව පළාත | ප.ස.ජ. කාර්යාලයේ ගිණුම් අංශය පිහිටි කොටස සඳහා තිබූ ජනෙල් දෙකක් ඉවත් කර නව ජනෙල් දෙකක් පිහිටුවීම | 125,275.00 |
| 12 | | ප.ස.ජ. කාර්යාල පරිශ්‍රයේ ගෙමිදුල සඳහා ඉන්ටර්ලොක් ගල් ඇතිරීම | 302,500.00 |
| 13 | | කෑගල්ල දි.මි.කා. සඳහා ගරාජයක් ඉදිකිරීම | 50,000.00 |
| 14 | | ඇලපාත ප්‍රා.මි.කා. සහ රත්නපුර ප්‍රා.මි.කා. සඳහා පොදු වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 746,000.00 |
| 15 | | රත්නපුර දි.මි.කා. ලේඛනාගාරයේ ලේඛන ගබඩා කිරීම සඳහා රාක්ක 3ක් සෑදීම | 194,990.00 |
| 16 | උතුරු මැද පළාත | විවේකාගාරය සඳහා නව මුළුතැන්ගෙයක් ඉදිකිරීම | 418,485.00 |
| 17 | | විවේකාගාරයේ නව මුළුතැන්ගෙයෙහි පැන්ට්‍රි කබඩ් ගැසීම | 77,500.00 |
| 18 | | විවේකාගාරය නවීකරණය කිරීම | 581,987.86 |
| 19 | | නවීකරණය කළ විවේකාගාරය පාටිෂන් කිරීම | 525,280.00 |
| 20 | | නවීකරණය කළ විවේකාගාරයට ඇළුමිනියම් දොර ජනෙල් සවිකිරීම | 142,000.00 |
| 21 | | පළාත් කාර්යාලයේ නව ගරාජයක් ඉදිකිරීම | 94,000.00 |
| 22 | | පළාත් කාර්යාලයේ පැරණි ගරාජයට කොන්ක්‍රීට් යෙදීම | 97,500.00 |
| 23 | | ලේඛනාගාරය III අලුත්වැඩියාව | 85,500.00 |
| 24 | | ලේඛනාගාරය III හා ස.අ.(මුදල්) නිල කාමරය ටයිල් ඇතිරීම | 158,120.00 |
| 25 | | ලේඛනාගාරය III සඳහා ඇළුමිනියම් රාක්ක සවිකිරීම | 72,600.00 |
| 26 | | පළාත් කාර්යාලයේ රැස්වීම් කාමරයේ බිම කොන්ක්‍රීට් යෙදීම | 55,000.00 |
| 27 | | පළාත් කාර්යාලයේ බිම සකස් කිරීම | 218,000.00 |
| 28 | | ජ්‍යෙ.මි.අ .නිල නිවසේ අලුත්වැඩියාව සහ තීන්ත ආලේප කිරීම | 84,062.75 |
| 29 | | අංක 36,37,38 පෙරසවි කඳවුරු සඳහා උළුවහු සහ දොර ජනෙල්, ජනෙල් උළුවහු සවිකිරීම | 250,420.00 |
| 30 | | අංක **36,38** පෙරසවි කඳවුරුවල තීන්ත ආලේප කිරීම හා දොර ජනෙල් පොලිෂ් කිරීම | **64,025.00** |

| | | | |
|---|---|---|---|
| **31** | උතුරු මැද පළාත | අංක 36 පෙරසවි කඳවුරේ වටේට තහඩු පොළොවට සවිවන ස්ථානය අඩියක් උසට ඉංජිනේරු ගඩොලින් බැඳ කපරාදු කර සුදුමැදීම | 72,470.00 |
| **32** | | අංක 36 පෙරසවි කඳවුරෙහි එල්ලෙන සිවිලිමක් සවිකිරීම | 114,480.00 |
| **33** | | අංක 37 පෙරසවි කඳවුරෙහි එල්ලෙන සිවිලිමක් සවිකිරීම | 81,000.00 |
| **34** | | අංක 38 පෙරසවි කඳවුරෙහි එල්ලෙන සිවිලිමක් සවිකිරීම | 81,000.00 |
| **35** | | තඹුත්තේගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය ගරාජය කොන්ක්‍රීට් කිරීම | 105,960.00 |
| **36** | | පොලොන්නරුව දි.මි.කා. හි කොරිඩෝව හා පරිගනක කාමරය ටයිල් කිරීම | 210,243.00 |
| **37** | | 94 පෙරසවි කඳවුර අලුත්වැඩියා කිරීම | 315,810.00 |
| 38 | | 91 පෙරසවි කඳවුර අලුත්වැඩියා කිරීම | 51,180.00 |
| 39 | උතුරු පළාත | උතුරු පළාත් කාර්යාලයේ පෙරසවි නිවසේ වහල අලුත්වැඩියාව | 348,537.00 |
| 40 | | වවුනියා දි.මි.කා.ලේඛනාගාරයේ වහල අලුත්වැඩියාව | 100,000.00 |
| 41 | | වවුනියා -1 ප්‍රා.මි.කා. සඳහා මෝටර් බයිසිකල් ගරාජයක් ඉදිකිරීම | 258,520.00 |
| 42 | | වවුනියා දිස්ත්‍රික් කාර්යාලයේ පෙරසවි නිවසේ අලුත්වැඩියාව සහ වයරින් කිරීම | 290,420.00 |
| 43 | | කිලිනොච්චි ප්‍රා.මි.කා. හි දකුණුපස තාප්පය ඉදිකිරීම | 574,825.00 |
| 44 | | කිලිනොච්චි ප්‍රා .මි.කා. හි ගොඩනැගිලි අලුත්වැඩියාව | 80,290.00 |
| 45 | | කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලයේ පෙරසවි නිවසේ අලුත්වැඩියාව | 62,710.00 |
| 46 | | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලයේ සංචාරක කාමරය ඉදිකිරීම | 318,934.00 |
| 47 | | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලයේ පෙරසවි නිවසේ වහල අලුත්වැඩියාව | 109,800.00 |
| 48 | | මාන්කුලම් ප්‍රා .මි.කා. හි පෙරසවි නිවසේ වහල අලුත්වැඩියාව | 198,784.00 |
| 49 | | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලයේ කියුබිකල් සැකසීම | 128,840.00 |
| 50 | | දිස්ත්‍රික් කාර්යාලයේ නාන කාමර අලුත්වැඩියා කිරීම | 383,295.00 |
| 51 | | මුලතිව් දිස්ත්‍රික් කාර්යාල භූමියේ පස් පිරවීම | 99,000.00 |
| 52 | | මාන්කුලම් ප්‍රා .මි.කා. හි පෙරසවි කුටි සඳහා කැනපියක් සැකසීම | 81,425.00 |
| 53 | | යාපනය ප්‍රා .මි.කා. හි ගොඩනැගිලි අලුත්වැඩියාව | 202,485.00 |
| 54 | වයඹ පළාත | භූමිතික අංශය සඳහා ගරාජයක් තැනීම. | 375639.16 |
| 55 | | වාරියපොල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මායිම් තාප්පයේ කොටසක් අලුත්වැඩියා කර තීන්ත ආලේප කිරීම | 136910.00 |
| 56 | | පුත්තලම දි.මි.කා. කාර්මික හා පරිපාලන නිලධාරි නිල නිවසේ නාන කාමරය අලුත්වැඩියාව | 166086.20 |
| 57 | | පුත්තලම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වටා පැති බැම්ම බැඳීම | 93515.81 |
| 58 | | පුත්තලම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ගරාජයක් ඉදිකිරීම | 73500.00 |
| 59 | | ආනමඩුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මායිම් තාප්පයේ කොටසක් අළුතින් ඉදිකිරීම. | 778720.41 |
| 60 | | ආනමඩුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා සිවිලින් විදුලි පංකා මිලට ගැනීම සහ සවිකිරීම | 51000.00 |
| 61 | | ආනමඩුව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා යකඩ ගේට්ටුවක් සවි කිරීම. | 151778.37 |
| 62 | මධ්‍යම පළාත | මධ්‍යම පළාත් කාර්යාලයේ තීන්ත ආලේප කිරීම | 50000.00 |
| 63 | | මහනුවර දි.මි.කා. සඳහා නව ගරාජයක් ඉදිකිරීම | 92000.00 |
| 64 | | මාතලේ දි.මි.කා. සඳහා බාහිර වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 97,745.00 |
| 65 | | මාතලේ දි.මි.කා. හි මි.අ. කාමරය සහ පරිගණක කාමරයේ බිම ටයිල් ඇතිරීම | 82,996.63 |
| 66 | | මාතලේ දි.මි.කා. ලේඛනාගාරය සැකසීම | 69,995.00 |
| 67 | | කොත්මලේ ප්‍රා.මි.කා.නව වැසිකිළි පද්ධතියක් සහ නාන කාමරයක් ඉදිකිරීම | 208,652.60 |
| 68 | | කොත්මලේ ප්‍රා.මි.කා. භූමිය වටා වැටක් ඉදිකිරීම | 135,000.00 |
| 69 | | කොත්මලේ ප්‍රා.මි.කා. පිවිසුම් මාර්ගය මීටර් 30ක් කොන්ක්‍රීට් කිරීම | 195,000.00 |
| **70** | | නුවරඑළිය දි.මි.කා.වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම | 67,840.00 |

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| **71** | | කතරගම සංචාරක බංගලාවේ අලුත්වැඩියාවන් සිදු කර ගැනීම | 2,659,000.00 |
| **72** | | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ විදුලි පරිපථ නැවත සකස් කිරීම | 2,670,000.00 |
| **73** | | කතරගම සංචාරක බංගලාවේ පැරණි ගොඩනැගිල්ලේ නාන කාමරයේ ටයිල් ඉවත් කර අළුතින් සියළු උපාංග යොදා ටයිල් කර සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදු කිරීම | 133,000.00 |
| **74** | | දකුණු පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය සඳහා තිර රෙදි මිලදී ගැනීම | 120,690.00 |
| **75** | | ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම | 87,100.00 |
| 76 | | ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ මිනින්දෝරු අධිකාරි (මුලස්ථාන) සඳහා කොටසක් සකස් කිරීම | 197,800.00 |
| 77 | | මාතර දි.මි.කාර්යාලයේ ගරාජයේ බිම කොන්ක්‍රීට් දමා සකස් කිරීම | 154,080.00 |
| **78** | දකුණු පළාත | මාතර දි.මි.කාර්යාලයේ සී.සී.ටී.වී.කැමරා 04 ක් සවි කිරීම | 68,600.00 |
| **79** | | මාතර දි.මි.කාර්යාලය ඇතුලත ලිපිගොනුවල ආරක්ෂාවට ඇලුමිනියම් බාර් යොදා පාටිෂන් කිරීම | 54,500.00 |
| **80** | | ප්‍රා.මි.කා.මාතර ගොඩනැගිල්ලේ ඉදිකරන ලද නව භූමිතික කාර්යාල කොටසේ සහ ලේඛනාගාර කොටසේ අලුත්වැඩියා කටයුතු කිරීම. | 75,500.00 |
| **81** | | හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ කාන්තා වැසිකිළිය (නාන කාමර සහිත) අලුත්වැඩියා කිරීම | 259,000.00 |
| **82** | | හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පිරිමි වැසිකිළිය (නාන කාමර සහිත) අලුත්වැඩියා කිරීම | 245,000.00 |
| 83 | | හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ පරිගණක මේසය සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම | 72,445.00 |
| **84** | | හම්බන්තොට ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ විදුලි පද්ධතිය නවීකරණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම සහ ඒ සඳහා වන වැඩ කුලිය ගෙවීම | 52,582.00 |
| 85 | | නැ.පළාත් ස.ජ.කාර්යාලයේ කොටසක ටයිල් ඇතිරීම | 423,988.50 |
| 86 | | මඩකලපුව දි.මි.කාර්යාලයේ අලුත්වැඩියා කිරීම් | 1,447,759.75 |
| 87 | | කන්තලේ ප්‍රා.මි.කා.නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1063,745.61 |
| 88 | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය දි.මි.කා.පොත් රාක්ක අලුත්වැඩියා කිරීම | 51,800.00 |
| 89 | | අම්පාර දි.මි.කා. පිටුපස තාප්පය ඉදිකිරීම | 420,310.00 |
| **90** | | අම්පාර දි.මි.කා.මුර කුටිය ඉදිකිරීම | 193,000.00 |
| **91** | | අම්පාර දි.මි.කා. ගරාජය අලුත්වැඩියා කිරීම | 125,865.00 |
| 92 | | ජ්‍යො.මි.අ.( ඌව පළාත) නිල නිවස අලුත්වැඩියාව | 121,245.00 |
| 93 | | ප.ස.ජ. කාර්යාල පරිශ්‍රයේ නැගෙනහිර මායිමේ සහ නිල නිවාස පරිශ්‍රයේ බටහිර මායිමේ කම්බි වැට ඉදිකිරීම | 204,440.00 |
| 94 | | ප.ස.ජ. කාර්යාලයේ වැසිකිළි අලුත්වැඩියාව සඳහා කොමෝඩ් සෙට් 2ක් මිලට ගැනීම | 53,210.00 |
| 95 | | බිබිල ප්‍රා.මි.කා.ගොඩනැගිලි අලුත්වැඩියාව | 134,197.00 |
| 96 | | බිබිල ප්‍රා.මි.කා.තහඩු නිවස අලුත්වැඩියාව | 139,600.00 |
| 97 | ඌව පළාත | මොනරාගල කා.ප.නි.නිල නිවස අලුත්වැඩියාව | 319,458.00 |
| 98 | | ජ්‍යො.මි.අ.(මොනරාගල) නිල නිවස අලුත්වැඩියාව | 112,709.54 |
| 99 | | දි.මි.කා .(මොනරාගල) කාර්යාලයීය අලුත්වැඩියාව | 75,185.00 |
| **100** | | දි.මි.කා .(මොනරාගල)ට අයත් 445/12 නිල නිවස අලුත්වැඩියාව | 70,730.00 |
| **101** | | ජ්‍යො.මි.අ.(බදුල්ල) නිල නිවස අලුත්වැඩියාව,වැට ඉදිකිරීම, ගේට්ටු දැමීම | 296,956.50 |
| 102 | | අංක 41 නිල නිවස අලුත්වැඩියාව හා තීන්ත ආලේපනය | 142,437.00 |
| 103 | | ප්‍රා.මි.කා.(බණ්ඩාරවෙල) සඳහා නව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 574,756.97 |

| | පළාත | විස්තරය | වියදම (රු.) |
|---|---|---|---|
| 104 | ස.ජ. කාර්යාලය | මෝටර් සයිකල් ගරාජයේ පොළව කොන්ක්‍රිට් කිරීම | 289,974.12 |
| 105 | | පුටු විවීම | 62,150.00 |
| 106 | | වැටුප් අංශය පාටිෂන් කිරීම | 215,000.00 |
| 107 | | උපදේශන සේවා ගාස්තු ගෙවීම(ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) | 6,758,829.10 |
| 108 | | බදුල්ල ප්‍රා.මි.කාර්යාලය ඉදිකිරීම | 11.374,047.50 |
| 109 | | මැදවච්චිය ප්‍රා.මි.කාර්යාලය ඉදිකිරීම | 18,200,000.00 |
| 110 | | ගිරිතලේ ප්‍රා.මි.කාර්යාලය ඉදිකිරීම | 5,241,002.86 |
| 111 | | ගිරිතලේ ප්‍රා.කාර්යාලයට අදාල නිල නිවාස ඉදිකිරීම | 5,853,314.92 |
| 112 | | ඇඹිලිපිටිය ප්‍රා.මි.කාර්යාලය ඉදිකිරීම | 7,578,848.45 |
| 113 | | මාදම්පේ ප්‍රා.මි.කාර්යාලය ඉදිකිරීම | 16,500,000.00 |
| 114 | | කරච්චන්කාඩු අතරමැදි කඳවුර ඉදිකිරීම | 10,543,394.11 |
| 115 | මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය - දියතලාව | CB – 01 නාන කාමර අලුත් වැඩියා කිරීම | 297497.50 |
| 116 | | CB – 01 නාන කාමර අලුත් වැඩියා කිරීම | 373056.32 |
| 117 | | CB - 02 ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියා කිරීම පළමු අදියර | 335498.00 |
| 118 | | කාණු පද්ධතිය අලුත්වැඩියා කිරීම | 285440.00 |
| 119 | | සංචාරක නිවාස සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 150018.00 |
| 120 | | CB - 02 ප්‍රවේශ මාර්ගය හා කුණු වල සැකසීම | 62073.50 |
| 121 | | CB - 02 ප්‍රවේශ මාර්ගය අලුත්වැඩියා කිරීම දෙවන අදියර | 597399.00 |
| 122 | | Sokkia SDLIX Digital Level උපකරණය සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම | 980694.91 |
| 123 | | ජල පිරිපහදු යන්ත්‍ර මිලදී ගැනීම | 103305.00 |
| 124 | | 20KVA ATS ජෙනරේටරය මිලදී ගැනීම | 1300000.00 |
| 125 | | මූලික පිල් ලකුණු වටා ආරක්ෂක බැම්ම ඉදි කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම | 94320.00 |
| 126 | | තීන්ත මිලදී ගැනීම | 365505.27 |
| 127 | | වැලි සහ මැටල් මිලදී ගැනීම | 87000.00 |
| 128 | | විදුලි උපාංග මිලදී ගැනීම | 100425.00 |
| 129 | | ජල නල උපාංග මිලදී ගැනීම | 196650.00 |
| 130 | | ගල් හට් අලුත්වැඩියාව සඳහා ටකරන් තහඩු මිලදී ගැනීම | 69700.00 |
| 131 | | ගල් හට් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම | 220810.00 |
| 132 | | විදුලි හා ජලනල අවශ්‍යතා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම | 54775.00 |
| 133 | | විදුලි හා ජලනල අවශ්‍යතා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීම | 218925.00 |
| 134 | | Cannon IR 2520 ඡායා පිටපත් යන්ත්‍ර සේවා කිරීම | 54500.00 |
| 135 | | අභ්‍යන්තර දුරකථන පද්ධතිය අලුත්වැඩියා කිරීම | 195255.00 |
| 136 | | CCTV කැමරා පද්ධතිය අලුත්වැඩියා කිරීම | 127400.00 |
| 137 | | පරිගණක මේස මිලදී ගැනීම | 56900.00 |
| 138 | | තණකොළ කපන යන්ත්‍ර හා ඉලෙක්ට්‍රික් ඩ්‍රිල් මිලට ගැනීම | 74700.00 |
| 139 | | ලැප්ටොප් මිලදී ගැනීම | 348000.00 |
| 140 | | තාක්ෂණික පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | 80169.00 |

### 4.4.2 උපකරණ හා ගොඩනැගිලි අංශය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 93 ක් පවත්වා ගෙන යන අතර ඉන් 44 ක් දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබයි. 2018 වසරට අදාළව මේ වන විට තවත් නව ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 5 කට අදාළව ගොඩනැගිලි ඉදි කරමින් පවතී. ඒවා නම්, බදුල්ල,මැදවච්චිය ගිරිතලේ සහ මාදම්පේ වෙයි. එම ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2019 වසර තුළදී අවසන් කිරීමට බලාපොරොත්තු වේ.

2018 වර්ෂය තුළදී Digital Level උපකරණ 34ක් අලුතින් ක්ෂේත්‍රයට එකතු කිරීමට උපකරණ හා ගොඩනැගිලි අංශයට හැකි විය.

දීර්ඝ කාලීන භාවිතය නිසා ක්‍රියාකාරීත්වය අඩු උපකරණ වර්ග වූ නිකෝන් හා ටොප්කෝන් උපකරණ වර්ග ක්ෂේත්‍රයෙන් ඉවත් කර වෙන්දේසි කරන ලදී.. පූර්ණමාන සේවා/ අලුත්වැඩියා සහ අත්‍යවශ්‍ය උපාංග මිලදී ගැනීම සඳහා අංශයට වෙන්කළ රු. මිලියන 1.6 ක් අතරින් සමස්ත මෙහෙයුම් පිරිවැය රු. මිලියන 1.42 ක් විය.

ක්ෂෙත්‍රයේදී අලාභහානි වූ උපාංග හා අලුත්වැඩියාව සඳහා එවන ලද උපාංග, ගර්හිත කරන ලද උපකරණවලින් ලබාගත් කොටස් යොදා ගනිමින් සිදුකිරීමට හැකි විය.

අනුරාධපුර, මැදවච්චිය, මන්නාරම, මුලතිව්, කැබිතිගොල්ලෑව සහ ස.ජ.කාර්යාලය යන ස්ථානවල පිහිටි පෙරසවි කඳවුරු ගැලවීම හා සවිකිරීම සිදුකරන ලදී.

මැනුම් පාලන ලක්ෂ සඳහා අවශ්‍ය A වර්ගයේ බෝල්ට් 3,340ක් සහ C වර්ගයේ බෝල්ට් 6,360 ක් නිෂ්පාදනය කරන ලදී.
දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා නව හැඳුනුම්පත් 317 ක් නිකුත් කළ අතර, බාහිර පාර්ශවයන්ගේ අවශ්‍යතා ඉටුකරදී (උපකරණ අංක කෙටීම, පූර්ණමාන අංක ශෝධනය වැනි) රු. 90,800.00 ක ආදායමක් උපයාදී ඇත.

මීට පෙර වර්ෂවල මෙන්ම 2018 වර්ෂය තුළදී ද උපකරණ කාර්මික ශිල්පීන්ගේ හිඟයක් පැවතීම හේතුවෙන් උපකරණ සේවා කිරීමේ කටයුතුවල කාර්යක්ෂමතාවය අඩුවීමට හේතුවිය.

### 4.4.3 වාහන හා යන්ත්‍ර සූත්‍ර නඩත්තුව

වාහන 138 ක රුපියල් 50,000.00 ඉක්ම වූ අළුත්වැඩියාවන් සිදු කර ඇත. ඒවා පළාත් අනුව පහත සඳහන් කර ඇත.

| | නඩත්තු කටයුතු කළ වාහන ගණන | වැය වූ මුළු මුදල රු. |
|---|---|---|
| ස.ජ.කාර්යාලය | 06 | 677,268.37 |
| බස්නාහිර පළාත | 15 | 3,023,444.30 |
| මධ්‍යම පළාත | 21 | 1,835,148.65 |
| සබරගමුව පළාත | 11 | 1,676,236.15 |
| උතුරු මැද පළාත | 11 | 2,257,448.68 |
| වයඹ පළාත | 14 | 1,293,526.33 |
| ඌව පළාත | 09 | 935,364.31 |
| දකුණු පළාත | 20 | 3,844,856.25 |
| උතුරු පළාත | 03 | 209,410.00 |
| නැගෙනහිර පළාත | 23 | 6,484,943.66 |
| මැ.සි.ආයතනය | 05 | 491,361.62 |
| **එකතුව** | **138** | **19,413,018.27** |

### 4.4.4 ප්‍රසම්පාදන හා සැපයීම් අංශය

ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ හා සේවා අවශ්‍යතා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට ලබාගැනීම සහ බෙදා හැරීමත්, සියලුම ගබඩා ලෙජර නිසි ලෙස යථාවත් කර පවත්වා ගෙන යාමත්, වාර්ෂික ගබඩා සමීක්ෂණය අධීක්ෂණය කර නිෂ්කාෂණ ලබා දීමත් වේ.

සර්වේයර් ජනරාල් කාර්යාලයේ විවිධ අංශ, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සහ රට පුරා විසිරී සිටින මිනින්දෝරු නිලධාරීන් විසින් නඩත්තු කර ගෙන යනු ලබන ගබඩා ලෙජර 871 ට අදාළව ගබඩා සමීක්ෂණ කටයුතු නිම කර ඇත.

ඒවායින් රජයේ මිනින්දෝරුවරුන් 644 දෙනෙකුට ද, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සියල්ලටම ද, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සියල්ලටම ද, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 85 කටද, දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ ඇති ගබඩා ඒකක සියල්ලටම ද, සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන සියල්ලටම ද, සර්වේයර් ජනරාල් කාර්යාලයේ අංශ සියල්ලටම ද, අඩු ලුහුඬින් තොර සහතික ලබා දී ගොනු නිරවුල් කරන ලදි.

විශ්‍රාම ගිය හා ඉල්ලා අස් වී ගිය නිලධාරීන් 28 දෙනෙකු සඳහා ස්ථිර නිශ්කාෂණ ද, උසස්වීම් ලැබූ රජයේ මිනින්දෝරු නිලධාරීන් 13 දෙනෙකු සඳහා තාවකාලික නිශ්කාෂණ ද, ලබා දී ඇත.

2018 වසර තුළ දී රුපියල් මිලියන 62.5 කට අධික ප්‍රාග්ධන මිලදී ගැනීම් ද රුපියල් මිලියන 8.6 කට අධික පුනරාවර්ථන මිලදී ගැනීම් ද, බිම් සවිය ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.4 කට අධික ප්‍රාග්ධන මිලදී ගැනීම් ද රුපියල් මිලියන 1.5 කට ආසන්න පුනරාවර්ථන මිලදී ගැනීම් ද, එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන සඳහා රුපියල් මිලියන 0.1කට ආසන්න ප්‍රාග්ධන මිලදී ගැනීම් ද සිදු කර ඇත.

2018 වසර සඳහා වන චංචල දේපල ලැයිස්තුව ද පහත දක්වා ඇත.

| අනු අංකය | වත්කම් වර්ගය | 2018 වසර මුලදී පැවති තත්ත්වය | වර්ෂය තුළදී සිදුවූ වෙනස්වීම් | | | | වසර අවසානයේ දී පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිලදී ගැනීම | වෙන්දේසි කිරීම | ඉවත් කිරීම | |
| 1 | මෝටර් ලොරි | 07 | - | - | - | - | 07 |
| 2 | මෝටර් ලොරි (සින්ගල් කැබ්) | 42 | - | - | - | - | 42 |
| 3 | මෝටර් කාර් | 06 | - | - | - | - | 06 |
| 4 | ජීප් | 58 | - | - | 08 | - | 50 |
| 5 | ඩබල් කැබ් | 165 | - | - | 04 | - | 161 |
| 6 | වෑන් | 36 | | - | - | - | 36 |
| 7 | ත්‍රී රෝද රථ | 01 | - | - | - | - | 01 |
| 8 | ට්‍රැක්ටර් | 05 | - | - | - | - | 05 |
| 9 | බවුසර් | 04 | - | - | - | - | 04 |
| 10 | පාගන බයිසිකල් | 19 | - | - | - | - | 19 |
| 11 | ඩුප්ලිකේටර් යන්ත්‍ර | 26 | - | - | 05 | - | 21 |
| 12 | ඡායාපිටපත් යන්ත්‍ර | 226 | 02 | 12 | 09 | - | 231 |
| 13 | පරිගණක CPU | 1093 | 02 | 42 | 60 | - | 1077 |
| 14 | පරිගණක Monitors | | 02 | 65 | 83 | | |
| 15 | පරිගණක ප්‍රින්ටර්ස් | 535 | 02 | 34 | 97 | | 474 |
| 16 | ලැප් ටොප් පරිගණක | 452 | | 216 | 01 | | 667 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 17 | ෆැක්ස් යන්ත්‍ර | 135 | | 21 | 04 | | 152 |
| 18 | යතුරු ලියන (මැනුවල්) | 56 | | | 13 | | 43 |
| 19 | සේප්පු | 51 | | | | | 51 |
| 20 | කැමරා<br>(ප්‍රොසෙස් හා ඒරියල්) | 02 | - | - | - | - | 02 |
| 21 | ලිතෝ මුද්‍රණ යන්ත්‍ර | 15 | - | - | - | - | 15 |
| 22 | රූපවාහිනී යන්ත්‍ර | 16 | - | 05 | - | | 21 |
| 23 | ශීතකරණ | 17 | | - | | - | 17 |
| 24 | ගිලටීන් යන්ත්‍ර | 3 | | | | | 3 |
| 25 | ඡායාරේඛණමිතික<br>නියැකීම් යන්ත්‍ර | 10 | - | - | - | - | 10 |
| 26 | ටෝටල් ස්ටේෂන් මැනුම්<br>උපකරණ | 355 | | | | | 355 |
| 27 | තියොඩලයිට් මැනුම්<br>උපකරණ | 650 | - | - | - | - | 650 |
| 28 | ක්‍රමලේඛිත ගණක යන්ත්‍ර | 592 | - | - | - | - | 592 |
| 29 | විශාල වර්ගයේ ස්කෑන්<br>යන්ත්‍ර | 60 | | | 02 | | 58 |
| 30 | ඡායාරේඛණමිතික<br>නියැකීම් යන්ත්‍ර (ඩිජිටල්) | 02 | - | - | - | - | 02 |
| 31 | වානේ මැනුම් පටි | 980 | | 20 | | | 1000 |
| 32 | පරිගණක සර්වර් | 02 | - | - | 02 | - | 0 |
| 33 | ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය | 01 | - | - | - | - | 01 |
| 34 | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්ස් | 48 | - | - | - | - | 48 |
| 35 | ඩිජිටල් ලෙවල්ස් | 17 | | 34 | | | 51 |
| 36 | 60’’ සොල්වන්ට් ප්‍රින්ටර්ස් | 01 | - | - | - | - | 01 |
| 37 | ඩිජිටල් පොටෝග්‍රැමටික්<br>වර්ක් ස්ටේෂන් | 02 | - | - | - | - | 02 |
| 38 | අන් මෑන් ඒරියල් වෙහිකල්<br>(UAV) | 01 | - | - | - | - | 01 |
| 39 | A0 ප්ලොටර් | 2 | - | 02 | - | - | 04 |
| 40 | හැන්ඩ් හෙල්ඩ් ජී.පී.එස්. | 339 | - | - | - | - | 339 |
| 41 | GNSS Reicevers | 74 | - | - | - | - | 74 |
| 42 | A3 වර්ණ ඡායා පිටපත්<br>යන්ත්‍ර | 1 | - | - | - | - | 1 |
| 43 | High Capacity Storage<br>deivices | 14 | -- | 07 | - | - | 21 |
| 44 | ලිනන් මැනුම් පටි | - | - | 26 | - | - | 26 |
| 45 | Singer colour printing<br>Machine | - | - | 01 | - | - | 01 |
| 46 | PC (Thin client) | - | - | 19 | - | - | 19 |
| 47 | Tab | - | - | 20 | - | - | 20 |
| 48 | Room Heater | - | - | 02 | - | - | 02 |
| 49 | Washing Machine | - | - | 01 | - | - | 01 |
| 50 | Hot & Cold Dispenser | - | - | 06 | - | - | 06 |

2018 වසර සඳහා වන නිශ්චල දේපල ලැයිස්තුව ද පහත පරිදි වේ.

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුළ සිදුවූ වෙනස්වීම් | | | | වසර අවසානයේ පැවති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් | මිළදී ගැනීම් | වෙන්දේසි කිරීම් | ඉවත් කිරීම් | |
| 1. | ඉඩම් (හෙක්.) | 73.9542 | - | - | - | - | 73.9542 |
| 2. | ගොඩනැගිලි | 189 | - | - | - | - | 189 |
| 3. | ඉදි කිරීම් | 01 | - | - | - | - | - |

## 4.5 විගණන කටයුතු

### අභ්‍යන්තර විගණන අංශය

ආයතනයේ මූල්‍ය පාලනය සහ සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ගෙන යන බව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික විය යුතු බැවින් ඒ සඳහා ආයතනයේ කටයුතුවල සඵලදායී තාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ආයතනයේ කටයුතු ඵලදායී ලෙස කර ගෙන යාමට සහාය ලබා දීම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදුකරනු ලැබේ.

මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් සහ ගිණුම් නිසි ලෙස පවත්වා ගෙන යාම, මූල්‍ය කළමනාකරණය නිසිපරිදි කර ගෙන යන බවට සහතික වීම සහ එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීම සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව සහ ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් සහ ස්වාධීන ඇගයීමක් පවත්වා ගෙන යාම දෙපාර්තමේන්තු කාර්ය සාධනය සහ ඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකිරීම අභ්‍යන්තර විගණනය මඟින් සිදුකරනු ලැබේ.

සර්වේයර් ජෙනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ මගපෙන්වීම අනුව සර්වේයර් ජෙනරාල්ගේ හා විගණකාධිපතිගේ එකගතාවය මත 2018 වසර සඳහා සැලසුම් කළ විගණන වැඩසටහන පදනම්කරගෙන සියලු විගණනයන් සිදු කරන ලදී.

මෙහිදී භාණ්ඩාගාර චක්‍රලේඛ අංක IA/2001/1 හා 2009.06.09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) කෙරෙහි විශේෂ අවධානය යොමුකළ අතර ඒ තුළින් ආයතනයේ ඵලදායීතාවය හා කාර්ය සාධනය ප්‍රශස්ත මට්ටමකට ළඟා කර ගැනීම සඳහා සිරිත් පරිදි කෙරෙන මූල්‍ය විගණනයන්ට වඩා පද්ධති විශ්ලේෂණය හා කාර්යසාධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරන ලදී.

ඒ අනුව 2018 වසරේ ප්‍රධාන කාර්යාලයට අදාල වාර්තා 11 ක්ද, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට අදාළ වාර්තාවක් ද, පළාත් මැනුම්පති කාර්යාලවලට අදාළ වාර්තා 05 ක්ද දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවලට අදාළ වාර්තා 09 ක්ද සාර්ථක ලෙස නිමකරන ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ මග පෙන්වීම යටතේ මූල්‍ය ප්‍රකාශනයන් හි දැක්වෙන අගයන් සහ හෙළිදරවු කිරීම්වලට උපකාරීවෙන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙළ කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම් පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති නිවැරදි ද ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද යන්න සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරවු කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයන්වලට

ඇතුළත් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දෙපාර්තමේන්තුවේ හොඳ මූල්‍ය විනයක් සහ ආයතන කළමනාකාරීත්වයේ වර්ධනයක් නිරීක්ෂණය වී ඇති බැව් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

# 5.0 සංවර්ධන ක්‍රියාකාරකම්

## 5.1 ඉඩම් මැනුම්

2018 වර්ෂය තුළ සැලසුම් කළ ඉලක්කයෙන් 132% ක ප්‍රගතියක් ලබා ගන්නා ලදී.

**2018-12-31 දින දක්වා ඉඩම් මැනුම් ප්‍රගතිය**

| මැනුම් වර්ගය | භෞතික ප්‍රගතිය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික ඉලක්කය | | සමුච්චිත ඉලක්කය | | සමුච්චිත ප්‍රගතිය | | | ලබාගත් ප්‍රගතිය (%) | |
| | මිනින්දෝරු මාස | කැබලි | මිනින්දෝරු මාස | කැබලි | මිනින්දෝරු මාස | කැබලි | මැනුම් ඉල්ලීම් | මිනින්දෝරු මාස | කැබලි |
| මායිම් ගල් දැමීමේ මැනුම් | 3,698 | 94193 (73920 allotment) | 3413 | 83788 (56305 Allotments) | 4536 | 111067 (68596Allotment) | 4227 | 123 | 118 |
| විවිධ මැනුම් | 990 | 25,500 | 985 | 25316 | 1293 | 34178 | 2277 | 131 | 134 |
| ඉඩම් අත්කර ගැනීමේ මැනුම් | 775 | 20,040 | 834 | 21119 | 1092 | 29809 | 975 | 141 | 149 |
| ඉංජිනේරු මැනුම් | 150 | | 130 | | 648 | | 156 | 432 | |
| සිතියම්කරණය සඳහා පාලන ලක්‍ෂ්‍ය පිහිටුවීම | 163 | | 219 | | 220 | | 284 | 135 | |
| උසාවි කොමිෂන් මැනුම් | 476 | 9,267 | 562 | 10312 | 557 | 10899 | 659 | 117 | 118 |
| කැඩැස්තර මැනුම් | 1,200 | 36,000 | 1204 | 40555 | 1548 | 44768 | 877 | 129 | 124 |
| භූගෝලීය ස්ථානීය ලක්‍ෂ්‍ය පිහිටුවීම | 333 | 9990 pt | 347 | 10412 pt | 400 | 12013 pt | | 120 | 120 |
| *එකතුව* | **7785** | **185000** | **7347** | **181090** | **10294** | **230721** | **9455** | **132** | **125** |

## 2018 වසරේ සිදු කරන ලද විශේෂ මැනුම් කාර්යයන්

- ***ඉ.සං.ආ. පනත යටතේ ඉටු කරන ලද මැනුම්***
  - ඉ.සං.ආ. පනත යටතේ ඉඩම් මිලියන 1.1ක් සඳහා දීමනා පත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන යටතේ බිම් කැබලි 60,000 ක් මැනුම් කිරීම
  - රජයේ ඉඩම් ඉ.සං.ආ පනත යටතේ ඉඩම් නොමැති මහජනතාවට බෙදාදීම සඳහා කරනු ලබන මැනුම්
  - මැනීමකින් තොරව ලබාදී ඇති ජය භූමි දීමනා පත්‍ර ඉඩම්වල මහජනතාවට ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා ඉටු කරනු ලබන මැනුම්

- ***මාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු සඳහා ඉටු කරන ලද මැනුම්***
  - රුවන්පුර අධිවේගී මාර්ගයේ මැනුම් කටයුතු.
  - මධ්‍යම අධිවේගී මාර්ගයේ විස්තර මැනුම් හා අත්කර ගැනීමේ මැනුම්
  - නව කැලණි පාලම සඳහා ඉඩම් අත්කර ගැනීමේ මැනුම්
  - යෝජිත මහනුවර උමං මාර්ගයේ මැනුම්
  - යක්කල- ගම්පහ මාර්ගය පුළුල් කිරීම
  - රාජගිරිය- කැලණිය කුළුණු මතින් ඉදි කරන ලද ගුවන් පාලම සඳහා මැනුම් කිරීම
  - පිටත වටරවුම් මාර්ගය 3වන අදියරය යටතේ මැනුම් කිරීම
  - කුරුණෑගල - හබරන දුම්රිය මාර්ගය මැනීම
  - මරදාන දෙමටගොඩ දුම්රිය මාර්ගයේ මැනුම් කටයුතු
  - කැලණි වැලි දුම්රිය මාර්ගයේ මැනුම් කටයුතු
  - දක්ෂිණ අධිවේගී මාර්ගයේ මාතර සිට හම්බන්තොට අත්කර ගැනීමේ මැනුම්.
  - සැහැල්ලු දුම්රිය මාර්ගයේ මැනුම් කටයුතු
- ***කර්මාන්තපුර සඳහා ඉටු කරන ලද මැනුම්***
  - මිල්ලනිය කර්මාන්ත හා අධි තාක්ෂණික කලාපය පිහිටුවීමට අදාළව මැනුම්
  - බිංගිරිය කර්මාන්ත කලාපයක් ඇති කිරීම සඳහා වූ විශේෂ මැනුම්
- ***සංචාරක කටයුතු සඳහා ඉටු කරන ලද මැනුම්***
  - කල්පිටිය සංචාරක කර්මාන්ත වැඩි දියුණු කිරීම සඳහා මැනුම්
- ***සංවර්ධන කටයුතු සඳහා ඉංජිනේරු මැනුම්***
  - යාන් ඔය අත්කර ගැනීමේ මැනුම්
  - වයඹ ඇල මැනුම් කටයුතු
  - කළුගඟ - මොරගහකන්ද සම්බන්ධිත ඇල මාර්ගයේ ඉංජිනේරු මැනුම්
  - ඉහළ ඇලහැර ව්‍යාපෘතිය
  - දැදුරු ඔය මැනුම් කටයුතු
- ***වෙනත් සංවර්ධන කටයුතු සඳහා ඉටු කරන ලද මැනුම්***
  - කටුනායක ගුවන්තොටුපළ දෙවන අදියර සඳහා මැනුම්
  - මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය සඳහා මැනුම්
  - කිත්තම්පහුව ඇළ දෙපස අත්කර ගැනීමේ මැනුම් කටයුතු කිරීම
  - හෝමාගම ජෛව තාක්ෂණ විද්‍යා පීඨයේ භූ ලක්ෂණාත්මක මැනුම් කටයුතු
  - කැලණි ගඟ වම් හා දකුණු ඉවුරු මැනීම
  - කිතුල්ගල නගර මැනුම්
  - UN-HABITAT ව්‍යාපෘතිය යටතේ උතුරු පළාත් ඉඩම් කැබලි 10,000ක් මැනුම් කිරීම
  - ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මහවැලි මැනුම් අධීක්ෂණය
  - පහළ මල්වතු ඔය අත්කර ගැනීමේ මැනුම්
  - කන්කසන්තුරේ සිමෙන්ති කම්හල ඉඩම කර්මාන්ත ශාලාවක් සඳහා මැනීම
  - කෘෂිකාර්මික කටයුතු නවීකරණය හා යාන්ත්‍රීකරණය ප්‍රචලිත කිරීම සඳහා ගොවිපොල ඒකාබද්ධ කිරීමේ අධ්‍යයන නියමු ව්‍යාපෘතිය
  - රජයේ විශේෂ සංවර්ධන කටයුතු සඳහා ඉටු කරනු ලබන විශේෂ ව්‍යාපෘති මැනුම්

- ***කාලීන අවශ්‍යතා අනුව ඉටු කරන ලද මැනුම්***
  - කැලණි ගඟ ආශ්‍රිත ගංවතුරෙන් හානි වූ ප්‍රදේශ මැනීම.
  - අරුවක්කාලු කසල බැහැර කරන ස්ථානය මැනීම
  - කැලණිය කසල භූවමාරු කිරීමේ ස්ථානය මැනීම
  - මීතොටමුල්ල කසල බැහැර කල ස්ථානයේ භූමියේ ස්ථායීතාව පරීක්ෂා කිරීම
  - ගං වතුර ප්‍රදේශ සිතියම් ගත කිරීම හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර වැඩ
  - පුද්ගලික ඉඩම් ගැටළු විසඳීම සඳහා අධිකරණයේ යොමු කිරීම මත ඉටු කරනු ලබන උසාවි මැනුම්

- ***වනාන්තර හා රක්ෂිත ආශ්‍රිත සඳහා ඉටු කරන ලද මැනුම්***
  - සිංහරාජ වනාන්තරය අත්කර ගැනීම සඳහාවූ මැනුම්
  - ලාහුගල වන ජීවී රක්ෂිතය මැනීම
  - ගිං ගඟ ආරක්ෂිත බිම්වල රක්ෂිත හඳුනා ගැනීම
  - දෙදියගල රක්ෂිතයේ මැනුම් කටයුතු
  - උඩවත්ත කැලය ගැසට් කරන ලද මායිම් අනුව මැනුම් හා පිඹුරු කටයුතු කිරීම
- ***සිතියම් පුනරීක්ෂණය සඳහා දත්ත රැස් කිරීම***
  - සිතියම් පුනරීක්ෂණ ක්ෂේත්‍ර කටයුතු මගින් 1:50,000 පරිමාණයේ පත්‍ර අංක 66 (කොළඹ) යාවත්කාලීන කිරීම
- ***වෙනත් ආයතන සඳහා ඉටු කරන ලද මැනුම්***
  - ලංකා විදුලිබල මණ්ඩලයේ මැනුම්
  - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සඳහා මැනුම්
  - ශ්‍රී ලංකා පාසල් දත්ත පද්ධතිය සැකසීම
  - ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු JIG උපකරණය ක්‍රමාංකණය කිරීම
  - ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු Master Landing Compass හා Master Medium Landing Compass උපකරණ ක්‍රමාංකණය කිරීම
  - මඩු පල්ලිය ව්‍යාපෘතිය

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මැනුම් කර දීමනා පත්‍ර ලබාදීම සඳහා නිකුත් කරන ලද රේඛා චිත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | නිකුත් කරන ලද රේඛා චිත්‍ර ගණන | |
|---|---|---|
| | **2017** | **2018** |
| මහනුවර | 365 | 661 |
| මාතලේ | 908 | 821 |
| නුවරඑළිය | 409 | 125 |
| අනුරාධපුරය | 5039 | 7611 |
| පොළොන්නරුව | 1516 | 2273 |
| වවුනියාව | 56 | 406 |
| යාපනය | 69 | 816 |
| කිලිනොච්චිය | 1256 | 1122 |
| මුලතිව් | 182 | 1015 |
| මන්නාරම | 0 | 217 |
| මඩකලපුව | 2469 | 1656 |
| ත්‍රිකුණාමලය | 2125 | 2905 |
| කුරුණෑගල | 1927 | 3038 |

| | | |
|---|---|---|
| පුත්තලම | 729 | 1201 |
| රත්නපුර | 1339 | 1148 |
| කෑගල්ල | 161 | 235 |
| ගාල්ල | 2162 | 1976 |
| මාතර | 304 | 516 |
| හම්බන්තොට | 606 | 1486 |
| බදුල්ල | 285 | 216 |
| මොනරාගල | 856 | 983 |
| අම්පාර | 4334 | 5847 |
| කොළඹ | 0 | 0 |
| ගම්පහ | 146 | 409 |
| කළුතර | 428 | 125 |
| එකතුව | **25517** | **36808** |

### 5.1.1 විශේෂ මැනුම් හා තත්ත්ව පාලන අංශය

විශේෂ මැනුම් හා තත්ව පාලන අංශය ප්‍රධාන කාර්යාලයේ එක් ශාඛාවක් ලෙස අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) යටතේ පවත්වාගෙන යනු ලැබේ. මෙම ශාඛාව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරයෙකු, මිනින්දෝරු අධිකාරීවරයෙකු, මිනින්දෝරුවරුන් දස දෙනෙකු හා සිතියම් තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත වෙයි. ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති මෙම අංශය මගින් විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන් හා හදිසි මැනුම් අවශ්‍යතා ඉටුකර දෙමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා අවශ්‍ය ගුණාත්මක භූමි තොරතුරු කාර්යක්ෂමව ලබා දෙමින් ජාතික සංවර්ධන වැඩපිළිවෙළ සඳහා පුරෝගාමී දායකත්වයක් සපයයි.

**කාර්යභාරය**

නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් විශේෂ සංවර්ධන ව්‍යාපෘතීන් හා හදිසි මැනුම් අවශ්‍යතා කාර්යක්ෂමව ඉටුකර දෙමින් ද, අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) වෙත ඉදිරිපත්වන භූමි තොරතුරු සම්බන්ධ අර්බුදකාරී ප්‍රශ්නවලදී නියමිත තත්ත්ව පාලනයන් සිදුකොට ගුණාත්මක භූමි තොරතුරු අදාළ අංශයන් වෙත ඉදිරිපත්කර දෙමින්ද, දිවයිනට බලපාන හදිසි ආපදා තත්වයන්හීදී ජනතාවට සහන සැපයීමට අවශ්‍යය මැනුම් හා සිතියම්කරණ කටයුතු කාර්යක්ෂමව ඉටුකර දෙමින්ද ජාතික සංවර්ධන වැඩපිළිවෙළ සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරෝගාමී දායකත්වයක් සැපයීම.

**කාර්යසාධනය**

1. නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරමින් Calibration for Master Landing Compass , Calibration for Medium Landing Compass සහ Jig Calibration ආදී දෙපාර්තමේන්තුවේ වෙනත් අංශ මඟින් ඉටුකිරීමට අපහසු විශේෂ මැනුම් කාර්යයන් ඉටු කර දී ඇත.
2. උඩවත්ත කැලේ රක්ෂිතයේ සඳහන් මායිම් සහ ස.ජ.අංක PP මහ 6254 පිඹුර අධිස්ථාපනය කර සිතියම් සකස් කොට ඉදිරිපත් කර ඇත.
3. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ කොළඹ සහ තදාසන්න ගංවතුර තත්වය පාලනය කිරීම සඳහා කැලණි ගංඉවුර දිගේ විශේෂ මැනුම් කටයුතු කිරීම.
4. ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ආරම්භ කිරීමට නියමිත කැලණිවැලි දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් ලෙස පුළුල් කොට සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය මූලික මැනුම් කටයුතු ඉටුකිරීම .(දුම්රිය මාර්ගය 32.8 km හා මට්ටම් ගැනීම 75km)
5. අධි සංචාරක කලාපයක් ලෙස නම් කර ඇති කිතුල්ගල නගරය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නගර මැනුම් සිදුකිරීම.
6. අලුතින් නිකුත් කළ 1:50,000 පරිමාණයේ සිතියම් පත්‍ර අංක 66 කොළඹ සිතියම සඳහා සිතියම් පුනරීක්ෂණ කටයුතු සිදුකර දී ඇත.
7. අලුතින් ඉදිවන කළු ගඟ යෝජනා ක්‍රමයේ මැනුම් කටයුතු සිදු කර දී ඇත.

8. මත්ද්‍රව්‍යය වැටලීම් , නීති විරෝධී සංක්‍රමණ හා දේශසීමා උල්ලංඝනය කිරීම්වලදී අදාළ ආරක්ෂක හා නීති අංශවලට තීරණ ගැනීමට අවශ්‍ය නිවැරදි භූමි තොරතුරු ,අවකාශීය දත්ත හා වාර්තා සැපයීමට කටයුතු කොට ඇත.
9. ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දීමනා පත්‍ර ලබා දීමට අවශ්‍ය ඉඩම් මැනුම් කටයුතු සිදුකර දී ඇත.
10. මුලතිව්, නයාරු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශයේ මැනුම් කටයුතු සිදුකිරීම.
11. ක්ෂේත්‍රයෙන් මෙම අංශය වෙත ඉදිරිපත් කරන මැනුම් උපකරණවල තත්ව පරීක්ෂාවන් සිදුකිරීමට කටයුතු කිරීම
12. පාසල් දත්ත පද්ධතිය මුළු දිවයිනම ආවරණය වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අලුතින් සකස් කිරීම.
13. ජාතික බිම් කැබලි වියමනට අදාළ කොළඹ දිස්ත්‍රික්කයේ පිඹුරු අංකික දත්ත බවට පරිවර්තනය කර කොළඹ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත භාරදීම.
14. දිවයිනට බලපාන හදිසි ගංවතුර, නායයෑම් ආදී ස්වභාවික ආපදා තත්වවලදී ජනතාවට සහන සැපයීමට අවශ්‍ය මැනුම් හා සිතියම්කරණ කටයුතු සිදුකරමින් අදාළ රාජ්‍ය අංශ හා මහජනතාව වෙත භූමි තොරතුරු සැපයීම.

### 5.1.2 භූමිතික මැනුම් ශාඛාව

මෙම ශාඛාව ප්‍රධාන කාර්යාලයේ වෙනම ශාඛාවක් ලෙස නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරයෙකු යටතේ පවත්වා ගෙන යනු ලැබේ. භූමිතික මැනුම් ශාඛාවේ අධීක්ෂණය යටතේ මැ.සි.ආ. - දියතලාව, වයඹ , මධ්‍යම, උතුර, දකුණ යන භූමිතික අංශ මගින් ඉටු කරනු ලබන, පාලන ලක්ෂ්‍ය පිහිටුවීම හා වෙනත් විශේෂ මැනුම් ද ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති භූමිතික මැනුම් ඒකක මගින් ඉටු කරනු ලබන මිනිසුන් රහිත ගුවන් යානය ( UAV ) භාවිත කර සිදු කරන මැනුම් කටයුතු පිළිබඳව ද ප්‍රගතිය පහත දක්වා ඇත.

| විස්තරය | මැ.සි.ආ. | වයඹ | දකුණ | මධ්‍යම | උතුර | ස.ජ.කා. | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජී.පී.එස්. පාලන ලක්ෂ්‍ය පිහිටුවීම | 1281 | 1228 | 541 | 614 | 357 | 250 | 4271 |
| වෙනත් මැනුම් සඳහා තුල්‍ය ජී.පී.එස්. පාලන ලක්ෂ්‍ය ගණන | 20 | 182 | 09 | 248 | 09 | 49 | 517 |
| නිම කරන ලද සම්පූර්ණ පාලන ලක්ෂ්‍ය ගණන | 1301 | 1410 | 550 | 862 | 366 | 299 | 4788 |
| නිම කරන ලද සම්පූර්ණ පාලන ලක්ෂ්‍ය සඳහා තුල්‍ය මිනින්දෝරු මාස ගණන | 43.37 | 47 | 18.33 | 28.8 | 12.20 | 10 | 159.7 |
| 2018 වසරේ නිම කරන ලද මුළු මිනින්දෝරු මාස ගණන | 104 | 62.20 | 40.90 | 77.60 | 47.80 | 53.35 | 385.85 |
| 2018 වසරේ ප්‍රගතිය % | 122 | 104 | 120 | 108 | 100 | 112 | 115 |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු ( භූමිතික අංශය - ස.ජ කාර්යාලය )**

**වර්ෂය තුළදී UAV මගින් සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය |
| 2 | කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ මැනීම |
| 3 | CMC ව්‍යාපෘතිය සඳහා මැනුම් කිරීම |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (භූමිතික අංශය - ස.ජ කාර්යාලය )**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සඳහා විස්තරාත්මක මැනීම හා භූ ලක්ෂණාත්මක සිතියම් පිළියෙළ කිරීම |
| 2 | කුරුණෑගල - හබරණ දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියට අදාළ අමතර මැනුම් කිරීම |
| 3 | CMC ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය Orthomap එක පිළියෙළ කිරීම |
| 4 | බොරැල්ල කනත්ත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක මැනීම හා භූ ලක්ෂණාත්මක සිතියම් පිළියෙළ කිරීම |
| 5 | බලපිටිය - අම්බලන්ගොඩ - ගිංතොට වෙරළ සංරක්ෂණ මැනුම් ව්‍යාපෘතිය සඳහා සිතියම් පිළියෙළ කිරීම |
| 6 | Monorailway ව්‍යාපෘතිය සඳහා පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 7 | මාදුරුඔය අභයභූමියේ සංචාරක සිතියමක් පිළියෙළ කිරීම සඳහා මැනුම් කටයුතු කිරීම |
| 8 | කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් කරන ලද ඉල්ලීම්වලට අනුව 1:1 මිලියන (බිම් සවිය) ඉඩම් මැනුම් කිරීමේ වැඩසටහන යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ සේවා සැපයීම් (භූමිතික අංශය - ස.ජ කාර්යාලය )**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | බලයලත් මිනින්දෝරුවන් සහ වෙනත් ආයතන වෙත පාලන ලක්ෂ්‍යවල සහ පිල් ලකුණුවල විස්තර සැපයීම |
| 2 | SLCORSnet තාක්ෂණය භාවිතයෙන් මැනුම් කටයුතු කිරීම සඳහා බලයලත් මිනින්දෝරුවන් සහ වෙනත් ආයතන වෙත සේවා සැපයීම |
| 3 | පාලන ලක්ෂ්‍ය සහ පිල් ලකුණු දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම |
| 4 | SLCORSnet සහ RTK තාක්ෂණය භාවිතයෙන් මැනුම් කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන්, බලයලත් මිනින්දෝරුවන් සහ වෙනත් ආයතන වෙත පුහුණු කිරීම් සහ වැඩමුළු පැවැත්වීම |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් කටයුතු (දියතලාව භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | රත්මලාන ගුවන් තොටුපොළෙහි විශේෂ මැනුම් කටයුතු |
| 2 | සීතාවක ගඟ ජල විදුලි බලාගාරය සඳහා මට්ටම් ගැනීම |
| 3 | වෙරළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පානම ප්‍රදේශයේ පාලන ලක්ෂ්‍ය 12ක් පිහිටුවීම |
| 4 | දියතලාව, ශ්‍රී ලංකා ගුවන් හමුදා සටන් පුහුණු පාසල ආවරණය වන පරිදි සිදු කරන ලද විස්තර මැනුම් කටයුතු |
| 5 | දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් කරන ලද ඉල්ලීම්වලට අනුව 1:1 මිලියන (බිම් සවිය) ඉඩම් මැනුම් කිරීමේ වැඩසටහන යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |

**යථාතත්‍ය මට්ටම් ගැනීම (දියතලාව භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | වීරවිල - වැල්ලවාය මට්ටම් රේඛාව |
| 2 | ඉඹුල්පෙ - පැල්මඩුල්ල මට්ටම් රේඛාව |
| 3 | පාලමුනේ - පොතුවිල් මට්ටම් රේඛාව |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් (වයඹ පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | මහලේකම් කාර්යාලයේ සිට රඹුක්කන දක්වා, කොළඹ කොටුව සිට කළුතර දකුණ දක්වා, හෝමාගම සිට අවිස්සාවේල්ල දක්වා දුම්රිය මාර්ගවල භූමිතික මැනුම් |
| 2 | අත්තනගල්ල - මිනුවන්ගොඩ ජල සම්පාදන මැනුම් කි.මී.1.4 මට්ටම් කිරීම |
| 3 | පුත්තලම - අරුවක්කාලු කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ලක්ෂ්‍යවල මධ්‍ය මුහුදු මට්ටමේ උස ලබා දීම |
| 4 | පුබුදමු රජරට යටතේ කුරුණෑගල සිට හබරණ දක්වා දුම්රිය මාර්ගයේ භූ ලක්ෂණාත්මක මැනුම් |

**යථාතත්‍ය මට්ටම් ගැනීම (වයඹ පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කලාඔය - අනුරාධපුර දක්වා ප්‍රාථමික මට්ටම් රේඛාව |
| 2 | කුරුණෑගල සිට උඩුබද්දාව දක්වා ප්‍රාථමික මට්ටම් රේඛාව |
| 3 | කල්අඩි සිට කරුවලකුඩා දක්වා ප්‍රාථමික මට්ටම් රේඛාව |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් (දකුණු පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා පාලන ලක්ෂ්‍ය 9ක් පිහිටුවීම |
| 2 | 1:1 මිලියන (බිම් සවිය) මැනුම් යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 3 | භූමි පාලන ලක්ෂ පිහිටුවීම (ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක) |
| 4 | බලපිටිය - අම්බලන්ගොඩ - ගිංතොට වෙරළ සංරක්ෂණ මැනුම් ව්‍යාපෘතිය |

**යථාතත්‍ය මට්ටම් ගැනීම (දකුණු පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | දෙවුන්දර - මොරවක ප්‍රාථමික මට්ටම් රේඛාව |
| 2 | ගාල්ල - දෙවුන්දර මට්ටම් රේඛාව |
| 3 | පායිබොක්ක - පන්නෙගමුව මට්ටම් රේඛාව |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් (මධ්‍යම පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | බිම් සවිය මැනුම් යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 2 | කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 3 | මහාගෝනවැව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 4 | මාතලේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |
| 5 | ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය යටතේ කටුගස්තොට සිට අකුරණ දක්වා මට්ටම් ගැනීම |

**යථාතත්‍ය මට්ටම් ගැනීම (මධ්‍යම පළාත් භූමිතික අංශය )**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | කොඩුමඩුව සිට මහඔය දක්වා ප්‍රාථමික ගනයේ මට්ටම් රේඛාව |
| 2 | මාඩුගොඩ සිට ආදාළුල්පොත දක්වා ද්විතික ගනයේ මට්ටම් රේඛාව |
| 3 | අලවතුගොඩ සිට අරදකඩේ දක්වා ද්විතික ගනයේ මට්ටම් රේඛාව |
| 4 | මනම්පිටිය සිට තෝපාවැව, මහියංගනය දක්වා මට්ටම් ගැනීම |

**වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ මැනුම් (උතුරු පළාත් භූමිතික අංශය)**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | පදවිය හා වව්නියාව ඉංජිනේරු මැනුම් |
| 2 | මන්නාරම හා වව්නියාව වනාන්තර මැනුම් |
| 3 | වව්නියා කොටසේ මැනීම් සිදු කිරීම |
| 4 | කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ විදුලි නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ RTK මැනුම් |
| 5 | කන්තලේ වාරිමාර්ග ව්‍යාපෘතිය යටතේ පාලන ලක්ෂ්‍ය පිහිටුවීම |

**යථාතත්‍ය මට්ටම් ගැනීම (උතුරු පළාත් භූමිතික අංශය )**

| අනු අංකය | කාර්යය |
|---|---|
| 1 | යාපනය සිට කිලිනොච්චිය දක්වා මට්ටම් ගැනීම |
| 2 | කන්තලේ සිට සේරුනුවර දක්වා මට්ටම් ගැනීම (කන්තලේ වාරි මාර්ග ව්‍යාපෘතිය සඳහා) |
| 3 | අලුත්ඔය සිට ත්‍රිකුණාමලය දක්වා මට්ටම් ගැනීම |
| 4 | තඹලගමුව සිට පච්චිනෝරු දක්වා මට්ටම් ගැනීම |

## 5.2 සිතියම්කරණය

දෙපාර්තමේන්තුව තුළ මූලික කාර්යභාරයන් අතර සිතියම් සඳහා සුවිශේෂ තැනක් හිමිවේ. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් ලෙස භූ ලක්ෂණාත්මක සිතියම් නිර්මාණය ගැනෙන අතර, එමගින් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය දායකත්වය ලබා දේ. ඊට සමගාමීව විවිධ තේමා යටතේ සකසනු ලබන තේමා සිතියම්ද අධ්‍යාපන හා ඒ හා බැඳුනු වෙනත් කාර්යයන් සඳහා සුදුසු පරිදි යොදා ගැනීමට හැකි වන පරිදි විවිධ පරිමාණ ඔස්සේ නිර්මාණය කෙරේ. ශ්‍රී ලංකාව පිළිබඳ අංශ ගණනාවක් ඔස්සේ පිළියෙළ කරනු ලබන ''ජාතික සිතියම් සංග්‍රහයට'' හිමි වන්නේද වැදගත් තැනකි. එසේම අංකිත දත්ත නිකුත් කිරීම මුද්‍රිත සිතියම් සැකසීම හා පරිගණකාශ්‍රිත සිතියම් පාරිභෝගික අවශ්‍යතා අනුව සකස් කර දීමද සිදු කරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික සේවා අංශයෙන් සලසා ගත හැක.
දිස්ත්‍රික් කාර්යාල වෙතින් හා දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයෙන් සියලුම මුද්‍රිත සිතියම් මිලදී ගැනීමට අවශ්‍ය ඉඩකඩ සලසා ඇත.

**සිතියම් විකිණීමෙන් ලද ආදායම**

මෙම වසරේ මුද්‍රිත සිතියම්, අංකික සිතියම් හා අංකික දත්ත විකිණීමෙන් හා රාජ්‍ය භාගය ගෙවීම් මගින් පහත සඳහන් පරිදි ආදායම උපයාගෙන ඇත.

**මැනුම්පති කාර්යාලය**

මුද්‍රිත සිතියම් විකිණීම = රු. 4,996,946.00

පාරිභෝගික අවශ්‍යතා සඳහා විශේෂ සිතියම් විකිණීම = රු. 2,754,556.50

අංකික දත්ත ආදායම් = රු. 8,514,734.29

රාජ්‍ය භාග අයකරගැනීම් = රු. 52,940.00

**මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය සහ දිස්ත්‍රික් මැනුම් කාර්යාල**

මුද්‍රිත සිතියම් විකිණීම = රු. 2,391,929.00

2018 වසරේ සිතියම් අංකික සිතියම් හා අංකික දත්ත මුළු ආදායම = රු. 18, 711,105.79

2018 වසරේ පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී සිතියම් විකිණීමෙන් රු. 1,023,648.00 ක වාර්තාගත ආදායමක් ලබා ගැනීමට හැකි විය.

## 1. භූ ලක්ෂණාත්මක සිතියම් ඇඳීම් ඒකකය මගින් නිම කරන ලද කාර්යයන්

**1.1** 1:50,000 සිතියම් මාලාවේ දෙවන සංස්කරණය යටතේ සිතියම් 30ක් සකස්කර මුද්‍රණය සඳහා යවා ඇත. ඒවා නම්

| | | |
|---|---|---|
| 30- කලාඔය | 32-කවුඩුල්ල | 35-ගල්ගමුව |
| 42-දඹුල්ල | 47-කුරුණෑගල | 48-මාතලේ |
| 49-පල්ලේගම | 50-මහඔය | 53-කෑගල්ල |
| 54-මහනුවර | 55-මහියංගන | 56-පදියතලාව |
| 57සහ58-අම්පාර කල්මුනේ | 59-මීගමුව | 63-බිබිල |
| 64&65-තිරුක්කෝවිල් තාම්පිඩ්ඩි | 66-කොළඹ | 70-මොණරාගල |
| 71සහ72-පොතුවිල් කෝමාරි | 73-කළුතර | 77-බුත්තල |
| 78-පානම | 79-අලුත්ගම | 80-මතුගම |
| 81-රක්වාන | 82-තිඹොල්කැටිය | 83-කතරගම |
| 86-අම්බලන්ගොඩ | 87-මොරවක | 88-හම්බන්තොට |

1.2 පාරිභෝගික අවශ්‍යතා මත 1:10,000 සිතියම් 60ක් නිමකර නිකුත්කර ඇත .

## 2. තේමා සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

2.1 තේමා සිතියම් අංශය මගින් 2018 වසරේ නගර සිතියම් 04ක් හා දිස්ත්‍රික් සිතියම් 09ක් නිමකර ඇත.

2.2 පාරිභෝගික සිතියම් යටතේ ඌව පළාත් සංචාරක සිතියම මෙම අංශය මගින් නිමකර ඇත.

2.3 වනජීවී දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි මාදුරුඔය වනෝද්‍යාන සිතියම අවසන් අදියර දක්වා නිමකර ඇත.

2.4 ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ඉල්ලීම පරිදි කොළඹ හා අවට ප්‍රදේශ සහිත විශේෂ සංචාරක සිතියමක් පිළියෙළ කර ඇත.

## 3. භූ ලක්ෂණාත්මක සිතියම් සැකසුම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

3.1 1:10,000 පරිමාණයේ භූලක්ෂණාත්මක සිතියම් පත්‍ර 10ක් පුනරීක්ෂණයට ක්ෂේත්‍රයට යවා ඇති අතර සිතියම් පත්‍ර 74ක දත්ත පද්ධතිය යථාවත් කර ඇත.

3.2 1:10,000 පරිමාණයේ පාරිභෝගික සිතියම් 179ක් මෙම අංශය මගින් නිමකර ඇත. ඒවා නම් සංකේතාත්මක සිතියම් 33ක් හා රේඛාමය සිතියම් 146ක් වශයෙනි.


## 4. විශේෂ සිතියම් අංශය මගින් නිම කරන ලද කාර්යයන්

**4.1** පාරිභෝගික ඉල්ලීම මත සකස් කරනු ලබන සිතියම් විකිණීමෙන් සැලකිය යුතු ආදායමක් දෙපාර්තමේන්තුව උපයන අතර 2018 වසරේදී එම සිතියම් ප්‍රමාණය 620ක් පමණ වේ.

**2018** වසර තුළදී සිතියම් නිෂ්පාදනයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| සිතියම් වර්ගය | ඒකක | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|
| | | 2018 | | |
| | | වාර්ෂික ඉලක්කය | ලබාගත් ප්‍රගතිය | ඉලක්කයට අනුරූප ප්‍රතිශතය % |
| භූ ලක්ෂණාත්මක සිතියම් (ඇඳීම්) | සිතියම් ගණන | 86 | 90 | 104.70 |
| විශේෂ සිතියම් | සිතියම් ගණන | 560 | 620 | 110.70 |
| තේමා සිතියම් | සිතියම් ගණන | 69 | 50 | 77.50 |
| භූ ලක්ෂණාත්මක සිතියම් (සැකසුම්) | සිතියම් ගණන | 262 | 263 | 100.40 |

එක් එක් අංශවල ප්‍රගතියේ ප්‍රතිශතයන් පහත රූප සටහනේ දැක්වේ.



**සිතියම්කරණ අංශය මගින් සිදු කරන ලද විශේෂිත කාර්යයන්**

**1**. පිඹුරු වර්ණ මුද්‍රණ ඒකකය මගින් සිදුකරන කාර්යයන් වන Layout සෑදීම, EDM පොත් මුද්‍රණය කිරීම හා අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතා 2018 වර්ෂයට අදාළ සියල්ල නිමකර ඇත .

**2**. සිතියම් සැකසුම් අංශය මගින් කරන කාර්යයන් අතුරින් EDM පොත් බැඳීම් ප්‍රධාන කාර්යයක් වන අතර වැඩ තුණ්ඩු ප්‍රමාණය අනුව සියලු වැඩ නිමකර ඇත.

2018 වසරේ සිදුකළ විශේෂ කාර්යයන් අතරින් පහත සඳහන් පොත් හා ලෙජර බැඳීම් ඇතුලත් වේ .

| | | | |
|---|---|---|---|
| A-Z පොත් | - | 200 | |
| ක්ෂේත්‍ර පොත් | - | 7,595 | (ඊඩීඑම්, ක්ෂේත්‍ර පොත් ,මට්ටම් පොත් ) |
| නිත්‍ය නියෝග පොත් | - | 679 | (සිංහල,දෙමළ,ඉංග්‍රීසි) |
| පාසල් සිතියම් සංග්‍රහය (දෙමළ) පොත් | - | 1,524 | |
| මැනුම් සඟරාව | - | 1,075 | |
| වැටුප් ලෙජර හා වෙනත් පොත් | - | 566 | |
| පාසල් සිතියම් හා වෙනත් සිතියම් ඇළවීම් | - | 40 | |
| ෆයිල් කවර සැකසීම් | - | 250 | |

ලිතෝ අංශයේ මුද්‍රණ කටයුතු වලදී 129.3% ප්‍රගතියක් ලබාගෙන ඇති අතර එම අංශයේ පවතින මුද්‍රණ යන්ත්‍ර 4න් 3ක්ම ක්‍රියාකාරීත්වයේ පවතී. මීට අමතර වශයෙන් වසරේ අග භාගයේදී පෝරම මුද්‍රණය කිරීමේ පහසුව සඳහා Single Color Auto Print Knight මුද්‍රණ යන්ත්‍රයක් මෙම අංශය සඳහා මිලදීගෙන ඇත .





Single Color Auto Print Knight මුද්‍රණ යන්ත්‍රය

**මෙම වසරේදී පහත ප්‍රමාණවලින් සිතියම් හා පෝරම මුද්‍රණ කටයුතු සිදුකර ඇත.**

| | |
|---|---|
| 50K (2වන සංස්කරණය) සිතියම් මාලාව පත්‍ර | 40 |
| 50K සිතියම් නැවත මුද්‍රණය | 05 |
| 50K සිතියම් කොටස් (පාසල් සඳහා) | 03 |
| හමුදාව සඳහා ග්‍රිඩ් පත්‍ර | 10 |
| නගර සිතියම් | 20 |
| පාසල් සිතියම් මාලාවේ පත්‍ර<br>පාරිභෝගික සිතියම් හා තේමා සිතියම්<br>දිස්ත්‍රික් කාර්යාල අවශ්‍යතා සඳහා පත්‍ර | 48 |

## 6.0 භූගෝලීය නාම අංශය

**කාර්යභාරය**

ශ්‍රී ලාංකීය ජනතාවගේ සංස්කෘතික උරුමය හා බැඳුණු ජාතික සමගියට අනුබලයක් වන නිවැරැදි වූත්, නිශ්චිත වූත් භූගෝලීය නාම හා දත්ත පද්ධතියක් ප්‍රමිතිකරණය තුළින් හඳුන්වා දීම.

**කාර්යසාධනය**

භූගෝලීය නාම ප්‍රමිතීකරණය හා රෝමානුකරණ ක්‍රමවේදයක් සැකසීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති ජාතික මට්ටමේ කමිටුව 2018 වසර තුළදී රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.

අදාළ කමිටුව විසින් සකස් කර ඇති භූගෝලීය නාම ප්‍රමිතීකරණය කිරීමේ මූලධර්ම හා ප්‍රතිපත්ති ක්‍රියාපිළිවෙළට අනුව 2018 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

- යෝජිත රෝමානුකරණ ක්‍රමවේදය සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් භූගෝලීය නාමයන්ගේ අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීම සහ අක්ෂර පරිවර්තනය ද බාහිර භාෂා පරිවර්තක නිලධාරීන් මගින් භූගෝලීය නාම අක්ෂර පරිවර්තනය ද සිදු කර අවසන් කරන ලදී.
- ග්‍රාම නිලධාරි මගින් ලබා ගන්නා ක්ෂේත්‍ර තොරතුරු අනුව මාර්ග, ජල මාර්ග සහ ස්ථානීය නාමවල නිවැරදි කිරීම් හා අලුතින් ඇතුළත් කිරීම් භූගෝලීය නාම දත්ත පද්ධතිය (GIS දත්ත පද්ධතියට) ඇතුළත් කිරීම ග්‍රාම නිලධාරි කොට්ඨාස 8,275ක අවසන් කරන ලදි. මේ අනුව 2018 වර්ෂය අවසානයේ සියලුම ග්‍රාම නිලධාරී කොට්ඨාසවල (14,022) දත්ත පද්ධතිය සාදා නිම කරන ලදී.
- භූගෝලීය නාම වෙබ් අඩවියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331ක දත්ත ඇතුළත් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා මගින් මහජන අදහස් ලබාගෙන ඒ අනුව එම අදහස් සනාථ කිරීමෙන් පසු GIS දත්ත පද්ධතියට ඇතුළත් කර අවසන් කරන ලදී.
- 2019 වර්ෂයේ සිට දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සඳහා භූගෝලීය නාම නියාමන මණ්ඩලය ලෙස ස්ථාපිත නව මණ්ඩලයක් සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත.

## 7.0 ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය ශාඛාව

**කාර්යභාරය**

අවකාශීය දත්ත හා තොරතුරු පොදුවේ භාවිත කිරීම හා හුවමාරු කිරීම සඳහා විධිමත් ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම.

**කාර්යසාධනය**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන අතර ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය සහ ප්‍රතිපත්ති සැකසීමේදී අවශ්‍ය සහාය ලබා දීම සිදුකරනු ලබයි. ඒ අනුව 2018 වසර තුළ පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

**භූ ද්වාර-1 අදියර ස්ථාපනය කිරීම**

- භූ ද්වාර දත්ත ආකෘති ඇගයීම් කිරීම
- ශ්‍රී ලංකා NSDI feature Cataloge නිර්මාණය කිරීම
- කොටස්කාර ආයතනවල දත්ත සහිතව භූ ද්වාරය ආරම්භ කිරීම
- කොටස්කාර ආයතනවලින් (Stake holder) එකතු කරන ලද දත්ත උපයෝගී කරගෙන Use case application 5 ක් නිර්මාණය කිරීම
- ශ්‍රී ලංකා ජාතික අවකාශීය උපරි ව්‍යුහ (NSDI Web site) නිර්මාණය කිරීම

## 8.0 ලේඛන කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් අංශය

බොහෝ පැරණි පිඹුරු මෙම ශාඛාවේ සුරක්ෂිතව තබා ඇති අතර මහජනයා විසින් කරනු ලබන ඉල්ලීම් අනුව උධෘත සැපයේ. එමෙන්ම ක්ෂේත්‍රයේ සිදු කරන මැනුම් සඳහා පිළියෙළ කරන සියලු ව්‍යවස්ථාපිත පිඹුරුවල සහතික පිටපතක් මෙම ශාඛාවෙහි ගොනු කරන අතර පසුව කෙරෙන මැනුම්වලින් එම පිඹුරු යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. එසේම ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු අවසාන ගම් පිඹුරු සැකසීම ද මෙම අංශයෙන් සිදුකෙරේ. වෘත්තීය ප්‍රමිතීන්ට අදාළව ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව ලියාපදිංචි මිනින්දෝරුවන් සඳහා ප්‍රතීතන සහතික නිකුත් කිරීමද සිදු කරනු ඇත. 2018 වසර තුළදී මෙම ශාඛාවේ ප්‍රගතිය පහත පරිදි වේ.

**8.1 හිමිකම් පිඹුරු පිටපත් නිකුත් කිරීම**

| | |
|---|---|
| හිමිකම් පිඹුරු හා වෙනත් පිඹුරුවල නිකුත් කරන ලද පිටපත් ගණන | 2386 |

මෙම පිටපත් නිකුත් කිරීමෙන් රු. **1,906,860.00** ක මුදලක් උපයා ඇත.

**8.2 දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් නිකුත් කරන ලද පිඹුරු අනුරේඛන හා රේඛා චිත්‍ර**

| | |
|---|---|
| නිකුත් කරන ලද නිරවුල් රේඛා චිත්‍ර ගණන (S) | 717 |
| නිකුත් කරන ලද රේඛා චිත්‍ර ගණන (O සහ V) | 810 |
| බදු රේඛා චිත්‍ර ගණන (L රේඛා චිත්‍ර) | 344 |
| මහජනයාට නිකුත් කරන අනුරේඛන ගණන | 5,573 |
| මහජනයාට නිකුත් කළ සත්‍ය ඡායා පිටපත් ගණන | 33,250 |
| ඉ.සං.ආ. පනත යටතේ නිකුත් කර ඇති රේඛා චිත්‍ර ගණන | 25,999 |

**8.3 උසාවි කොමිෂන් මැනුම්**

| | |
|---|---|
| පසුගිය වසරෙන් ඉදිරියට ගෙන ආ උසාවි කොමිෂන් සංඛ්‍යාව | 519 |
| වසර තුළ ලැබුන උසාවි කොමිෂන් සංඛ්‍යාව | 367 |
| වැඩ නිමකර උසාවිවලට යැවූ සංඛ්‍යාව | 422 |
| වසර අගදී ඉතිරි සංඛ්‍යාව | 464 |

**8.4 ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ අවසාන ගම් පිඹුරු සහ අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සැකසීම**

| | |
|---|---|
| පසුගිය වසර අවසානයට ඉතිරිය | 04 |
| 2018 වසර තුළදී ලැබුනු ප්‍රමාණය | 21 |
| 2018 දී සකසා නිකුත් කරන ලද අවසාන ගම් පිඹුරු හා අවසාන භූලක්ෂණාත්මක පිඹුරු සංඛ්‍යාව | 18 |
| 2018 වසර අවසානයට ඉතිරිය | 07 |

**8.5 පැරණි ලේඛන අලුතින් පිළියෙළ කරන ලද පිඹුරු අනුව යාවත්කාලීන කිරීම**

| | |
|---|---|
| පසුගිය වසර අවසානයේ යාවත්කාලීන කිරීමට ඉතිරි පිඹුරු ගණන | 606 |
| 2018 වසර තුළදී ලැබුණු ප්‍රමාණය | 8,652 |
| 2018 දී යාවත්කාලීන කරන ලද පැරණි මූලික පිඹුරු ගණන | 1,268 |
| අවසාන ගම් පිඹුරු හා අවසාන භූ ලක්ෂණාත්මක පිඹුරු සංඛ්‍යාව | 2,595 |
| භූ ලක්ෂණාත්මක මූලික පිඹුරු හා ගම් පිඹුරු සංඛ්‍යාව | 274 |
| කැඩැස්තර සිතියම් ගණන | 4,011 |
| වසර අවසානයේ ඉතිරි පිඹුරු ප්‍රමාණය | 1,110 |

**8.6 පැරණි පිඹුරු සංරක්ෂණය**

පැරණි පිඹුරු සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ එම පිඹුරු පරිලෝකනය කර සංගත තැටි ලෙස ගබඩා කිරීම 2004 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඉන්පසු එම අංකිත දත්ත පිඹුරු/ලේඛන කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

ඒ අනුව ප්‍රගතිය පහත සඳහන් වේ.

| පරිලෝකන කිරීමට ඇති පිඹුරු පත්‍ර ප්‍රමාණය | 2018 ට පෙර නිම කළ පිඹුරු පත්‍ර ප්‍රමාණය | 2018 වසරේ නිමකළ පිඹුරු පත්‍ර ප්‍රමාණය | ඉතිරිය |
|---|---|---|---|
| 1,652,000 | 1,352,000 | 280,000 | 20,000 |

**8.7 මැනුම් සඳහා අවශ්‍ය විස්තර සැපයීම ( L 96 )** **12,335 කැබලි**

**8.8 ප්‍රතීතන සහතික නිකුත් කිරීම**

1998 හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කඩඉම් මැනුම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන ලියාපදිංචි මිනින්දෝරුවන් සඳහා කඩඉම් මැනුම්කරණය කරගෙන යාම පිළිබඳ ඒ ඒ මිනින්දෝරුවරයාගේ නිපුණතාවය සම්බන්ධයෙන් ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබේ.

| | |
|---|---|
| 2018.12.31 ට ලියාපදිංචි මිනින්දෝරුවරුන් සංඛ්‍යාව | 2165 |
| 2017.12.31 දිනට ප්‍රතීතන සහතික ලබාගෙන ඇති ප්‍රමාණය | 1639 |
| 2018 දී ලබාගෙන ඇති ප්‍රමාණය | 23 |
| 2018.12.31 දිනට ප්‍රතීතන සහතික ලබාගෙන ඇති මුළු ප්‍රමාණය | 1662 |

## 9.0 භූ විඥාපන අංශය

## 9.1 ගුවන් මැනුම් අංශය (ඡායා රේඛනමිතික අංශය සහ ඡායාරූප රසායනාගාරය)

**කාර්යභාරය**

සිතියම්කරණය සහ සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය වන දත්ත ගුවන් ඡායාරූප භාවිත කර උකහා ගැනීම සහ LiDAR ව්‍යාපෘති ප්‍රදේශයේ 10k LiDAR දත්ත ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම

2018 වසර සඳහා මෙම අංශයේ ප්‍රගතිය පහත දක්වා ඇත.

| වර්ගය | **ප්‍රගතිය** |
|---|---|
| 1. LiDAR Point Cloud සැකසීම මගින් DEM, සමෝච්ච රේඛා සහ අර්ධ ඕතෝ ඡායාරූප සකස් කිරීම | 2608.6 වර්ග කි.මී. (719 million DEM Points) |
| 2. 1:10,000 භූ ලක්ෂණාත්මක සිතියම් යාවත්කාලීන කිරීම සඳහා 2D දත්ත උකහා ගැනීම | 1840.0 වර්ග කි.මී. |
| 3. ගුවන් ඡායාරූප නැවත මුද්‍රණය කිරීම (ඉල්ලීම් මත) | ඡායාරූප /පත්‍ර 369 |
| 4. ගුවන්යානා මං දර්ශක සිතියමේ අංකික පරිවර්තනය | පත්‍ර 294 |

## 9.2 දුරස්ථ ග්‍රහණ අංශය

**කාර්යභාරය**

චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි 1:50,000 භූලක්ෂණාත්මත ආංකිත දත්ත පද්ධතියක් (නව සංස්කරණය) සකසා යථාවත් කිරීම , 1:50,000 සිතියම් මාලාව සඳහා අංකික දත්ත සැපයීම සහ වෙනත් ආයතනවල අවශ්‍යතාවයන් අනුව චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය කර සඳහා අංකික දත්ත සැපයීම

**කාර්ය සාධනය**

1. අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර, 1:50,000 සිතියම් ශ්‍රේණිය සඳහා පත්‍ර 27ක කටයුතු මෙම වර්ෂය තුළදී නිම කර ඇත. මේ අනුව පත්‍ර 92 හිම කටයුතු නිම වී ඇත.
2. අධි විභේදනයක් සහිත චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර, 1:50,000 දත්ත පද්ධතියේ පත්‍ර 20ක දත්ත යාවත්කාලීන කර ඇත.

## 9.3 භූගෝලීය තොරතුරු පද්ධති අංශය

1) 2018 වසරේදී භූගෝලීය තොරතුරු පද්ධති අංශය මගින් ක්ෂේත්‍ර පුනරීක්ෂණයට යටත්ව කෑගල්ල දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන්ද, කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල මුහුදු කලාපය ද, ගම්පහ දිස්ත්‍රික් උතුරු මායිමද ආවරණය වන පරිදි වර්ග කි.මී.2840ක ප්‍රදේශයක ද, ක්ෂේත්‍ර විමර්ශනයෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව අනුරාධපුර, පුත්තලම, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වර්ග කි.මී.2800ක ප්‍රදේශයකද 1:10 000 පරිමාණයේ ආංකික භූ ලක්ෂණාත්මක දත්ත සැකසීම (යාවත්කාලීන කිරීම) සිදුකොට ඇත.
2) කොළඹ, කුරුණෑගල, නුවර, මාතර සහ යාපනය යන දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී වසම් 6200 සඳහා සිතියම් සැකසීම.
3) ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, පොලිස් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ තවත් විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව එම අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි දත්ත සකසා දීම.
4) අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමට හැකිවන ලෙස මුදා හැර ඇති ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී කොට්ඨාස සිතියම වැඩි දියුණු කිරීම.

## 10.0 ඉඩම් තොරතුරු පද්ධති අංශය

මහජන අවශ්‍යතා සඳහා ඉඩම් තොරතුරු ලබාදිය හැකි යාවත්කාලීන වූ ඉඩම් තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම මෙම අංශයේ කාර්යභාරය වේ.

මෙම අංශයේ 2018 වසර සඳහා ප්‍රගතිය පහත දැක්වේ.

| ප්‍රගතිය | කඩඉම් මැනුම් | | විකීර්ණ මැනුම් | | බිම් කැබලි වියමන | | වතු සහ කැලෑ මැනුම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | කැබලි | පත්‍ර | කැබලි | පත්‍ර | කැබලි | පත්‍ර | කැබලි | පත්‍ර |
| 2017 දක්වා | 1,076,568 | 7,296 | 126,379 | 6,506 | 47,363 | 16,046 | 16,046 | 7,064 |
| 2018 | 192,043 | 2,968 | 57,070 | 2,884 | 27,820 | 8,347 | - | - |
| 2018.12.31 | 1,268,611 | 10,264 | 183,449 | 9,390 | 75,183 | 24,393 | 16,046 | 7,064 |

- ඉඩම් තොරතුරු දත්ත පද්ධතිය සඳහා අංකිත දත්ත සැපයීම, සැකසීම පිළිබඳව දිස්ත්‍රික්ක 25 හි තාක්ෂණික නිලධාරීන් සඳහා සහ රජයේ මිනින්දෝරුවන්, මිනින්දෝරු අධිකාරිවරුන් සඳහා වැඩමුළු පැවැත්වීම.
- රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයෙන් නිකුත් කරනු ලබන හිමිකම් සහතිකයේ මුද්‍රණය කර ගැනීමට අවශ්‍ය වන කැඩැස්තර පිඹුර, කැඩැස්තර සිතියමෙන් උපුටා ගැනීම සඳහා වූ අන්තර්ජාලය ආශ්‍රිත විද්‍යුත් ක්‍රමවේදයක් පිළියෙළ කර ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයෙන් එවනු ලබන පිඹුරු ආශ්‍රිත දත්ත, ඉඩම් තොරතුරු දත්ත පද්ධති අංශය තුළ නැවත සකස් කිරීමෙන් පසු එම දත්ත නැවත ක්ෂේත්‍ර කාර්යාල සඳහා ලබා ගැනීම සඳහා වූ අන්තර්ජාල ආශ්‍රිත විද්‍යුත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තු තොරතුරු ඉඩම් තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීමට ක්‍රමවේදයක් සැකසීම හා ඒ තුළින් එම දත්ත ඇතුලත් කිරීම.

## 11.0 දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය

මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මෙම දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු ආයතනය ලෙස ක්‍රියාත්මක වෙමින් 2018 වසර සඳහා සිය කාර්ය ඉලක්කයන් ඉටු කර ඇත. මැනුම් හා සිතියම්කරණය පිළිබඳ ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් හා අත්දැකීමක් ලබා දීමෙන් ශිෂ්‍යයන්ට ඔවුන්ගේ පූර්ණ අධ්‍යයන හැකියාව සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් සිය වාර්ෂික මෙහෙවර ක්‍රියාත්මක කර ඇත. පැරණි හා නවීන ඉඩම් මැනුම් තාක්ෂණ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික පුහුණුව සඳහා පහසුකම් ඇති ඒ සඳහා කැපවී සිටින රජය සතු එකම ආයතනය මෙය වේ.

එමෙන්ම, ආයතනය විසින් මැනුම් විද්‍යාව සඳහා උපාධි පාඨමාලා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා, දෙපාර්තමේන්තුවේ සිතියම් තාක්ෂණ නිලධාරීන්/ඡායාරේඛනමිතික තාක්ෂණ නිලධාරීන්/ ගුවන් ඡායාරූප තාක්ෂණ නිලධාරීන්/ දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරීන් සඳහා ඩිප්ලෝමා පාඨමාලා (උසස් පෙළ) මෙහෙයවීම සිදු කරයි. අනෙක් රජයේ සහ අර්ධ-රාජ්‍ය සංවිධානවල ඉල්ලීම් පරිදි තාක්ෂණික කාර්ය මණ්ඩල සඳහා මැනුම් හා සම්බන්ධ වෙනත් ව්‍යවහාරික පාඨමාලා හැර දේශීය විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල විද්‍යායතනවල සිවිල් ඉංජිනේරු සිසුන් සඳහා මැනුම් කඳවුරු නමින් හැඳින්වෙන ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ද ආයතනය මගින් මෙහෙයවනු ලැබේ.

ආයතනය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පුහුණු)/අධ්‍යක්ෂක (මැ.සි.ආ) යටතේ ක්‍රියාත්මක වන අතර සියලු අධ්‍යයන කටයුතු අධ්‍යයන අංශයේ ප්‍රධානී වන නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (අධ්‍යයන) විසින් පරිපාලනය කෙරේ.
එමෙන් ම, එමගින් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාගෙන් රටට වඩා හොඳ සේවාවන් සැපයීම සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ දැනුම වැඩි දියුණු කිරීමට වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ද අඛණ්ඩව වාර්ෂිකව මෙහෙයවනු ලැබේ.

## 11.1 ආයතනය වසර තුළ පවත්වන ලද පාඨමාලා

### 11.1.1 වසර තුළ පවත්වන ලද නිශ්චිත පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | කාලය | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය/අවසන් කිරීමට නියමිත දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | මැනුම් විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව (නේවාසික- BDC/15) | වසර 4 (අධ්‍යයන) | 2018-01-08 | 2022-01-08 | 14 |
| 2. | දිශානුගත කිරීමේ පාඨමාලාව (OC/10) | මාස 6 (අධ්‍යයන) | 2018-01-08 | 2018-07-13 | 35 |

### 11.1.2 මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා වසර තුළ පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | දින ගණන | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 | සිගාස් පුහුණු වැඩසටහන | 2 | 2018-01-12/13 |
| 2 | සිගාස් පුහුණු වැඩසටහන | 2 | 2018-08-10/11 |
| 3 | ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩ සටහන (Arc GIS & QGIS) (පළමු කණ්ඩායම) | 3 | 2018-08-27/29 |
| 4 | ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩ සටහන (Arc GIS & QGIS) (දෙවන කණ්ඩායම) | 3 | 2018-09-12/14 |
| 5 | ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (Arc GIS & QGIS) (තෙවන කණ්ඩායම) | 3 | 2018-10-10/12 |
| 6 | සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (පළමු කණ්ඩායම) | 3 | 2018-11-12/14 |
| 7 | සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (දෙවන කණ්ඩායම) | 3 | 2018-12-10/12 |
| 8 | රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (Cloud Data base -පළමු කණ්ඩායම) | 1 | 2018-12-18 |
| 9 | රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (Cloud Data base -දෙවන කණ්ඩායම) | 1 | 2018-12-19 |
| 10 | රජයේ මිනින්දෝරුවරුන් සඳහා පැවැත්වූ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන (Cloud Data base -තෙවන කණ්ඩායම) | 1 | 2018-12-20 |

## 11.1.3 වෙනත් ආයතන සඳහා වසර තුළ පැවැත් වූ කෙටි කාලීන පාඨමාලා

| අනු අංකය | පාඨමාලාවේ නම | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | පැවැත්වූ දිනය | ආයතනය |
|---|---|---|---|---|---|
| 1 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 28 | 2018.01.05 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 2 | මැනුම් පුහුණු කඳවුර | 5 | 58 | 2018.01.08-2018.01.13 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක |
| 3 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 34 | 2018.01.10 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 4 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 17 | 2018.01.11 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 5 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 11 | 2018.01.12 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව-දියතලාව |
| 6 | මැනුම් පුහුණු කඳවුර | 5 | 57 | 2018.01.22-2018.01.27 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක |
| 7 | පුහුණු වැඩමුළුව | 2 | 25 | 2018.02.15-2018.02.16 | දිසා වන කාර්යලය-නුවරඑළිය |
| 8 | පුහුණු වැඩමුළුව | 3 | 60 | 2018.02.21-2018.02.23 | මධ්‍යම සංස්කෘතික අරමුදල-මොණරාගල |
| 9 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 100 | 2018.03.06 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව-දියතලාව |
| 10 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 35 | 2018.03.07 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 11 | පුහුණු වැඩමුළුව | 4 | 41 | 2018.03.13-2018.03.16 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව-උතුරු මැද පලාත |
| 12 | පුහුණු වැඩමුළුව | 4 | 24 | 2018.03.26-2018.03.29 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-බදුල්ල |
| 13 | මැනුම් පුහුණු කඳවුර | 6 | 47 | 2018.04.23-2018.04.28 | උසස් තාක්ෂණ ආයතනය-ගාල්ල |
| 14 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 59 | 2018.05.08 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය-කොළඹ |
| 15 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 33 | 2018.05.09 | ශ්‍රී ලංකා කාලතුවක්කු කඳවුර-මින්නේරිය |
| 16 | මැනුම් පුහුණු කඳවුර | 6 | 47 | 2018.05.14-2018.05.19 | උසස් තාක්ෂණ ආයතනය-ගාල්ල |
| 17 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 96 | 2018.05.25 | සබරගමුව විශ්ව විද්‍යාලය |
| 18 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 30 | 2018.06.12 | සැහවුන වෙඩික්කරු පුහුණු පාසල-දියතලාව |
| 19 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 30 | 2018.06.13 | සැහවුන වෙඩික්කරු පුහුණු පාසල-දියතලාව |
| 20 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 60 | 2018.06.14 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය-කොළඹ |
| 21 | පුහුණු වැඩමුළුව | 5 | 25 | 2018.06.18 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව- වයඹ පලාත |
| 22 | පුහුණු වැඩමුළුව | 4 | 18 | 2018.07.10-2018.07.13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-පොළොන්නරුව |
| 23 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 15 | 2018.07.20 | ධර්මපාල මහා විද්‍යාලය බණ්ඩාරවෙල |
| 24 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 18 | 2018.07.23 | දියතලාව මහා විද්‍යාලය-දියතලාව |
| 25 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 14 | 2018.07.23 | ජනානන්ද විද්‍යාලය-දියතලාව |
| 26 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 86 | 2018.07.30 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල-උවා කුඩා ඔය |
| 27 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 16 | 2018.07.31 | සර් ජෝන් කොතලාවල ආරක්ෂක පුහුණු පාසල-සූරියවැව |
| 28 | මැනුම් පුහුණු කඳවුර | 3 | 50 | 2018.01.22-2018.08.03 | තාක්ෂණ විද්‍යාලය-බලපිටිය |
| 29 | මැනුම් පුහුණු කඳවුර | 5 | 64 | 2018.08.06-2018.08.10 | උසස් තාක්ෂණ ආයතනය-ගාල්ල |
| 30 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 115 | 2018.08.31 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව-දියතලාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 31 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 75 | 2018.09.04 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව-දියතලාව |
| 32 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 36 | 2018.09.07 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 33 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 54 | 2018.09.14 | ස්වේච්ඡා බල සේනා පුහුණු පාසල-දියතලාව(ශ්‍රී ලංකා යුධ හමුදාව) |
| 34 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 127 | 2018.09.17 | ශ්‍රී ලංකා යුධ හමුදාව-දියතලාව |
| 35 | පුහුණු වැඩසටහන | 3 | 57 | 2018.09.25-2019.09.27 | ඉඩම් කොමසාරිස ජනරාල් දෙපාර්තමේන්තුව |
| 36 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 64 | 2018.09.28 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල-උවව කුඩා ඔය |
| 37 | මැනුම් ක්ෂේත්‍ර සහයක පුහුණු වැඩසටහන-2018 (NVQ Level 2/3/4) - Group 1 | මාස 3 කි | 91 | 2018.08.27-2018.11.23 | වෘත්තීය පුහුණු අධිකාරිය(මැනුම් ක්ෂේත්‍ර සහයක) |
| 38 | මැනුම් ක්ෂේත්‍ර සහයක පුහුණු වැඩසටහන-2018 (NVQ Level 2/3/4) - Group 2 | මාස 3 කි | 94 | 2018.09.25-2018.12.19 | වෘත්තීය පුහුණු අධිකාරිය(මැනුම් ක්ෂේත්‍ර සහයක) |
| 39 | මැනුම් ක්ෂේත්‍ර සහයක පුහුණු වැඩසටහන-2018 (NVQ Level 2/3/4) - Group3 | මාස 3 කි | 48 | 2018.10.29-2018.01.23 | වෘත්තීය පුහුණු අධිකාරිය(මැනුම් ක්ෂේත්‍ර සහයක) |
| 40 | මැනුම් පුහුණු කඳවුර | 5 | 58 | 2018.10.02-2018.10.06 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක |
| 41 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 30 | 2018.10.11 | තාක්ෂණ විද්‍යාලය-බෙලිඅත්ත |
| 42 | මැනුම් පුහුණු කඳවුර | 5 | 57 | 2018.10.15-2018.10.19 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක |
| 43 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 40 | 2018.10.15 | ශ්‍රී ලංකා නාවික හමුදාව-ත්‍රිකුණාමලය |
| 44 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 64 | 2018.10.15 | ශ්‍රී ලංකා නාවික හමුදාව-පූණාව |
| 45 | පුහුණු වැඩමුළුව | 2 | 30 | 2018.10.22-2018.10.23 | දිසා වන කාර්යලය-රත්නපුර |
| 46 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 85 | 2018.10.23 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව-සබරගමුව |
| 47 | මැනුම් පුහුණු කඳවුර | 5 | 57 | 2018.10.29-2018.11.02 | ඉංජිනේරු තාක්ෂණ ආයතනය-කටුනායක |
| 48 | පුහුණු වැඩමුළුව | 1 | 52 | 2018.11.05 | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව- වයඹ පලාත |
| 49 | පුහුණු වැඩසටහන | 3 | 50 | 2018.11.07-2018.11.09 | ඉඩම් කොමසාරිස ජනරාල් දෙපාර්තමේන්තුව |
| 50 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 31 | 2018.11.12 | ශ්‍රී ලංකා කාලතුවක්කු කඳවුර-මින්නේරිය |
| 51 | මැනුම් පුහුණු කඳවුර | 5 | 26 | 2018.12.03-2018.12.07 | විශ්ව විද්‍යාල විද්‍යායතනය-බටංගල |
| 52 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 50 | 2018.12.07 | ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය-කොළඹ |
| 53 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 30 | 2018.12.11 | රුහුණු විශ්ව විද්‍යාලය |
| 54 | එක් දින පුහුණු වැඩමුළුව | 1 | 63 | 2018.12.18 | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල-උවව කුඩා ඔය |

## 12.0 විභාග අංශය

සියලුම දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාග, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අදාළ කාර්යක්ෂමතා විභාග පැවැත්වීම මෙම අංශයෙන් ඉටු කරනු ලැබේ.

| අනු අංකය | විභාගය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම් ලත් අයදුම්පත් සංඛ්‍යාව | විභාගය පැවැත්වූ /නියමිත වූ දිනයන් | පෙනී සිටි සංඛ්‍යාව | අයදුම්පත් කැඳවන අවසාන දිනය | ප්‍රතිඵල නිකුත් කළ දිනය | සමත් වූ සංඛ්‍යාව | ඒක සාමාර්ථ ලැබූ සංඛ්‍යාව | වියදම් වූ සම්පූර්ණ මුදල (රුපියල්) | එක් අපේක්ෂකයෙක් සඳහා වැය වූ මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු කම්කරු) | 43 | 04 | 2018/03/19-23 | 04 | 2018/01/31 | 2018/04 /24 | 04 | 00 | - | - |
| 2 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (රිය සහායක) | 01 | 01 | 2018/03/19-23 | 01 | 2018/01/31 | 2018/04 / 24 | 01 | 00 | - | - |
| 3 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (පිඹුරු අලුත්වැඩියාකරු) | 02 | 02 | 2018/04/23-24 | 02 | 2018/03/16 | 2018/05 / 28 | 02 | 00 | 1800.00 | 900.00 |
| 4 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (දිස්ත්‍රික් මට්ටමින්) | 178 | 178 | 2018/05/07-11 | 177 | 2018/02/28 | 2018/07 / 09 | 176 | 00 | - | - |
| 5 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | 29 | 29 | 2018/05/12 | 24 | | 2018/08 / 14 | 14 | 00 | 4770.00 | 199.00 |
| 6 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (දිස්ත්‍රික් මට්ටමින්) | 29 | 29 | 2018/05/14-18 | 27 | | 2018/08 / 14 | 22 | 00 | - | - |
| 7 | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය (නීති නිලධාරි තනතුර) SL-01-2006 සඳහා වන පළමු කාර්යක්ෂමතා විභාගය - 2018 | 01 | 01 | 2018/05/25 | 01 | 2018/04/ 12 | 2018/08 / 14 | 01 | 00 | 5445.00 | 5445.00 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් II පන්තියේ “ආ” ඛණ්ඩයේ සිට II පන්තියේ “අ” ඛණ්ඩයට උසස් කිරීමේ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය (ලිතෝ තාක්ෂණ නිලධාරීන් සඳහා) | 01 | 01 | 2018/06/16-17 | 01 | 2018/03/ 30 | 2019/01 /07 | 01 | 00 | 12870.00 | 12870.00 |
| 9 | බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - I කොටස (2018 මාර්තු ගැසට් පත්‍රය) | 196 | 93 | 2018/07/21 | 66 | 2018/05/ 25 | 2018/09 /18 | 08 | 00 | 46565.79 | 706.00 |
| 10 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් II පන්තියේ “ආ” ඛණ්ඩයේ සිට II පන්තියේ “අ” ඛණ්ඩයට උසස් කිරීමේ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය (සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා) | 13 | 01 | 2018/05/17-18 | 01 | 2018/03 /30 | 2018/06 /05 | 01 | 00 | 4385.00 | 4385.00 |
| 11 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 148 | 118 | 2018/09/15 | 104 | 2018/05/ 18 | 2019/01 /23 | 27 | 43 | - | - |
| 12 | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | 186 | 163 | 2018/12/27 | - | 2018/10/ 09 | විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිත ව ඇත | - | - | - | - |
| 13 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (දෙපාර්තමේන්තු කම්කරු) | 39 | 03 | 2018/09/17-21 | 03 | 2018/07 /31 | 2018/11 / 28 | 03 | 00 | - | - |
| 14 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (රිය සහයක) | 02 | 01 | 2018/09/17-28 | 01 | 2018/07/ 31 | 2018/11 /28 | 01 | 00 | - | - |
| 15 | බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගය - II කොටස (2018 මාර්තු ගැසට් පත්‍රය) | 66 | 08 | 2018/10/13-14 | 06 | # | විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිත ව ඇත | - | - | - | - |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (සිතියම් සවිකරන්නා හා පොත් බඳින්නා) | 03 | 03 | 2018/10/25-26 | 03 | 2018/08/ 31 | 2018/11 / 28 | 01 | 00 | 6220.00 | 2073.00 |
| 17 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය (දිස්ත්‍රික් මට්ටමින්) | 108 | 108 | 2018/11/05-09 | 105 | 2018/08/ 31 | 2018/12 / 21 | 100 | 00 | - | - |
| 18 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන දෙවන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | 23 | 23 | 2018/11/17 | 19 | 2018/08/ 31 | 2018/12 /21 | 16 | 00 | 4380.00 | 231.00 |
| 19 | මැනුම් ක්‍ෂෙත්‍ර සහායක සේවයේ නිලධාරීන් සඳහා පවත්වනු ලබන තුන්වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය(දිස්ත්‍රික් මට්ටමින්) | 17 | 17 | 2018/11/12-16 | 17 | 2018/08 /31 | 2018/12 /21 | 15 | 00 | - | - |
| 20 | ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබූ සබරගමුව විශ්ව විද්‍යාලයීය මැනුම් විද්‍යා උපාධිධාරීන්ගේ ජෛයෂ්ඨත්වය තීරණය කිරීම සඳහා වූ බුද්ධි පරීක්ෂණය | 141 | 141 | 2018/03/24 | 138 | 2017/12/ 29 | 2018.12 . 26 | 138 | 00 | 28911.80 | 210.00 |
| 21 | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට මැනුම් ක්‍ෂෙත්‍ර සහායකවරුන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරඟ විභාගය | 1037 | 454 | 2018/07/30 | 452 | 2018/06/ 29 | 2018/08 / 08 | 256 | 00 | 60862.52 | 135.00 |
| 22 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිතියම් තාක්ෂණ නිලධාරි තනතුර සඳහා (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ සීමිත/විවෘත තරඟ විභාගය - 2018 | 428 | 290 | 2018/11/10 | 217 | 2018/09/ 10 | 2018/12 /19 | 80 | 00 | 42439.42 | 196.00 |
| 23 | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) කාර්මික හා පරිපාලන නිලධාරි තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීමේ විභාගය - 2018 | 47 | 47 | 2018/11/24 | 33 | 2018/06/ 22 | 2018/12 / 10 | 15 | 00 | 17429.66 | 528.00 |

\# බලයලත් සැලසුම් ශිල්පීන් ලෙස සර්වේයර් ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීමේ විභාගයේ I කොටස සමත් වූ අපේක්ෂකයින්

## 13.0 පර්යේෂණ හා සංවර්ධන අංශය

දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය කෙරෙහි බලපාන දුර්වල ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඒවා යථාවත් කර ගැනීම සඳහා අදාළ යෝජනා ඉදිරිපත් කිරීම, දෙපාර්තමේන්තුවේ මැනුම් හා සිතියම්කරණය සඳහා අවශ්‍ය වන නව ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ ඒවා දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා හඳුන්වා දීම, නව තාක්ෂණික ක්‍රමවේදයන් පර්යේෂණ තුළින් හඳුන්වා දීම, නව තාක්ෂණය හැසිරවීම සඳහා නිලධාරින් පුහුණු කිරීම, දෙපාර්තමේන්තු සිතියම් පිඹුරු යනාදියේ තත්ත්ව පිරිවිතරයන් ආරක්ෂා කිරීම, දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි හා නිත්‍ය නියෝග නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම යනාදිය මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි.

ඉහත සඳහන් අවශ්‍යතාවයන් පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් මෙම අංශය මගින් 2018 වර්ෂයේදී සිදු කර ඇත.

1. නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීමට දෙපාර්තමේන්තු මැනුම් රෙගුලාසි 5 වන සංස්කරණයේ සිංහල පිටපතේ අදාළ යාවත්කාලීන කිරීම් අවසන් කිරීම හා ඉංග්‍රීසි පරිවර්තනය සඳහා අවශ්‍ය මූලික කටයුතු ද ආරම්භ කිරීම.
2. 84 වන මැනුම් සඟරාව අගෝස්තු මස ප්‍රකාශයට පත්කිරීම.
3. රජයේ මිනින්දෝරුවරුන්ට සහ බලයලත් මිනින්දෝරුවරුන්ට SDCAD මෘදුකාංගය භාවිතා කිරීමේ අවකාශ සැලසීම.
4. ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 51 කින් වසම් 11 ක සම්පූර්ණ දත්ත ඇතුලත් වන පරිදි ග්‍රාම නිලධාරි සිතියමක් පිළියෙළ කර රජයේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබාදීමේ කඩිනම් කිරීමේ වැඩසටහන සඳහා ප්‍රවේශයක් ලබාදීමට කටයුතු කිරීම.
5. එම රජයේ ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබාදීමේ කඩිනම් කිරීමේ වැඩසටහන පිළියෙළ කිරීම හා ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම
6. ඉහත වැඩ සටහන කඩිනම් කර ක්‍රියාත්මක කිරීමේ අනෙකුත් සම්පත් සැපයීමේ මූලික අවශ්‍යතාවයන් සැකසීම සඳහා දායක වීම.
7. "INVESTERS GUIDE" දත්ත Portal හි වෙරළ සංරක්ෂණ මායිම් පරිගණක ගත කිරීම.
8. දෙපාර්තමේන්තුවේ සියලුම මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ දත්ත එක්රැස් කර භාවිතය (Usage) පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කිරීම.
9. පැරණි පිඹුරු අංකිකකරණය සඳහා නියමු ව්‍යාපෘතිය ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පැරණි පිඹුරු දත්ත පරීක්ෂාව, අධීක්ෂණය මගින් ක්‍රමවේදයේ දුර්වලතා හඳුනාගැනීම.
10. දිවයිනම ආවරණය කිරීමට අවශ්‍ය LiDAR දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතියේ සහ චන්ද්‍රිකා ඡායාරූප සන්තතිකව සපයා ගැනීම සඳහා වූ ව්‍යාපෘතියේ යෝජනා අනුමැතියට අදාළ කැබිනට් පත්‍රිකා කෙටුම්පත් කිරීම.
11. වාර්ෂිකව මිලදී ගනු ලබන භාණ්ඩ කීපයක් සඳහා අදාළ පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුවල කටයුතු කිරීම සහ අදාළ වාර්තා සකස් කිරීම.
12. දෙපාර්තමේන්තු තාක්ෂණික පුස්තකාලය විධිමත්ව සකස් කිරීම.
13. 2018 අගෝස්තු මස 'V-2025 Enterprise Sri Lanka' ප්‍රදර්ශනය මොනරාගලදීද, 2018 නොවැම්බර් මස 'National ICT Exhibition-INFOTEL-2018' ප්‍රදර්ශනය BMICH හිදී ද පැවැත්වීමට හා කෑ/දෙහිඕවිට ජාතික පාසලේ 70 වැනි සංවත්සරයට සමගාමීව පැවැති ප්‍රදර්ශනයට, කළුතර/කටුකුරුන්ද මහා විද්‍යාලයීය තාක්ෂණික අධ්‍යාපන ප්‍රදර්ශනයට දෙපාර්තමේන්තුව වෙනුවෙන් කටයුතු සැලසුම් කිරීම.
14. ක්ෂේත්‍ර නිලධාරින් පිළියෙළ කරනු ලබන පිඹුරුවල අංකික දත්ත ඉඩම් තොරතුරු පද්ධති අංශයට යෝග්‍ය වන පරිදි සකසා ඇතිදැයි තත්ව පරීක්ෂාව සහ එම අංකික දත්තවල වර්ගඵලයන් ඉඩම් විස්තර ලැයිස්තුව සමග නිවැරදිතාව 'QGIS' (Open Source) භාවිතයෙන් සැසඳීම සඳහා ආධාන මෙවලම් (Tools) සැකසීම සහ එය භාවිතය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිලධාරින් දැනුවත් කිරීම.
15. ඉඩම් තොරතුරු පද්ධති අංශයේ ආංකිත දත්ත කළමනාකරණයට අවශ්‍ය ආධාරක මෙවලම් සැකසීම

## 14.0 හිමිකම් ලියාපදිංචි අංශය


**කාර්යභාරය**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු වැසියන්ගේ ඉඩම් සඳහා ඉඩමේ සාපේක්ෂ පිහිටීම, ප්‍රමාණය, සම්මත ඉඩම් අංකයක් හා අයිතිය පිළිබඳව රජයේ වගකීමක් සහිත "හිමිකම් සහතික "ප්‍රදානය කිරිමට 1998 අප්‍රේල් මස 29 සම්මත කළ 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම අනුව හිමිකම් සහතික පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය කඩඉම් සිතියම් සකස් කිරීමේ වගකීම සර්වේයර් ජනරාල් වෙත පැවරේ. එම කඩඉම් සිතියම් සකස් කිරීමේ දී රජයේ හා පෞද්ගලික සියලු ඉඩම් මැනීම සිදු කරන අතර ඉඩම් අයිතිය පිළිබඳ විමර්ශණය, තීරණ පිළිබඳ ගැසට් නිවේදන පළකිරීම හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් සිදු කරන අතර එම තීරණ හා කඩඉම් සිතියම අනුව "හිමිකම් සහතික " පිළියෙළ කිරීම හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඉටු කෙරේ.
2. සර්වේයර් ජනරාල් වෙනුවෙන් බිම්සවිය ව්‍යාපෘතිය යටතේ කඩඉම් සිතියම් සකස් කිරීම සඳහා මැනුම් කටයුතු සංවිධානය හිමිකම් ලියාපදිංචි අංශයේ කාර්යභාරයයි.
3. එබැවින් ආයතන තුනක දායකත්වයෙන් යුතුව දිගු ක්‍රියාවලියක් සහිත මෙම ව්‍යාපෘතියේ ඉඩම් මැනිමේ වගකීම, විවිධ දුෂ්කරතා මැද සීමිත සම්පත් ප්‍රමාණයක් සහිතව 2018 වර්ෂයේ ද 100% ඉක්මවූ ප්‍රගතියක් වාර්තා කිරීමට හැකිවිය. දැනට නේවාසික හා උපයෝගීතාවයක් සහිත ඉඩම් සඳහා හිමිකම් සහතික නිකුත් කෙරෙන අතර හිමිකම් සහතික ලද ඉඩම්වල පසුකාලීන මැනුම්වල කඩඉම් සිතියම් පරික්ෂා කර සම්මත කිරීම ද ආරක්ෂා කිරිමද සර්වේයර් ජනරාල් විසින් ඉටු කෙරේ.
4. එම කටයුතු ඉටු කිරීමේ දී මැනුම් කටයුතු සම්බන්ධව වාර්ෂික වැඩසටහන සකස් කිරීම, ප්‍රතිපාදන ඇස්තමේන්තු සකස් කිරිම, අමාත්‍යාංශය වෙතින් ලබා ගන්නා ප්‍රතිපාදන පළාත් මැනුම් කාර්යාල 9ක් මගින් දිස්ත්‍රික් කාර්යාල 22 ක් ආවරණය වන පරිදි කළමනාකරණය කිරිම ද අතර ප්‍රමාණවත් රජයේ මිනින්දෝරුවරුන් නොමැති අවස්ථාවල ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ සේවය ලබා ගැනීමට ලංසු කැඳවා තෝරා ගැනීමේ කටයුතු ද ඉටු කෙරේ.
5. මහජන හා විවිධ පළාත් පාලන ආයතන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා මුහුණ දෙනු ලබන අත්දැකීම් හා ගැටළු අනුව අනෙකුත් ආයතන සම්බන්ධීකරණයෙන් යුතුව උක්ත පනතේ සංශෝධන කිරීමේ කටයුතු සඳහා සහභාගිත්වය, ඉඩම් අමාත්‍යාංශය සම්බන්ධ ප්‍රගති සමාලෝචන කටයුතු ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ,හිමිකම් රෙජිස්ට්‍රාර්, විගණන යන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන වල විමසීම් සම්බන්ධයෙන් ද කටයුතු කර ඇත.

| *2018 වර්ෂය තුළ* | *ර.මි.* | *ලි.ප.බ.මි.* | *එකතුව* |
|---|---|---|---|
| හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කළ ප්‍රදේශ තුළ නිම කළ කැබලි ගණන | 43940 | 44626 | 88566 |
| එම ප්‍රදේශවලින් පිටස්තර ප්‍රදේශ තුළ නිම කර ඇති කැබලි ගණන | 57890 | 3527 | 61417 |
| එකතුව | 101870 | 61417 | 149983 |
| වියදම රු. | 67,669,976.43 | 152,701,126.61 | 220,371,103.04 |

| *සංක්ෂිප්ත යෙදවීම් හා ආවරණය* | | | | | |
|---|---|---|---|---|---|
| පළාත් | දිස්ත්‍රික්ක | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | රජයේ මිනින්දෝරු ගණන | බලයලත් මිනින්දෝරු ගණන |
| 8 | 18 | 30 | 50 | 100 | 100 |

# බිම් සවිය වැඩසටහන 2018
## ( ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව කැඩැස්තර මැනුම් කටයුතු)




01.නල්ලූර්
02.යාපනය
03.කන්දවාලේ
04.කරච්චි
05.මුහුදුබඩ පත්තු
06.තුනුක්කායි
07.මුසාලි
08.වව්නියා-උතුර
09.වව්නියා-දකුණ
10.නුවරගම් පළාත මධ්‍යම
11.රාජාංගනය
12.තලාව
13.තඹුත්තේගම
14.නැගෙනහිර නුවරගම්පලාත
15.මැදිරිගිරිය
16.හිඟුරක්ගොඩ
17.වැලිකන්ද
18.ත්‍රිකුණාමලය
19.කින්නියා
20.කන්තලේ
21.වෙරුගල්
22.එරාවූර් පත්තු
23.මන්මුනේ උතුර
24.කෝරලේ පත්තු දකුණ
25.සමන්තුරෙ
26.අම්පාර
27.ගලේවෙල
28.දඹුල්ල
29.හාරිස්පත්තුව
30.නුවර කඩවත් සතර
31.උඩුනුවර
32.යටිනුවර
33.උඩපලාත
34.දොළුව
35.කොත්මලේ
36.වෙන්නප්පුව
37.කුරුණෑගල
38.රිදීගම
39.පන්නල
40.මල්ලවපිටිය
41.කටාන
42.දිවුලපිටිය
43.මීරිගම
44.අත්තනගල්ල
45.මිනුවන්ගොඩ
46.වත්තල
47.ජා ඇල
48.ගම්පහ
49.මහර-කඩවත
50.දොම්පෙ
51.කැළණිය
52.හෝමාගම
53.මොරටුව
54.කැස්බෑව
55.රත්මලාන
56.දෙහිවල-ගල්කිස්ස
57.පානදුර
58.හොරණ
59.කළුතර
60.ගලිගමුව
61.කුරුවිට
62.රත්නපුරය
63.බලංගොඩ
64.වැලිගෙපොල
65.මහියංගනය
66.රිදීමාලියද්ද
67.සියඹලාණ්ඩුව
68.හික්කඩුව
69.ගාල්ල-කඩවත් සතර
70.වැලිගම
71.මාතර-කඩවත්සතර
72.හම්බන්තොට
73.ලුණුගම්වෙහෙර
74.තිස්සමහාරාමය
75.බෙලිඅත්ත
76.අඩ්ඩාලච්චේනෙ
77.අක්කරෙයිපත්තු
78.දමන
79.ලාහුගල
80.මහ ඔය
81.තිරුක්කෝවිල්
82.උහන
83.කෝරලෙයි පත්තු-උතුර
84.කෝරලෙයි පත්තු-බටහිර
85.මාන්මුනයි-නිරිතදිග
86.මාන්මුනයි-බටහිර
87.පෝරතිව් පත්තු
88.කුච්චවෙලි
89.මොරවැව
90.මූතූර්
91.සේරුවිල
92.ඉපලෝගම
93.පච්චිලායිපලෙයි
94.නනද්දන්
95.පාන්ඩියන්කුලම්
96.පුදුකුඩිරිප්පු
97.වව්නියාව
98.වෙන්ගලාචෙඩ්ඩිකුලම්
99.අබන්පොල
100.ගල්ගමුව
101.ගනේවත්ත
102.ගිරිබාව
103.කොබෙයිගනේ
104.මහව
105.පොල්පිතිගම
106.රස්නායකපුර
107.වාරියපොල
108.පුත්තලම
109.අයගම
110.නිවිතිගල
111.අගලවත්ත
112.බුලත්සිංහල
113.ඉංගිරිය
114.පාලින්දනුවර
115.පූනකරි
116.මඩු
117.මන්නාරම
118.මාන්තෙයි-බටහිර

පරිමාණය : 1:2,000,000

ජාතික ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන
ඉඩම් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

## 15.0 ප්‍රගති අංශය

ප්‍රධාන වශයෙන් පහත සඳහන් කාර්යයන් මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

### 15.1 කාර්යසාධන වාර්තාව

2017 වර්ෂයේ සර්වේයර් ජනරාල්ගේ කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත පරිදි ඉදිරිපත් කර අනෙකුත් පිටපත් ද බෙදා හැර ඇත.

### 15.2 අයවැය කාරක සභා අවස්ථාව සඳහා වාර්තාව

2019 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තාව නියමිත පරිදි සකස් කර ඉදිරිපත් කර ඇත.

### 15.3 දෛනික තැපැල බෙදා හැරීම

දෛනික තැපැල බෙදා හැරීම වර්ෂය පුරා නිතිපතා මැනවින් සිදු කරන ලද අතර, එමඟින් පරිපාලන කටයුතු මැනවින් ක්‍රියාත්මක වීම පහසු කරනු ලැබීය. දෙපාර්තමේන්තුවට ලැබෙන ලිපි පසුවිපරම් කිරීමේ දත්ත පද්ධතියට (Mail Tracking System) සියලුම ලිපි ඇතුළත් කර ඇත. ඒ අනුව මේ වසරේදී ලිපි 42,243 ක් ඇතුළත් කර ඇත.

### 15.4 චක්‍රලේඛ බෙදා හැරීම

අදාළ වර්ෂය තුළදී පහත සඳහන් චක්‍රලේඛ මුද්‍රණය කර දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය අතර බෙදා හරින ලද අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථානගත ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ද මෙම අංශය මගින් චක්‍රලේඛ තැපැල් කර යවනු ලැබේ. වසර මැදදී මෙම ක්‍රමවේදය වෙනස් කරන ලද අතර අන්තර්ජාල පහසුකම් මගින් සියලුම චක්‍රලේඛ වෙබ් අඩවියේ පලකිරීමට පියවර ගන්නා ලදී.

| චක්‍රලේඛ වර්ගය | චක්‍රලේඛ සංඛ්‍යාව |
|---|---|
| දෙපාර්තමේන්තු කළමනාකරණ චක්‍රලේඛ | **10** |
| දෙපාර්තමේන්තු කළමනාකරණ චක්‍රලේඛ ලිපි | **06** |
| ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ | **09** |
| ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ ලිපි | **16** |
| කාර්ය මණ්ඩල චක්‍රලේඛ | **01** |
| කාර්ය මණ්ඩල චක්‍රලේඛ ලිපි | **36** |

### 15.5 භාෂා පරිවර්තනය

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශයන්හි භාෂා පරිවර්තන අවශ්‍යතාවයන් ඉටු කරනු ලබන අතර සිංහල - ඉංග්‍රීසි පරිවර්තන කාර්යය භාෂා පරිවර්තක නිලධාරිනිය මගින් සිදු කරනු ලැබේ. දෙමළ භාෂා පරිවර්තක නිලධාරි තනතුරෙහි නිලධාරියෙකු නොවීම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටයුතු මුදල් ගෙවා බාහිර පරිවර්තකයෙකු මගින් ඉටු කරවා ගැනීමට සිදුව ඇත. සිංහල-දෙමළ භාෂා පරිවර්තනය සඳහා 2018 වසරේදී රු.52,605.00 ක මුදලක් ගෙවා ඇත.

### 15.6 අධ්‍යයන සැසි

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ විවිධ අංශ **අධ්‍යයනය** කිරීම සඳහා පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙනු ලබන්නේ ප්‍රගති අංශයෙන් වන අතර, සමාලෝචිත වර්ෂයේ දී විශ්ව විද්‍යාල සිසුන් හා ආරක්ෂක හමුදා නිලධාරී කණ්ඩායම් **11**ක් සඳහා අධ්‍යයන සැසි පවත්වා ඇත.ඒ සඳහා සිසුන් හා නිලධාරීන් **313** දෙනෙකු සහභාගී වී ඇත.

## 15.7 අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් අනුමැතිය

දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් සඳහා ලැබෙන ඉල්ලීම් සර්වේයර් ජනරාල් වෙතින් හා අමාත්‍යාංශ ලේකම් වෙතින් අනුමත කරගැනීමේ කටයුතු සහ ඒ ඒ නිලධාරීන් වෙත අදාළ පරිදි අනුමැතිය ලබා දීම ප්‍රගති අංශයේ තවත් කාර්යයකි. මේ අනුව 2017 වසරේදී අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අතිකාල සඳහා වසර මුලදී මූලික අනුමැතියක් ලබාගත් අතර එය නොඉක්මවන පරිදි ගෙවීම් කටයුතු කරන ලදී. මෙවැනි අනුමත කිරීම් සහ විශේෂ රාජකාරි සඳහා පසුව කරන ලද අනුමත කිරීම් ද ඇතුළත්ව අතිකාල සහ නිවාඩු වැටුප් අනුමත කිරීම් 1721 ක් වසර තුළදී සිදුකර ඇත.

## 16.0 ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු

සමාලෝචනයට භාජනය වූ වසර පුරාම මෙම සේවාවන් දෙපාර්තමේන්තුවේ උපකරණ හා ගොඩනැගිලි අංශයේ අධීක්ෂණය යටතේ ඉටු කර ඇත. ක්‍රවුන් රෝයල් සිකියුරිටි (පුද්ගලික) සමාගම ආරක්ෂක සේවය සැපයූ අතර, නිපුනි ක්ලීනින් සර්විස් සමාගම දෙපාර්තමේන්තුව පිරිසිදුව,පවිත්‍රව හා දර්ශනීය ලෙස පවත්වා ගැනීම සිදු කරන ලදී.

## 17.0 සේවක සුභසාධනය

දෙපාර්තමේන්තුවේ සුභසාධනය සඳහා පත්කළ සුභසාධක නිලධාරි විසින් සුභසාධනය කටයුතු ඉටුකරනු ලබන අතර, සමාලෝචිත වසර තුළ දී සාමාන්‍ය සුභසාධන කටයුතුවලට අමතරව පහත සඳහන් විශේෂ කාර්යයන් ද ඉටුකර ඇත.

i. ජනවාරි මස 01 වන දින රාජකාරි ආරම්භ කිරීමට පෙර සෙත් පිරිත් දේශනයක් පවත්වා සියලුම කාර්ය මණ්ඩලයට තේ පැන් සංග්‍රහයක් පැවැත්වීම.
ii. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ඔවුන්ගේ දරුවන් සහභාගි කරවා ගැනීම හා ජයග්‍රාහකයින්ට තෑගි පිරිනැමීම.
iii. සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් හා වර්ෂාවසානයේදී කාර්ය මණ්ඩලයට විදුලි උපකරණ, පාවහන්, රෙදිපිළි හා පොත්පත් යනාදිය සහන මිලට ණය පදනම මත ලබාදීම.
iv. කාර්ය මණ්ඩලයේ කුඩා දරුවන් රැක බලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කර පවත්වා ගෙන යාම.
v. සහන මිලට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ වෙළඳ සැලක් දිවා විවේකයේ දී පවත්වා ගෙන යාම හා සුභසාධක ආපනශාලාවේ කටයුතු මැනවින් පවත්වා ගෙනයාම.
vi. වෙසක් උත්සවය, නවරාත්‍රි උත්සවය පැවැත්වීමෙන් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මානසික සංවේදනය නැංවීම.
vii. සේවක සුභසිද්ධිය සඳහා විවිධ වෛද්‍ය සායන හා උපදෙස් වැඩ සටහන් පැවැත්වීම.

මෙයට අමතරව කාර්ය මණ්ඩලයේම සංවිධානයෙන් යුත් සමූපකාර ණය දීමේ සමිතියක් ද, ක්‍රීඩා සමාජයක්, පුස්තකාලයක් හා කියවීමේ ශාලාවක්ද ක්‍රියාත්මකව පවතී. තව ද බෞද්ධ සංගමය හා සංගීත කවය සහ සේවා වනිතා සංගමය මගින් පොදු කටයුතු ක්‍රියාකාරකම් ද සිදු කරනු ලැබේ.


## 18.0 සමාප්තිය

සමාලෝචිත වසර සඳහා සැලසුම් කළ පරිදි ඉලක්කගත කාර්යයන් සපුරාලීමට අමතරව රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා මෙන් ම සමාජ සුභසාධන කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ හදිසි මැනුම් හා සිතියම් අවශ්‍යතාවයන් ඉතා සාර්ථකව ඉටු කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ඒ සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම වැඩි දියුණු කර ගැනීමට ද, නව තාක්ෂණික මෙවලම් හඳුන්වාදීමට ද හැකිවූ අතර මැනුම් කටයුතුවල ප්‍රගතිය 132% දක්වා ළඟා කර ගැනීමට ද හැකි විය. එවන් කාර්ය සාධනයක් මෙම වර්ෂය තුළදී ඉටු කර ගැනීමට සහාය වූ දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවලට හා සියලුම මට්ටම්වලට අයත් සේවක මණ්ඩල සාමාජිකයින්ගේ සේවය ඉහළින්ම අගය කරන බව මෙහිලා සනිටුහන් කළ යුතුය. එමෙන්ම මෙම කාර්යයන් ඉටු කිරීමේ දී ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් මෙන් ම සියලුම වෘත්තීය සමිතිවලින් ද ලද සහයෝගය අගය කරමි.

**එස්.එම්.පී.පී. සංගක්කාර**
**සර්වේයර් ජනරාල්**

# පරිපාලන ව්‍යුහය මිනින්දෝරු දෙපාර්තමේන්තුව - 2018

*ඇමුණුම - 01*




| | | |
|---|---|---|
| අති.ස.ජ. | - | අතිරේක සර්වේයර් ජනරාල් |
| ජ්‍යෙ.නි.ස.ජ. | - | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් |
| පළාත් ස.ජ. | - | පළාත් සර්වේයර් ජනරාල් |
| නි.ස.ජ. | - | නියෝජ්‍ය සර්වේයර් ජනරාල් |
| ජ්‍යෙ.මි.අ. | - | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි |
| මි.අ. | - | මිනින්දෝරු අධිකාරි |
| නි. අධ්‍යක්ෂ | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ස. අධ්‍යක්ෂ | - | සහකාර අධ්‍යක්ෂ |
| කා.ප.නි. | - | කාර්මික හා පරිපාලන නිලධාරි |
| ප.නි. | - | පරිපාලන නිලධාරි |
| සම්.කළ. | - | සම්පත් කළමනාකරණ |
| ලේ.ක. හා වෘ.ප්‍ර. | - | ලේඛණ කළමනාකරණ හා වෘත්තීය ප්‍රමිතීන් |
| ගොඩ. හා උප. | - | ගොඩනැගිලි හා උපකරණ |
| ප්‍රසම්. හා සැප. | - | ප්‍රසම්පාදන හා සැපයීම් |
| පර්. හා සං. | - | පර්යේෂණ හා සංවර්ධන |
| ඉ.තො.ප. | - | ඉඩම් තොරතුරු පද්ධති |
| භූ.තො.ප. | - | භූ තොරතුරු පද්ධති |
| ජා.අ.ද.ය.ව්‍යු. | - | ජාතික අවකාශීය දත්ත යටිතල ව්‍යුහය |
| ගුවන් | - | ගුවන් මැනුම් |
| හි.ලි. | - | හිමිකම් ලියාපදිංචි කිරීම |
| මැ.සි.ආ. | - | මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය |
| ප්‍රා.මි.කා. | - | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල |
| තො.තා. | - | තොරතුරු තාක්ෂණ |
| කළ.සං.හා පු.ඒ. | - | කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය |
| වි.මැ. හා තත්.පා. | - | විශේෂ මැනුම් හා තත්ත්ව පාලන |
| සි.තා.නි. | - | සිතියම් තාක්ෂණ නිලධාරි |
| දු.ග්‍ර.තා.නි. | - | දුරස්ථ ග්‍රහණ තාක්ෂණ නිලධාරි |
| ඡා.තා.නි. | - | ඡායාරේඛණමිතික තාක්ෂණ නිලධාරි |
| පි.ව.තා.නි. | - | පිඹුරු වර්ණ තාක්ෂණ නිලධාරි |
| ගු.ඡා.තා.නි. | - | ගුවන් ඡායාරූප තාක්ෂණ නිලධාරි |
| ලි.මු.තා.නි. | - | ලිතෝ මුද්‍රණ තාක්ෂණ නිලධාරි |
| තො.තා.නි. | - | තොරතුරු තාක්ෂණ නිලධාරි |
| තො.තා.ස. | - | තොරතුරු තාක්ෂණ සහකාර |
| මැ.උ.කා.ශි. | - | මැනුම් උපකරණ කාර්මික ශිල්පි |
| සං. නි. | - | සංවර්ධන නිලධාරි |
| රා.ක.ස. | - | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | | |
|---|---|---|
| සකස් කළේ | - | පී.ඉන්ද්‍රානි සමරසේකර මිය<br>(සිතියම් තාක්ෂණ නිලධාරි) |
| පරීක්ෂා කළේ | - | වයි.ඒ.පබෝදනී යහම්පත් මිය<br>(ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරි) |
| නිවැරදි බව තහවුරු කළේ | - | ජේ.පී.අමරසිංහ මයා<br>(ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි - වැඩ බලන) |
| නිර්දේශ කළේ | - | පී.ඒ.එන්. ද සිල්වා මයා<br>(අතිරේක සර්වේයර් ජනරාල්-ක්ෂේත්‍ර) |